INTERNATIONAL
CENTRE FOR
ETHNIC STUDIES

# ලංකාවේ බෞද්ධ - ඉස්ලාමීය
# අන්තර් ආගමික සහයෝගිතා සහ ආරවුල්

## තෝරාගත් බහු-ආගමික සහ බහු-සංස්කෘතික මධ්‍යස්ථාන
## කිහිපයක මෑතකාලීන සිදුවීම් ගැන සිදුකළ ක්ෂේත්‍ර අධ්‍යයනයකි



කාලිංග ටියුඩර් සිල්වා
අෆ්රා නිවාස්
ඩබ්. එම්. කේ. බී. වික්‍රමසිංහ

# ලංකාවේ බෞද්ධ-ඉස්ලාමීය
# අන්තර් ආගමික සහයෝගිතා සහ ආරවුල්

තෝරාගත් බහු-ආගමික සහ බහු-සංස්කෘතික මධ්‍යස්ථාන
කිහිපයක මෑතකාලීන සිදුවීම් ගැන සිදුකළ ක්ෂේත්‍ර අධ්‍යයනයකි

**කාලිංග ටියුඩර් සිල්වා**
**අෆ්රා නිවාස්**
**ඩබ්. එම්. කේ. බී. වික්‍රමසිංහ**

**ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික කේන්ද්‍රය**
2017

ලංකාවේ බෞද්ධ-ඉස්ලාමීය අන්තර් ආගමික සහයෝගිතා සහ ආරවුල්

© 2017, ජනවාර්ගික අධ්‍යයනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රය

2, කින්සි ටෙරස්,
කොළඹ 08,
ශ්‍රී ලංකාව.

විද්‍යුත් ලිපිනය: admin@ices.lk
වෙබ් : www.ices.lk

ජනවාර්ගික අධ්‍යයන සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රයේ (ICES) අවසරය සහිතව මූලාශ්‍රය සඳහන් කිරීමේ කොන්දේසිය යටතේ පමණක් මේ ප්‍රකාශනය බෙදාහැරීම හෝ ප්‍රතිනිෂ්පාදනය කළ හැකිය.

ISBN – 978-955-580-209-3

මුද්‍රණය
හොරයිසන් ප්‍රින්ටින් (පෞද්.) සමාගම
1616/6, හතරමං හන්දිය,
මාළඹේ පාර, කොට්ටාව,
පන්නිපිටිය.

මෙම පර්යේෂණ පත්‍රිකාව USAID හී සහයෝගයෙන් ICES ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද Building Resilient Communities ව්‍යාපෘතිය යටතේ පළ කරණ ලදී.

කවරයේ චිත්‍රය : කුරුණෑගල ගලේ බණ්ඩාර ප්‍රධාන දේවාලයේ ඇති ගලේ බණ්ඩාර දේව ප්‍රතිරූපය

# ලංකාවේ බෞද්ධ-ඉස්ලාමීය
# අන්තර් ආගමික සහයෝගිතා සහ ආරවුල්

## තෝරාගත් බහු-ආගමික සහ බහු-සංස්කෘතික මධ්‍යස්ථාන කිහිපයක මෑතකාලීන සිදුවීම් ගැන සිදුකළ ක්ෂේත්‍ර අධ්‍යයනයකි


**කාලිංග ටියුඩර් සිල්වා**
**අෆ්රා නිවාස්**
**ඩබ්. එම්. කේ. බී. වික්‍රමසිංහ**


---

**කාලිංග ටියුඩර් සිල්වා** පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සම්මාන මහාචාර්යවරයෙක් මෙන්ම ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික කේන්ද්‍රය - මහනුවර ශාඛාවේ පර්යේෂණ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂකවරයාද වේ.

**අෆ්රා නිවාස්** පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අරාබි සහ ඉස්ලාම් අධ්‍යයන දෙපාර්තමේන්තුවට අනුබද්ධ පර්යේෂණ සහායිකාවකි.

**ඩබ්. එම්. කේ. බී. වික්‍රමසිංහ** මහනුවර නාගරික සංවර්ධනය පිළිබඳ ලෝක බැංකු ව්‍යාපෘතියේ වැඩසටහන් භාර නිලධාරිවරයකු වේ.

# ස්තුතිය

ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික කේන්ද්‍රයේ අධ්‍යක්ෂක මරියෝ ගෝමස්ට, පර්යේෂක කසුන් පතිරාජට සහ පර්යේක්ෂිකා නදීන් වන්නියසිංහම් යන අයට කතුවරුන්ගේ ස්තුතිය හිමි වේ.

ක්ෂේත්‍ර වැඩ කටයුතු වලදී විවිධ අය අපට සහාය වූහ. විශේෂයෙන්ම මාවනැල්ලේ විශේෂඥ වෛද්‍ය ආරියසේන ගමගේ මහතා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අරාබි සහ ඉස්ලාම් අධ්‍යයන අංශයේ අංශාධිපති ආචාර්ය එම්. ඉසඩ්. එම්. නෆීල්, කුරුණෑගල ඇත්කඳ විහාරාධිපති උඩුගම ශ්‍රී ධම්ම දස්සි නාහිමි, කුරුණෑගල මල්ලවපිටියේ හකීමියා අරාබි විද්‍යාලයේ විදුහල්පති, එම්. කේ. එම්. මහිර්, සහ ගම්පොල යුසුෆ් ලෙබ්බේ යන අය ක්ෂේත්‍ර කටයුතු වලදී දැක්වූ අනුග්‍රහය මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය.

එමෙන්ම ගලේබණ්ඩාර ඇදහිල්ල හා සම්බන්ධ සිංහල ලිපි ලේඛන හඳුනාගැනීමට සහ ඒවා ලබාගැනීමට කිහිප දෙනෙක්ම උදව් කරන ලදී. මේ අතරින් බුද්ධික කෝනාර, එච්. ජී. දයා සිසිර, ජනවාර්ගික අධ්‍යයන පිළිබඳ අන්තර්ජාතික කේන්ද්‍රයේ එවකට පුස්තකාලාධිපතිනිය ලෙස සේවය කළ නිරංජලා සරෝජිනී, පේරාදෙණිය සරසවියේ පුස්තකාල සහයිකා මැණිකේ මහත්මිය යන අයගෙන් ලද සහයෝගය ස්තුති පූර්වකව සඳහන් කළ යුතුය.

මෙම පර්යේෂණ වාර්තාව සමාලෝචනය කොට අපගේ විග්‍රහය දියුණු කිරීම සඳහා වැදගත් යෝජනා කිහිපයක් ඉදිරිපත් කළ මහාචාර්ය ගනනාථ ඔබේසේකරට අපගේ ප්‍රණාමය හා ස්තුතිය හිමි වේ.

මේ වාර්තාව සිංහල භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය සඳහා සකස්කළ ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික කේන්ද්‍රයේ වැඩසටහන් සම්බන්ධිකරන නිලධාරී වසන්ත ප්‍රේමරත්නට සහ වර්තමාන පුස්තකාලාධිපතිනී ඉරංගා සිල්වාට අපගේ විශේෂ ස්තුතිය හිමිවේ.

අවසාන වශයෙන් මෙම කෘතිය මුද්‍රණය සඳහා පිළියෙල කිරීමේදී කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ කතිකාචාර්ය නාලක ජයසේන, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අංශයේ කතිකාචාර්ය සමින්ද ඥානරත්න සහ ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික කේන්ද්‍රයේ සලීකා පීරිස් සහ ලක්මාලි අල්විස් යන අය විශේෂයෙන් දායක වූහ.

## කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| AGA | - | සහකාර දිසාපති |
| BBS | - | බොදු බල සේනා |
| CCF | - | මධ්‍යම සංස්කෘතික අරමුදල |
| DS | - | ප්‍රාදේශීය ලේකම් |
| GN | - | ග්‍රාම නිලධාරී |
| ICES | - | ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික කේන්ද්‍රය |
| LTTE | - | ද්‍රවිඩ ඊළාම් කොටි සංවිධානය |
| MFA | - | මාවනැල්ල මිත්‍රත්ව සංගමය |
| SLTJ | - | ශ්‍රී ලංකා ත්ව්හීඩ් ජමාත් |

## පටුන

ස්තුතිය ........ i

කෙටි යෙදුම් ........ ii

සාරාංශය ........ iv

හැඳින්වීම ........ 5

ක්‍රමවේදය සහ ප්‍රවේශය ........ 5

ආගමික සංකලනයද? ආගමික බහුත්වයද? ........ 6

දෙවනගල බහු සංස්කෘතික උරුමය සහ මෑතයුගයේදී සංස්කෘතික පාරිශුද්ධකරණ ප්‍රවණතා ........ 9

කුරුණෑගල ගලේබණ්ඩාර වන්දනාව ........ 20

ගලේබණ්ඩාර පුරාවෘත්තය ........ 22

සිංහල පුරාවෘත්තය ගැන අවලෝකනය ........ 27

කහටපිටිය මුස්ලිම් පල්ලියේ බහු ආගමිකත්වය ........ 30

නිගමනය ........ 33

ඇමිණුම 1: දෙවනගල අවට මුස්ලිම් ජනයාගේ ප්‍රතිචාර ........ 37

සිතියම් ........ 51

ඡායාරූප ........ 53

## සාරාංශය

ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ දේශපාලන සහ සමාජ ප්‍රවණතා විග්‍රහ කරන ඇතැම් පර්යේෂකයන් පවසන්නේ ශ්‍රී ලංකාවේ ජන කණ්ඩායම් අතර ගැටුම් වල තීරණාත්මක සාධකය, ජන වාර්ගික පදනමේ සිට ආගමික පදනම කරා වෙනස් වෙමින් පවත්නා බවයි (Holt 2016, Wickramasinghe 2015, Herath and Rambukwella 2015, Klem 2011). එක් පසෙකින් බොදු බල සේනාවේ ඉස්මතු වීම සහ අනෙක් අතින් ගැටුම් උත්සන්න වන අයුරින් බිහිවූ ඉස්ලාම් මූලධර්මවාදී ප්‍රවනතා මෙම තර්කය සනාථ කිරීම පිණිස ඉදිරිපත් කරයි. උක්ත සංවාදයට දායක වීමේ අදහසින් මෙම අධ්‍යයනය මධ්‍යම ශ්‍රී ලංකාවේ බහු-ආගමික උරුමයන් සහිත ආගමික ස්ථාන තුනක් (3) ඇසුරෙන් සිදු කරන ලදී. එසේ වුවත් මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ සමාජ ගැටුම් ආගමික පදනමකට අනුව අලුතෙන් නිර්මාණය වී ඇති බවක් නොහැඟවේ. මෙම අධ්‍යයනයට ලක්වූ බෞද්ධ-ඉස්ලාම් බහු ආගමික පූජ්‍යස්ථාන ආගමික සහජීවනය සඳහා මෙන්ම ආගම් අතර පරස්පරතාවයන් සහ ගැටුම් ඉස්මතු කිරීම සඳහාද යොදා ගත හැකිය. කෙසේ වුවද ආපසු හැරවිය නොහැකි ලෙස ගැටුම් ආගමීකරණයට ලක්වීමක් බහු-ආගමික පූජ්‍යස්ථාන පිළිබඳ වර්තමාන අධ්‍යයනයෙන් හෙළිනොවේ.

අවුරුදු 800 කට වඩා වැඩි කාලයක් බුදුසමය හා ඉස්ලාම් ආගම ශ්‍රී ලංකා සන්දර්භය තුළ සහවාසය කොට තිබේ. මෙම කාල පරිච්ඡේදය තුළ බෞද්ධ හා ඉස්ලාම් භක්තිකයින් අතර විවිධ සංස්කෘතික හුවමාරු මෙන්ම අන්‍යෝන්‍ය සහයෝගයද වර්ධනය විය. උදාහරණයක් ලෙස පෘතුගීසී යටත් විජිත පාලකයන් විසින් ඉස්ලාම් භක්තිකයන්ට විවිධ හිරිහැර සිදු කරන විට, ඔවුන් ආරක්ෂාව සඳහා පැමිණියේ උඩරට රාජධානියේ සිටි බෞද්ධ පාලකයන් වෙතය. මෙම අන්තර් ආගමික සහජීවනයේ කිසියම් ඡේදනයක් 1915 මුස්ලිම් කෝලහලයෙන් සනිටුහන් කළ නමුත්, එම විරසකය පසුකාලීනය සමනය විය. මෙම ආගම් දෙකෙහිම කිසියම් පුනර්ජීවනයක් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සිදුවෙමින් පවතී. මෙම පසුතලය තුළ මෑත කාලයෙදී ඉස්ලාම් ආගම තුළ මෙන්ම බුදුසමය තුළද යම් යම් මූලධර්මවාදී ප්‍රවනතා ඉස්මතු වූ අතර එම ප්‍රවනතා වල බලපෑමට අධ්‍යයනයට ලක් වූ බහු-ආගමික පූජ්‍යස්ථානයද යම් තරමකට ලක්වී ඇත. කෙසේ නමුදු මෙම බහු-ආගමික මධ්‍යස්ථාන වලට ආවේනික වූ ආගමික සහජීවනය හා සංස්කෘතික සංකලනය මුලිනුපුටා දැමීමට එකිනෙකාට පරස්පර වූ බෞද්ධ සහ ඉස්ලාම් මූලධර්මවාදී බාහිර බලවේගයන් මෙතෙක් අසමත් වී ඇත.

මෙම ආගමික පූජ්‍යස්ථාන බාහිර මැදිහත්වීම් මගින් ආගමික ශුද්ධකරණයට නතුවීම නිසා ඒ ඒ ආගම් තුළ සහ විවිධ ආගම් අතර ආරවුල් ඇති වී ඇති නමුත් එය ශ්‍රී ලංකාවේ ගැටුම් වල හැරවුම් ලක්ෂයක් ලෙස ගිනිය නොහැකිය. මෙම අධ්‍යයනයට ලක්වූ කලාප තුනෙහි

අත්දැකීම් ඇසුරින් අවුරුදු 800 කට අධික මෙකී ආගම් දෙකෙහි අන්තර් ක්‍රියාකාරීත්වය තුළ අන්තර් ආගමික සහයෝගීත්වය මෙන් ම තරගකාරීත්වය ද හඳුනාගත හැකිය. සමස්ත අධ්‍යයනයෙන් සොයාගත්තේ මෙම ආගම් දෙක අතර අන්‍යෝන්‍ය විශ්වාසය සහ සහජීවනය කෙතෙක් දුරට සමාජය තුළ මුල්බැසගෙන ඇත්දැයි කිවහොත් එය නව ආගමික ව්‍යාපාර සහ ප්‍රතිසංස්කරණ වලට පහසුවෙන් ඉවත්කළ නොහැකි බවයි. බාහිර ක්‍රියාකරුවන්ගේ මැදිහත්වීම ආගමික ශුද්ධකරණය සඳහා බලකිරීමක් බවට  මෙම අධ්‍යයනයෙන් හෙළිවන නමුත් ඔවුන්ගේ අන්තගාමී බලපෑම් මගින් පවතින ව්‍යුහය සපුරාම වෙනස් වී නැත.  පූජා භූමි සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති සහ පුරාවිද්‍යා කලාප මෙම සමාජ යථාර්ථයට පටහැනි අයුරින් උත්පාදනය වී ඇත. සිංහල-බෞද්ධ ජාතිකත්ව මතවාදී ආධිපත්‍යය විසින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා කළ බලපෑම දෙවනගල වැනි අලුතින් ප්‍රකාශිත පුරාවිද්‍යා කලාපවල අවුල් ඇති කිරීමට හේතුවී තිබේ. රාජ්‍ය ප්‍රතිපත්ති මගින් බහු-ආගමික හා බහු-සංස්කෘතික උරුමයට ගරු කරමින් මතු පරපුර වෙනුවෙන් එම උරුමය ප්‍රවර්ධනය කළ යුතුය.  පුරාවිද්‍යා කලාප හා පූජා භූමි පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති මගින් එම ස්ථාන ශ්‍රී ලාංකේය සැමගේම පොදු උරුමයක් හෝ එසේ නැත්නම් සියලු මානවයන්ගේ උරුමයක්ය යන එළඹුමෙන් යුක්ත අක්ෂයකින් සංශෝධනය කළ යුත්තේ ඒවා එක් මානව ආගමික කණ්ඩායමකට සීමාවූ කලාප යන්න අභිබවමිනි.

මෙම පසුබිම තුළ පූජාභූමි සහ සංස්කෘතික කලාප එක් ආගමකට සීමා වූ නොමුහුන් පූජාභූමි ලෙස සැලකීමේ ශ්‍රී ලංකාවේ වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිය අභියෝගයකට ලක්කළ යුතුය. එවැනි ප්‍රතිපත්ති මත පිහිටුවා ඇති දෙවනගල පුරාවිද්‍යා ආරක්ෂක ප්‍රදේශයෙන් එහි පාරම්පරිකව ජීවත් වූ මුස්ලිම් බැතිමතුන් ඉවත් කිරීමේ ජාතිවාදී සහ මූලධර්මවාදී උත්සාහයක් පවතින අතර එය ජාතික සමගියට හා සාමූහික සහජීවනයට අභියෝගයක් වී ඇත. ශ්‍රී ලංකාවේ බහු-ආගමික හා බහු සංස්කෘතික උරුමය රැක ගැනීම හා පෝෂණය කිරීම රාජ්‍ය ප්‍රතිපත්තිය විය යුතුය.  පුරා විද්‍යා හා පූජා භූමි පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය විය යුත්තේ ඒවා පොදු සම්පතක් ලෙස හඳුනා ගැනීම සහ පවත්වාගෙන යාම මිස ඒවා සීමිත මානව කණ්ඩායමකට සීමා වූ වාර්ගික අයිතිවාසිකමක් ලෙස හඳුනා ගැනීම සහ පවත්වාගෙන යෑම නොවේ.

# හැඳින්වීම

යටත් විජිත යුගයේ අවසාන භාගයේදී සිට ලංකාවේ අනන්‍යතා දේශපාලනය පරිභ්‍රමණය වූයේ සිංහල බෞද්ධ සහ හින්දු-දෙමළ අනන්‍යතා වටායි. සිංහල බෞද්ධ ජාතිකවාදී චින්තනයට අනුව ශ්‍රී ලංකාව දීර්ඝ කාලීන සහ අඛණ්ඩ සිංහල බෞද්ධ ඉතිහාසයක් සහිත ස්වකීය නිජබිම ලෙස සළකනු ලැබේ. මෙම මතයට අනුව මෙම දිගු සිංහල බෞද්ධ ඉතිහාසයෙහි කිසියම් ඛණ්ඩනයක් සිදුවූවා නම් එසේ වූයේ බාහිර බලවේග විසින් ලංකාව යටත් කරගැනීමට උත්සහ කළ අවස්ථාවලදී පමණි (Obeyesekere 2006, Tambiah 1986). නිදහසින් පසු බලය යටත් විජිත පාලකයන්ගෙන් සිංහල බහුතරයට හුවමාරු වීමෙන් අනතුරුව, සුළුතරය වූ දෙමළ අයට තම අනාගතය පිළිබඳ අස්ථාවර බවක් සහ අනාරක්ෂිත බවක් ඇතිවිය. මෙම හැඟීම ඇති කිරීමට විශේෂයෙන් දායකවූයේ සිංහල පාලක පක්ෂය තම රාජ්‍ය බලය තහවුරු කර ගැනීම සඳහා සුළු ජනවාර්ගිකයන්ගේ ග්‍රහණයෙන් අධ්‍යාපනය, වෘත්තීන්, වෙළඳ ව්‍යාපාර සහ දේශපාලන ක්‍රියාවලිය මුදවා ගැනීම සඳහා ක්‍රම ක්‍රමයෙන් උත්සහා කිරීමය (Kailasapathy 1984). වාර්ගික අනන්‍යතා නිර්මාණය වීමේදී ආගමික හැඟීම් බොහෝ විට ද්විතීය කාර්ය කොටසක් ඉටුකළ නමුත් ඇතැම් අවස්ථාවලදී (උදා: ලෙස බෞද්ධයන් හා කතෝලිකයන් අතර 1883 දී ඇතිවූ කොටහේන කෝලාහල සහ බෞද්ධයන් හා ඉස්ලාම් භක්තිකයන් අතර 1915 දී සිදුවූ මරක්කල කෝලාහලය) ආගමික බේදීම් ප්‍රාථමික සමාජ ඛණ්ඩනය බවට පත්විය. මෙවැනි ආගමික කෝලාහල වලදී මිනිසුන් වඩාත් කෝපාවිෂ්ඨ වූයේ තම පූජනීය වස්තූන්ට, පූජනීය ස්ථානවලට හෝ තම පූජකයන්ට නිගරු කළේ යැයි හෝ හානි කළ බවට තොරතුරු ලද අවස්ථාවලදීය (Tambiah 1996). කෙසේ නමුත් මෙවැනි ආගමික අමනාපකම් සහ ප්‍රකෝපකාරී තත්ත්වය කෙටි කලකින් සමනය වූ අතර එවැනි ගැටුම් උත්සන්න කිරීමට මෙන්ම සමනය කිරීමට ආගමික විශ්වාස සහ සාරධර්මයන්ට ඇති ආවේනික හැකියාව සහ ගැටුම්වල පාර්ශවකරුවන් තම ආගමික නායකයන්ට ඇහුම්කන් දීමේ සහ අවනත වීමේ ප්‍රවණතාවයද මෙම තත්ත්වයන්ට හේතු වූ බව පෙනේ. ඒ ඒ ආගම් තුළ යුක්තිය සහ සාධාරණත්වය ගැන ඇති හැඟීම්, අවිහිංසාව ගැන ඇති විශ්වාසය සහ මැදිහත්කරුවන් ලෙස ආගමික නායකයන් කෙරෙහි ඇති ගරුත්වයද මෙවැනි ගැටුම් ක්ෂණිකව සමනය වීමට හේතු වූ කරුණු ලෙස සැළකිය හැකිය. (බලන්න Wickramasinghe 2015)

ශ්‍රී ලංකාවේ ජනවාර්ගිකත්වය සහ ආගම් අතර ඇති අන්තර්ඡේදනය (Intersectionality) මෙහිදී අප පිළිගන්නා නමුත් අපගේ ඉලක්කය වනුයේ ජනවාර්ගිකත්වය සහ ආගම අතර ඇති සංකීර්ණ අන්තර් ක්‍රියාවලිය ගැඹුරින් විමසා බැලීමය. යම් අවස්ථා වලදී ආගමික උද්දීපනයන් සමාජ ගැටුම්වල ප්‍රචණ්ඩකාරී ධාවක බලවේගය වන අතර තවත් අවස්ථා වලදී ආගමික මැදිහත්වීම් ගැටුම් සමනය කිරීමට, කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය විශ්වාසය

නැවත ගොඩනැගීමට සහ පලුදු වූ සබඳතා ප්‍රතිස්ථාපනය කිරීමට දායක වේ. ආගමේ මෙම ප්‍රතිජනක සහ නිර්මාණශීලී භූමිකාව ගැන සඳහන් කළ එක් නූතන පර්යේෂණයකදී සඳහන් වූයේ "ඇතැම් අවස්ථාවලදී ආගමික ක්‍රියාකාරීන් අසීමිත පරිශ්‍රමයකින් සමාජ සංස්කෘතික මායිම් අතික්‍රමණය කළ නොහැකි කඩඉම් බවට පත්කරන අතර තවත් අවස්ථාවලදී ඔවුන් එම කඩඉම් හරහා බාධාවකින් තොරව ගමන් කරන මඟීන් බවට පත්වේ (Spencer සහ තවත් අය 2015: 6).

ඇතැම් අවස්ථාවලදී ආගමික කණ්ඩායම් තුළ සමාජ ඒකාබද්ධතාවය ඇති කිරීමේ පදනම ලෙසත්, තවත් අවස්ථාවලදී බිහිසුණු ගැටුම් ඇති කිරීමට මුල්වන්නන් ලෙසත් ක්‍රියාකිරීමට ආගම් වලට හැකිවූයේ කෙසේද? මිනිසුන් තම විශ්වාස වෙනුවෙන් සටන් කිරීමට නිතැතින් පෙළඹෙන හෙයින් ආගම් නෛසර්ගිකව සටිඨනශීලී වන්නේද? එසේ නැතහොත් ආගමිකයන් සතු අධ්‍යාත්මික නැඹුරුව සහ අවිහිංසාව, සාමය සහ සමථ භාවනාව වැනි ආගමික විශ්වාස සහ භාවිතයන් නිසා ආගම නිතැතින්ම සාමකාමී බලවේගයක් වන්නේද? ආගම මූලික වශයෙන් ගැටුම්කාරී හෝ සාමකාමී ලෙස හඳුනා ගන්නා කවර හෝ ප්‍රවේශයක් අනුභාවිකව වලංගු නොවනු ඇත. එබැවින් වඩා නිවැරදි වන්නේ කුමන තත්ත්වයන් යටතේ ආගමික ක්‍රියාකාරීන් සහ ආගමික බලවේගයන් ප්‍රචණ්ඩත්වයට පත්වන්නේද, කුමන තත්ත්වයන් යටතේ එම බලවේගයන් සාමදූතයන් හෝ සහජීවන අනුශාසකයන් බවට පත්වන්නේද යන්න ක්‍රමානුකූලව විමසා බැලීමය.

ශ්‍රී ලංකාවේ මධ්‍යම ප්‍රදේශයේ ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන කිහිපයක් ඇසුරින් සිදුකළ වත්මන් අධ්‍යයනයේදී අප සොයා බලනුයේ ආගමේ මෙම එකිනෙකට පරස්පර ස්වභාවයයි. Appleby (2000) සහ ආගමික භීෂණය ගැන කරුණු විභාග කළ අනෙකුත් මානව විද්‍යාඥයින්ගේ ගමන් මග අනුව යමින් අප මෙහි දී තර්ක කරනුයේ ආගම ස්වභාවයෙන්ම ගැටුම්කාරී හෝ සාමකාමී සමාජ බලවේගයකට වඩා සමාදානය පිණිස හෝ බිහිසුණු ප්‍රචණ්ඩත්වය පිණිස භාවමය වශයෙන් උද්දීපනය කළ හැකි ව්‍යාකූල ක්ෂේත්‍රයක් වන බවයි. වත්මන් අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ පශ්චාත් යුධමය වාතාවරණය තුළ බෞද්ධ-ඉස්ලාම් ගැටුම් සහ සහජීවනය පිණිස තෝරාගත් ආගමික, සංස්කෘතික මධ්‍යස්ථාන කිහිපයකින් ඇතිවූ බලපෑම ගැඹුරින් විමසා බැලීමය.

ශ්‍රී ලංකාවේ බෞද්ධ-හින්දු සබඳතා සහ බෞද්ධ-ක්‍රිස්තියානි සබඳතා ගැන පුළුල් සමාජ විද්‍යාත්මක සාහිත්‍යයක් පවතින නමුත්, බෞද්ධ-ඉස්ලාම් සබඳතා ගැන කිසියම් ශාස්ත්‍රීය කුතුහලයක් ඇති වූයේ පශ්චාත් යුධමය පසුබිම තුළ මූලික වශයෙන් මුස්ලිම් විරෝධී අන්තවාදී බලවේගයක් ලෙස බොදු බල සේනා සංවිධානය බිහිවීමෙන් අනතුරුවය.

වත්මන් අධ්‍යයනයෙහි සුවිශේෂ අරමුණු පහත සඳහන් ලෙස දැක්විය හැකිය

1. යම් ආගමික හෝ සංස්කෘතික ස්ථාන ගැටුම් ජනනය කිරීමට හෝ මිනිසුන් එක්සත් කිරීමට දායක වන්නේ කුමන තත්ත්වයන් යටතේද?

2. ඒ ඒ පූජ්‍යස්ථාන හෝ සංස්කෘතික මධ්‍යස්ථාන වලට සම්බන්ධ ප්‍රධාන ක්‍රියාකාරකයන් කවුරුන්ද සහ අන්තර් ආගමික මැදිහත්වීම් වලදී ඔවුන්ගේ උවමනාකම් සහ රුචි අරුචිකම් කවරේද?

3. සහයෝගීතාව සහ ගැටුම් උත්පාදනයේදී ආගමික විශ්වාස සහ පිළිවෙත් වල බලපෑම කුමක්ද?

4. පූජ්‍ය ස්ථාන සම්බන්ධයෙන් වූ සිංහල-මුස්ලිම් ගැටුම් වලදී බොදු බල සේනා සහ වහබි මැදිහත්වීම් සහිත මුස්ලිම් පෙළගැසීම් වල සුවිශේෂ බලපෑම කුමක්ද?

5. තෝරාගත් පූජ්‍යස්ථාන සහ සංස්කෘතික කේන්ද්‍රයන් වල මෑතක දී ඇතිවූ බලපෑම් ඇසුරින් එබඳු ස්ථානවල ගැටුම් කළමණාකරණය සහ වැළැක්වීම පිණිස කෙබඳු රාජ්‍ය ප්‍රතිපත්ති වඩා සුදුසු වන්නේද?

මෙම අධ්‍යයනයට ලක්වුයේ බෞද්ධයන් සහ මුස්ලිම්වරුන් අතර ආගමික සහජීවනය සහ සංස්කෘතික හුවමාරුව අතින් දිගු ඉතිහාසයක් සහිත මාවනැල්ලේ දෙවනගල, කුරුණෑගල ගලේබණ්ඩාර දේවාලය සහ ගම්පොල කහටපිටිය මුස්ලිම් පල්ලියයි. මෙයින් කුරුණෑගල පිහිටි ගලේබණ්ඩාර දේවාලය සහ ගලේබණ්ඩාර මුස්ලිම් දේවස්ථානය මෙන්ම කහටපිටිය පල්ලියද බෞද්ධ, මුස්ලිම් සහ අනෙකුත් ආගමික භක්තිකයන්ද සම්බන්ධ බහු-ආගමික පූජ්‍යස්ථාන ලෙස සැලකිය හැකිය. (Secretariat for Muslims 2015; ගමගේ 2014). දෙවනගල යනු අතීතයේ ක්‍රියාත්මක වූ පන්සලක්, පොළොන්නරු යුගයට හෝ ගම්පොල යුගයට අයත් සෙල්ලිපි දෙකක් සහ අනෙකුත් පුරාවස්තු සහිත පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුත් මුස්ලිම් ගම්මාන සහ බෞද්ධ ගම්මාන කිහිපයට යාබදව ඇති ස්ථානයකි (බලන්න දෙවන සිතියම).

මෙම අධ්‍යයනය සිදුකරන අවස්ථාව වනවිට දෙවනගල ක්‍රියාකාරී පූජ්‍යස්ථානයක් නොවීය. කෙසේ නමුත් අදාල මතභේදයට සම්බන්ධ බෞද්ධ ක්‍රියාකාරීන්ට අනුව ප්‍රදේශයේ මුස්ලිම් පදිංචිකරුවන්ගේ ඇතැම් කටයුතු (උදා: හරක්මස් ආහාරයට ගැනීම, පුරාවස්තු විනාශ කිරීම) දෙවනගල හා සම්බන්ධ සිංහල බෞද්ධ උරුමයට හානිකර විය. දෙවනගල ආරක්ෂා කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කළ යෝජනා අතර මෙම පර්වතයට යාබදව පදිංචිව සිටින මුස්ලිම් සහ සිංහල ගම්වාසීන් වෙනත් පෙදෙසක පදිංචි කරවීමද

ඇතුළත් විය. මෙම ගැටලුවට කෙළින්ම සම්බන්ධ වූ රාවණා බලය සහ බොදු බල සේනා වැනි සංවිධාන වල යෝජනාව වූයේ දෙවනගල අවට පදිංචි මුස්ලිම් ගම්වාසීන් පමණක් ප්‍රදේශයෙන් ඉවත් කළ යුතු බවය. ප්‍රදේශයේ පදිංචි මුස්ලිම් ගම්වැසියන් අඩුතරමින් 16 වන සියවසේ පමණ සිට අඛණ්ඩව මෙහි පදිංචිව සිට ඇති බව මෙහිදී සිහිතබා ගත යුතුය (Dewaraja 1994).

වර්තමාන අධ්‍යයනය සඳහා ස්ථාන තුනක් (3) තෝරාගනු ලැබුවේ එම ස්ථානවල ඓතිහාසික පසුබිම, ජනවාර්ගික සංයුතිය අධ්‍යයනයේ පහසුව සහ අන්තර් ආගමික සබඳතා අතින් ඇති වැදගත්කම වැනි විශේෂ හේතු රාශියක් සැලකිල්ලට ගනිමිනි. මෙම අධ්‍යයන ස්ථාන තෝරාගනු ලැබුවේ ශ්‍රී ලංකාවේ සිංහල-මුස්ලිම් සබඳතා තේරුම් ගැනීම සඳහා උදව් වන උදාහරණ ලෙස මිස නියෝජනාත්මක නියැදියක් ලෙස නොවේ. එවැනි පුළුල් අධ්‍යයනයක අවශ්‍යතාව අප විසින් අවතක්සේරුවකට ලක් නොකරන නමුදු, වත්මන් පර්යේෂණයේදී එවැනි අධ්‍යයනයක් සඳහා අවශ්‍ය කාලය සහ සම්පත් පර්යේෂණ කණ්ඩායමට නොවීය.

## ක්‍රමවේදය සහ ප්‍රවේශය

මෙම අධ්‍යයනය සඳහා යොදාගනු ලැබුවේ යුහුසුළු මානව විද්‍යාත්මක ක්‍රමවේදයයි (Rapid Ethnography). මේ යටතේ අදාළ ස්ථාන පිළිබඳ වූ වාර්තා, ජනකථා සහ ජනකවි, පුවත්පත් සටහන් යනාදිය විභාග කරන ලදි. ඊට අමතරව මූලික තොරතුරු සපයන්නන් හමුවී තොරතුරු රැස් කිරීම, මුඛ පරම්පරාගත ඉතිහාසය (Oral History), ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය සහ සහභාගි සහ සහභාගි නොවන නිරීක්ෂණ යන ක්‍රමෝපායන් මෙහිදී භාවිතා කරන ලදි. මෙම ස්ථාන වල අතීත තත්ත්වය සහ අතීතයේ පැවති සිංහල-මුස්ලිම් සබඳතා සහ ඒවා ක්‍රමයෙන් වෙනස් වී ඇති ආකාරය සහ අන්තවාදී නැඹුරුවක් සහිත බාහිර කණ්ඩායම් වල මැදිහත්වීම නිසා සිදුවී ඇති විපාක මෙහිදී විශේෂයෙන් අවධානයට ලක්විය.

ගලේබණ්ඩාර සහ කහටපිටිය පූජ්‍යස්ථාන බෞද්ධ-මුස්ලිම් දෙපාර්ශවයම භේදයකින් තොරව ආගමික කටයුතු වලට කෙලින්ම සහභාගී වන බහු-ආගමික ස්ථානයන් විය. මෙහිදී විභාග කරන ලද්දේ මෙම ස්ථානවල ඇති බහු-ආගමික උරුමය සහ ඉතිහාසයත් එමගින් අන්තර් ආගමික සහජීවනය කෙරෙහි ඇතිවූ බලපෑම සහ මෑතභාගයේ දී අන්තවාදී කණ්ඩායම් වල බලපෑම නිසා අන්තර් ආගමික සහජීවනය පළුදු වී ඇති ආකාරයයි. කෙසේ නමුත් මෙම අධ්‍යයනයට තිබූ සීමාකම් නිසා මෙම ස්ථානවලට සම්බන්ධ සියලුම පාර්ශවයන්ගෙන් තොරතුරු එක්රැස් කිරීමට මෙහිදී නොහැකි විය. උදාහරණයක් ලෙස දෙවනගල අධ්‍යයනයේදී අසල්වාසී මුස්ලිම් සහ බෞද්ධ නායකයන්ගෙන් තොරතුරු ලබාගත් නමුත් ජන කණ්ඩායම් දෙක නියෝජනය වන නියැදියකින් තොරතුරු ලබා ගැනීමට හෝ දිගුකාලීන මානව වංශ විද්‍යාත්මක විමසුමක් ඔස්සේ සියළු පාර්ශවයන්ගෙන් ගැඹුරින් තොරතුරු රැස් කිරීමට නොහැකි විය. කෙසේ නමුත් අප මෙහිදී සඳහන් කළ යුත්තේ යුහුසුළු මානව විද්‍යා ප්‍රවේශය ඔස්සේ සිදුකළ මෙම අධ්‍යයනයේ සොයාගැනීම් වඩාත් අංගසම්පූර්ණ අධ්‍යයනය මාලාවක් ඔස්සේ ඉදිරියේදී තහවුරු කරගත යුතු බවයි.

## ආගමික සංකලනයද? ආගමික බහුත්වයද?

ශ්‍රී ලංකාවේ ආගමික සිද්ධස්ථාන වලින් බොහොමයක් “සංකීර්ණ ආගමික අඩවි” (Complex Religious Fields) වශයෙන් හඳුනාගත හැකි අතර ඒවා එකිනෙකට වෙනස් ආගම් හමුවන, අදහස් හුවමාරුවන, එකිනෙකාගෙන් ඉගෙන ගන්නා, සහ සමහරක් අවස්ථා වලදී එකිනෙකා සමඟ මුහුන්වන සහ ඒ අතරම එකිනෙකා සමගින් තරඟ කරන, එකිනෙකාට අභියෝග කරගන්නා, සහ ගැටුම් ඇතිකරගන්නා අඩවි වශයෙන් හැඳින්විය හැකිය.

මහනුවර ශ්‍රී දළදා මාලිගාව[1], ශ්‍රී පාද අඩවිය[2] සහ කතරගම[3] යන සිද්ධස්ථාන දෙස බැලීමේදී මෙහි සඳහන් කළ ආගමික සංකීර්ණත්වය දැකගත හැකිය.

ශ්‍රී ලංකාවේ ආගමික සහජීවනය පිළිබඳ අධ්‍යයනය බොහෝ විට කේන්ද්‍රගත වූයේ බෞද්ධ සහ හින්දු ආගමිකයන් අතර අන්තර් ක්‍රියාවන් කෙරෙහිය (Goonsekera 2007, Kapferer 1991, 1997, Gombrich and Obeyesekere 1988, Pfaffenberger 1979). මේ ආගමික සම්ප්‍රදායන් දෙක අතර ඇති ඓතිහාසික සම්බන්ධතා සහ සමහරක් හින්දු ආගමික සම්භවයක් ඇති දෙවිවරුන් ජනප්‍රිය බෞද්ධාගමට අන්තර්ග්‍රහණය කරගෙන තිබීම ගත්විට මෙය එතරම් අරුමයක්ද නොවේ.

බෞද්ධ සහ හින්දු භක්තිකයන් අතර ජනප්‍රිය දෙවියකු වශයෙන් කතරගම දෙවියන් ඉස්මතුවීම ශ්‍රී ලංකාවේ මෙම බෞද්ධ-හින්දු ආගමික සංහිඳියාවේ එක පැතිකඩකි. කතරගම දෙවියන් ආශ්‍රිත ආගමික සිද්ධස්ථාන වල පාලනය තමන් නතු කර ගැනීමට බෞද්ධයින් සහ හින්දු භක්තිකයන් අතරවූ අරගලයේ ප්‍රතිඵලයක් වශයෙන් කතරගම (Gombrich and Obeyesekere 1988, Tambiah 1986, 1996), මහනුවර පූජා සංකීර්ණය (Seneviratne 1978) සහ ශ්‍රී පාදය (de Silva 2005) වැඩි වැඩියෙන් බෞද්ධකරණයට සහ

---

1 මහනුවර දළදා වන්දනාව ප්‍රධාන වශයෙන් බුදු සමය හා සම්බන්ධය. දළදා මාළිගාව හා සම්බන්ධ සතර දේවාල, එනම්, නාථ, පත්තිනි, විෂ්ණු සහ කතරගම දේවාල, බෞද්ධ, හින්දු සහ වෙනත් ආගමිකයන් ද පොදුවේ වන්දනා කරන ස්ථානයන්ය. මේ ආගමික සංකීර්ණය සහ සම්බන්ධ වාර්ෂික ඇසළ පෙරහර සියලු ආගමිකයින් ගේ සහභාගිත්වයෙන් පවත්වන සෞභාග්‍යය සහ සපලත්වය සම්බන්ධ පිළිවෙත් සංකීර්ණයකි.

2 ශ්‍රී පාද කඳු මුදුනේ ඇති පාද සටහන බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, සහ ඉස්ලාම් යන සෑම ආගමක්ම තම ආගමට ආවේනික වූ උරුමයක් ලෙස සලකති. මෙම පාද සලකුණු තම ආගමේ ආරම්භකයාගේ හෝ වෙනත් වැදගත් නායකයකුගේ පාද සලකුණු ලෙස මේ සියළු ආගම් සලකති. මේ ගැන ඔවුන් අතර විවාදයක් නොමැත.

3 කතරගම ඇදහිල්ලද බහු ආගමික ඇදහිල්ලකි. වැදි ජනයා, හින්දු සහ බෞද්ධ ඇතුළත්ව සියලු ආගමිකයන් භේදයකින් තොරව තම ලෞකික සාර්ථකත්වය සඳහා කතරගම ඇදහිල්ලට සම්බන්ධ වේ. එකිනෙකාගේ ආගමික පිළිවෙත් එකිනෙකට වෙනස්විය හැකි නමුදු පොදුවේ සෑම දෙනාම කතරගම දෙවියන් වන්දනා කරති.

සිංහලකරණයට ලක්වූවත් මේ සිද්ධස්ථාන වල ඇති හින්දු ආභාෂය එමගින් මුළුමනින්ම අතුරුදහන් වී නැති බව අපට හෙළි වන්නේ යාපනයේ සිට කතරගම දක්වා සිදුකරනු ලබන "පාද යාත්‍රාව"[4], උත්සව සමයේ කතරගමට සංචාරය කරන හින්දු භක්තිකයන් අතර "තුක්කු කාවඩි"[5] යේ ජනප්‍රියත්වය සහ භක්ති ආගමික වත් පිළිවෙත් වලදී මෙම ආගමික ද්විත්වයම හරහා බලපාන හින්දු ආගමික ආභාෂයන් යන සළකුණු වලිනි.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු දෙයක් නම් ශ්‍රී ලංකාවේ මෑත දශක කිහිපය තුළ පුපුරාගිය සිංහල-දමිළ වාර්ගික ගැටුම් ආකෘතිමය ලෙස හෝ අන්තර්ගත වශයෙන් බෞද්ධ-හින්දු ආගමික ගැටුම් නොවූ බවයි. බොහෝ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඉතා විවෘතව සිංහල හමුදාවන්ට සහය සහ අශිර්වාදය පළ කළ නමුත්, දේශපාලනික මැදිහත්කරුවන් හෝ ක්‍රියාකාරිකයින් නොවන, යාතුකර්ම වල නියැලෙන හින්දු පූජකවරු, ඔවුන් ගැටුමට ඇදගැනීමට LTTE සංවිධානයේ විවිධ උත්සාහයන් සහ බලපෑම් මධ්‍යයේ පවා එයින් වැලකී සිටීමට තීරණය කළහ.

අනිත්පැත්තෙන් LTTE සංවිධානය බෞද්ධ සිද්ධස්ථාන වලට ප්‍රහාරයන් එල්ල කරමින්, සමහර බෞද්ධ භික්ෂූන් ඝාතනය කරමින්, එක් අතකින් සිංහල-බෞද්ධ ජනතාව කුපිත කිරීමටත්, අනෙක් අතින් බෞද්ධ භික්ෂූන් වහන්සේ අතිශයින් දේශපාලනිකරණය වී, යුධවාදීව දෙමළ බෙදුම්වාදයට එරෙහිව පෙළගැසීමටත් දායක විය.

Obeyesekere (1970, 1975, 2006) විසින් යටත් විජිත සමයේ බෞද්ධාගම මත ඇතිවූ ක්‍රිස්තියානි ආගමේ බලපෑම විස්තර කිරීමට "ප්‍රොතෙස්තන්තු බුද්ධාගම" නම් සංකල්පය හඳුන්වා දෙනු ලැබිය. ඔහුගේ විශ්වාසය වන්නේ මෙම සංකල්පය මගින් බෞද්ධ ක්‍රිස්තියානි ආගමික සංස්ථාවන් අතර ඇති ගැටලුකාරී සහ අපැහැදිලි සම්බන්ධතාවය ග්‍රහණය කර ගැනීමට හැකියාවක් ඇති බවයි. එනම් බෞද්ධ ආගමික සංස්ථාව ක්‍රිස්තියානි ආගමික සංස්ථාවේ ඇති යම් යම් ආයතනික ආකෘති අනුකරණය කරන අතරතුර ක්‍රිස්තියානි දහමේ දර්ශනය සහ ඉගැන්වීම් අභියෝගයට ලක්කරනු ලබයි.

4 පාද යාත්‍රා යනු යාපනයෙන් ආරම්භ වී නැගෙනහිර වෙරළ ඔස්සේ කතරගම උත්සවයට සහභාගිවීම සඳහා කණ්ඩායමක් ලෙස පයින් ගමන් කිරීමය. විවිධ ආගමික බැතිමතුන් ගමන් මගේ විවිධ ස්ථාන වලදී පාද යාත්‍රාවට සම්බන්ධ වෙති. ඔවුන් ඒකරාශි කරන ප්‍රධාන බලවේගය කතරගම දෙවියන් පිළිබඳව ඇති අසීමිත විශ්වාසයයි.

5 දේව භක්තිය ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් ලෙස මෙහිදී පිරිමි බැතිමතුන් සිරුරට ගැසූ කටුවලින් බර වාහනයකට සවිකළ කණු වල එල්ලී එහාට මෙහාට පැද්දෙති. මෙය දෙවියන්ට බාර ඔප්පු කිරීමේ ක්‍රියාදාමයක් ලෙසද යොදා ගනු ලැබේ. යුද්ධයෙන් අනතුරුව තුක්කු කාවඩි වල ජනප්‍රියතාව වැඩිවී ඇතැයි Derges (2013) ගේ මානව විද්‍යාත්මක පර්යේෂණයෙන් හෙළිවිය.

"ප්‍රොතෙස්තන්තු බුද්ධාගම" යන සංකල්පය යටත් විජිත හෝ පසු යටත් විජිත බෞද්ධාගමික ප්‍රවණතා පිලිබඳ පර්යේෂණ වල නියුතු අය ඉතා බහුලව භාවිතා කරනු ලබති (Malalgoda 1976). කෙසේ වෙතත් සමහර විචාරකයන් මෙම සංකල්පය විවේචනය කරති. ඔවුන්ගේ අදහස වන්නේ මේ සංකල්පයට බෞද්ධ පුනරුදය හා බැඳුනු සැබෑ ආර්ථික ගතිකත්වයන් ලඝු කළ නොහැකි බවයි. එනම් ප්‍රොතෙස්තන්තු ප්‍රතිසංස්කරණ පිළිබඳව Weber (1930) අවධාරණය කර ඇති පරිදි, බෞද්ධ පුනරුදය ඇතිවූ මුල් අවදියේ කතෝලික සහ බෞද්ධ සංස්ථාවන් අතර තිබූ සම්බන්ධතාවය සහ යටත් විජිත විරෝධී බලවේගයන්ගේ පෙළ ගැස්ම මේ සංකල්පය මගින් ප්‍රමාණවත් ලෙස විග්‍රහ නොවන බවයි (eg. Holt 1999).

සමහර පර්යේක්ෂකයන් ආගමික සංකලනය (syncretism) යන සංකල්පය මගින් ආගම් අතර සැබෑ අන්තර්ක්‍රියාවන් නැතහොත් අන්නෝන්‍ය අදහස් හුවමාරුවීම් කෙතෙක් දුරට නිවැරදිව ප්‍රකාශ කරනු ලබන්නේදැයි ප්‍රශ්න කරනු ලබති. උදාහරණයක් වශයෙන් Walters ට (1995) අනුව ආගමික සංකලනය හුදෙක් එකිනෙකට වෙනස් ආගම්වල මුලිකාංග සැබෑ ලෝකයේ ආගමික ක්‍රියාවන් වලදී සුසංයෝජනය වී ඇති ආකාරය පෙන්වාදෙන නමුත් මේ වෙනස් මුලිකාංග යම් ඓතිහාසික සන්දර්භයක් තුළදී එවන් සුසංයෝජනයකට ලක්වන්නේ ඇයි, එසේ ඒකරාශි වන සංරචක සුසංයෝජනය වූ ඒකාබද්ධ විශ්වාසය පද්ධතියක් ලෙස නිර්මාණය වන්නේ කෙසේද යන්න පැහැදිලි නොවේ. මිනිසුන් එකිනෙකට වෙනස් ආගම්වලින් විවිධ විශ්වාස හා වත් පිළිවෙත් උපුටා ගනිමින් තම පැවැත්ම පිළිබඳ අවිනිශ්චතාවයන් වලට මුහුණදීමේ සන්දර්භය තුළ තමන්ගේ ආගමික අවශ්‍යතාවයන් සපුරාගැනීමේ ප්‍රවනතාවය ඔහු හඳුන්වා දුනනේ "බහු ආගමිකත්වය" (Multi religion) නමින්ය.

McGilvray (2008) නැගෙනහිර ශ්‍රී ලංකාවේ හින්දු-මුස්ලිම් අන්තර් සම්බන්ධතා පිළිබඳව අවධානය යොමු කළ අතර, ඔහු පෙන්වා දෙන්නේ දමිළ ඩයස්පෝරාව සහ ඔවුන් ශ්‍රී ලංකාවට එවන මුදල් මෙන්ම මැද පෙරදිගින් එන ආර්ථික හා ආගමික බලපෑම්ද නැගෙනහිර වෙරළ තිරයේ ආගමික භූමි දර්ශනයේ හැඩතල වෙනස්කිරීමට දායක වී ඇති බවයි. විවිධ ආගමික මත ඉවසීමේ සහජීවන පරිසරයක සිට සම්පත් ලබාගැනීමට සහ තමන්ගේ ආගමික අනන්‍යතා ප්‍රතිරූපය වඩා ප්‍රදර්ශනය කරවීමේ තියුණු තරඟ කාරීත්වයකට ක්‍රමයෙන් අවතීර්ණ වෙමින් පවතින බවය.

සමස්තයක් වශයෙන් ගත්විට මෙම අධ්‍යයන වලින් පෙන්වාදීමට උත්සාහ ගන්නේ ශ්‍රීලංකාව තුළ දිගුකාලීන වශයෙන් අන්තර් ආගමික සම්බන්ධතාවල සමාජ-සංස්කෘතික බලපෑමයි. බෞද්ධ සහ මුස්ලිම් ආගම් දෙක අතර සහජීවනය අවුරුදු 800 ක පමණ අතීතයට දිවෙන නමුත් මෙම ආගම් දෙක අතර ආගමික සංකලනය පිළිබඳ මේ දක්වා ලියැවී ඇති ශාස්ත්‍රීය ලිපි සහ පොත් අතිශයින් සීමිතය. බෞද්ධ-මුස්ලිම් සංස්කෘතික අන්තර් සම්බන්ධතා ගැන

කිසියම් අවධානයක් යොමුවී ඇත්නම් එයද වෛද්‍ය ක්‍රම, සහ ආහාර පාන අතින් සිදුවූ හුවමාරු කෙරෙහි පමණක් සීමා වී ඇත (උදා: Dewaraja 1994).

ඉස්ලාම් සහ බෞද්ධ ආගම් අතර මූලික විශ්වාස අතින් පෙනෙන්නට තිබෙන ප්‍රතිවිරෝධතා, එනම් ඉස්ලාම් ධර්මයේ සර්වබලධාරි එක් දෙවිකෙනෙකු ගැන පමණක් විශ්වාස කිරීම සහ ඇදහීම සහ දාර්ශනිකව සලකනවිට බෞද්ධාගමේ කිසිම දෙවිකෙනෙකු නොඇදහීම හා ප්‍රායෝගිකව දෙවිවරු සමුහයක්ගේ පිහිට පැතීම (උදා: කෙනෙකුට ආශිර්වාද කිරීමේදී "බුදු සරණයි, දෙවිපිහිටයි" කීම) මේ තත්වය සඳහා දැක්විය හැකි එක පැහැදිලි කිරීමක් විය හැක. ඉස්ලාමීය සිද්ධස්ථානයක් කතරගම පූජා සංකීර්ණයේ ස්ථාපිත කර ඇති නමුත්, මෙම (කතරගම) පූජා අඩවියේ ඇති බහු ආගමික සන්දර්භය තුළ එම (ඉස්ලාමීය) සිද්ධස්ථානය පිහිටීමේ වැදගත්කම සැලකියයුතු ගවේෂණයකට ලක්වී නොමැත (Pfaffenberger 1979).

මෙම අධ්‍යයනයේදී බෞද්ධ සහ ඉස්ලාමීය ආගම් අතර ඇති විවිධාකාර අන්තර්ක්‍රියාවන් කෙරෙහි අවධානය යොමුකර ඇත්තේ ඉහත සඳහන් කාරණා සැලකිල්ලට ගනිමිනි.

## දෙවනගල බහු සංස්කෘතික උරුමය සහ මෑතයුගයේදී සංස්කෘතික පාරිශුද්ධකරණ ප්‍රවණතා

දෙවනගල පුරාවිද්‍යාත්මක භූමිය ආශ්‍රිතව පැන නැගී ඇති අර්බුදය අපට හෙළි කරන්නේ බෞද්ධ සහ ඉස්ලාමීය ආගම් දෙකෙහිම පැනනැගී ඇති නව ආගමික බලවේගයන් මගින් මෙම ප්‍රදේශයේ ඇති ශක්තිමත් බහු සංස්කෘතික උරුමයන් අභිභවා සංස්කෘතික පාරිශුධත්වයක් ඇතිකිරීම උදෙසා කරන ආක්‍රමණශීලි උත්සාහයකි.

දෙවනගල පර්වතය මාවනැල්ල නගරයේ සිට කි.මි. හයක් දුරින් මාවනැල්ල - හෙම්මාතගම මාර්ගයේ පිහිටා ඇත (පළමු සිතියම බලන්න). දළ වශයෙන් හෙක්ටයාර් අටක් පමණ වන මේ පර්වතය බෞද්ධ ස්මාරක කිහිපයකින්, එනම් ස්තූපයක්, බෝධියක්, පොකුණක්, ගල්ලෙනක්, අසපුවක් ඇතුළුව බණ ශාලාවක් සහ විෂ්ණු දේවාලයකින් ද සමන්විතය.

මෙම පර්වතයෙහි සෙල්ලිපි දෙකක් ඇති අතර ඉන් එකක් 12 වන සියවසටත් (පොළොන්නරු යුගය), අනෙක මහනුවර යුගයටත් අයත්ය. පොළොන්නරු යුගයට අයත් සෙල්ලිපියෙහි මහා පරාක්‍රමබාහු රජු (1153-1186) විසින් ඔහුගේ සෙන්පතියෙකුට තමා මියන්මාරයේ රජතුමා සමඟ කළ යුද්ධයෙහිදී එම සෙන්පතියා දැක්වූ වීරත්වය සහ කැපවීම අගයමින් දෙන ලදැයි කියන ගම්වරයක් ගැන කියැවෙයි. මහනුවර යුගයට අයත්වන සෙල්ලිපියෙහිද විමලධර්මසූරිය රජු විසින් බෞද්ධ භික්ෂුන්වහන්සේ නමකට එම භික්ෂුන්වහන්සේ

රජුට රජකම ලබාගැනීමේදී දක්වන ලද සහයෝගයට කෘතගුණ සැලකීමක් වශයෙන් රුවන්දෙනිය ග්‍රාමයෙන් ඉඩමක් පරිත්‍යාග කළ බවක් කියවෙයි (Paranavithana 1933).

දෙවනගල පර්වතයෙහි ඇති පන්සලෙහි වරින් වර භික්ෂූන් වහන්සේලා වැඩ සිටි නමුත් මෑත අවුරුදු කිහිපයක සිට එහි භික්ෂූන් වහන්සේ වාසය නොකරති. මීට හේතුව පර්වතය මුදුනේ ජීවත් වීමේදී මුහුණපාන්නට වන දුෂ්කරතාවයන්ය. මෙම පර්වතය 2004 දී රජය මඟින් පුරාවිද්‍යාත්මක වැදගත් කමකින් යුත් භූමියක් වශයෙන් ගැසට් දැන්වීමක් මගින් ප්‍රකාශයට පත්කරන ලදී. ආරම්භයේදී පර්වත සීමාවේ සිට මීටර 200 ක් දක්වා වූ භූමි ප්‍රදේශය රක්ෂිත කලාපයක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබූ අතර වර්ෂ 2005 දී නව ගැසට් නිවේදනයක් මගින් මෙම රක්ෂිත කලාපය  මීටර 400ක් දක්වා දිගු කරන ලදී. කෙසේ වෙතත් මෙම මීටර 400යේ සීමාව ඉඩම් මැනීමකින් සහ සීමා සලකුණු කිරීමකින් නිර්ණය නොකෙරුණි.

දෙවනගල පර්වතය ගම්මාන කිහිපයකින් වට වී ඇති අතර මේ ගම්මාන වලින් සමහරක සිංහල-බෞද්ධ ජනතාව බහුතරය වන අතර අනෙකුත් ගම්මානවල බහුතරය මුස්ලිම් ජනතාවයි (දෙවන සිතියම බලන්න). පර්වතය මුදුනේ ඇති පන්සලෙහි නඩත්තු කටයුතු සිදුකරනු ලබන්නේ රුවන්දෙනිය ගමේ පිහිටි පන්සලක නායක භික්ෂූන්වහන්සේ ඇතුළු එම පන්සලේ දායකයින් විසිනි. දෙවනගල පර්වතය 2004 ජුනි 4 වන දින රජය විසින් පුරාවිද්‍යාත්මක වැදගත් කමකින් යුතු අඩවියක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීමත්, ඊට සමගාමීව පළමුව මීටර 200 සහ පසුව මීටර් 400 වශයෙන් පර්වතය අවට ප්‍රදේශය රක්ෂිත කලාපයක් බවට ප්‍රකාශයට පත්කිරීමත් සමඟ පර්වතය සමීපයේ සහ ඒ අවට පදිංචිවී සිටින බෞද්ධ සහ මුස්ලිම් ජනතාවට ගැටලුවක් ඇතිවිය. මින් බොහොමයක් දෙනාහට ඔවුන්ගේ ඉඩම් සඳහා නීත්‍යානුකුල ඔප්පු ඔවුන් සතුව ඇති නමුත්, ඔවුන්ගේ ඉඩම් මෙම නව රක්ෂිත කලාප සීමාව ඇතුළත් වූ බැවින් මේ පාරම්පරික ඉඩම් වලින් ඔවුන් අවතැන්වීමේ යම් අවදානමක් ඇතිවිය (Secretariat for Muslims 2015).

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් දෙවනගල මෙම මීටර් 200 හෝ මීටර් 400 වශයෙන් ප්‍රකාශිත රක්ෂිතය සීමා මැනීමකින් සහ සලකුණු කිරීමකින් තොරව ප්‍රකාශ කළ බැවින්, කවුරුන් මේ පුරාවිද්‍යා රක්ෂිතය තුළ ජීවත්වන්නේද, කවුරුන් ඉන් පිටත ජීවත්වන්නේද යන්න පිළිබඳ ව්‍යාකුල තත්වයක් උද්ගත වී ඇත. එම නිසා ඇතැම් අයට තම පදිංචි ස්ථානය අහිමිවීමේ අභියෝගයක් ද උද්ගත වී ඇත.

සාම්ප්‍රදායිකව මාවනැල්ල නගරයේ සහ ඒ අවට ගම්වල පදිංචි සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන් ඔවුන් අතර වූ බොහෝ සමාජ සහ සංස්කෘතික අන්තර් ක්‍රියා හේතුවෙන් සහජීවනයෙන් ජීවත්වූ පිරිසක් විය. බොහෝ ප්‍රදේශවල සාමාන්‍යයෙන් දකින්නට ලැබෙන පරිදි මේ ප්‍රදේශයේද මුස්ලිම් ප්‍රජාව ආර්ථික වශයෙන් (සිංහල ප්‍රජාවට වඩා) හොඳ තත්වයක සිටින අතර ඉඩම්, දේපළ, ආර්ථික සම්පත් කෙරෙහි හිමිකමක් මෙන්ම වෙළඳපල ඒකාධිකාරිත්වයද ඔවුන් සතුවිය. මාවනැල්ල සහ ඒ අවට සිංහල ජනතාව ගෙන් සැහෙන පිරිසක් මුස්ලිම් අය යටතේ සේවය කරන බැවින් ආර්ථික වශයෙන් ඔවුන් මත යැපෙති. කෙසේවෙතත් මේ තත්වය මේ ප්‍රදේශය තුළ සෑම ස්ථානයකම මේ ආකාරයෙන් ඒකාකාරී යයි මෙයින් අදහස් නොවේ. එනම් මුස්ලිම් ප්‍රජාව අතරද යම් තරමකට දිළිඳු බව දැකිය හැකි අතර සිංහල ප්‍රජාව අතර ඉඩම් හිමියන්, වෘත්තිකයින්, සහ නව ව්‍යාපාරිකයින් ඇතුළුව වරප්‍රසාද ලත් කොටසක් ද ජීවත් වේ (ගමගේ 2014).

ජනප්‍රවාදයට අනුව මුස්ලිම් ජනතාව මෙම ප්‍රදේශයේ පදිංචි කරනු ලැබ ඇත්තේ මහනුවර රාජකීය පවුල විසින් රජ මාලිගයට ඔවුන්ගෙන් ලැබුණ සේවාවන් අගය කිරීමක් වශයෙනි. ඔවුන් එසේ සැපයූ සේවාවන් අතරට, “මඩිගේ”[6] ප්‍රවාහන සේවාව, සම්ප්‍රදායික යුනානි වෛද්‍ය වරුන්ගේ වෛද්‍ය සේවය සහ රාජකීය පළතුරු උද්‍යානයක් ස්ථාපිත කර නඩත්තු කිරීම ඇතුළත් විය. මාවනැල්ල, අරණායක සහ හෙම්මාතගම යන ප්‍රදේශ වලින් එන මුස්ලිම් වෙළඳුන් අවට ගම්වලට ගොස් ඒවායේ වගා කරන කුළුබඩු වල එළදාව මිළදී ගත් අතර මාවනැල්ල නගරය වැඩිවශයෙන් මුස්ලිම් වෙළඳුන් විසින් පාලනය කරන, ඔවුන් විසින් අවට ගම්වලින් ගෙනෙන එළදාව මිළදී ගැනීමට අමතරව, එම ගම්වල පවතින කුඩා වෙළෙඳසැල් වලට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සපයන නාගරික මධ්‍යස්ථානයක් බවට පත්විය. ඇතැම් මුස්ලිම් ව්‍යාපාරිකයින් ප්‍රදේශයේ ප්‍රධාන බෞද්ධ පන්සල් වල ප්‍රධාන පෙළේ අනුග්‍රාහකයින් බවට පත්විය. විවිධ ආර්ථික-සමාජ සබඳතා නිසා ප්‍රජාවන් දෙක අතර අන්‍යෝන්‍ය විශ්වාසය ගොඩ නැගුණි. සියලූ ආගම් අදහන අය අලූත් නුවර දේවාලය ඇතුළුව ප්‍රදේශයේ ජනප්‍රිය දේව ඇදහිලි සම්ප්‍රදායන් වලට ආකර්ෂණය වූ බැවින් ඒවා යම් තරමක බහු ආගමික ස්වරූපයක් ගත්තේය.

ප්‍රදේශයේ බොහොමයක් මුස්ලිම් පවුල්වලට ඇත්තේ සිංහල වාසගම් ය. උදාඃ තම්බි මුදියන්සේලාගේ. මඩිගේ වෙද මුහන්දිරම්ලාගේ. මෙයින් පෙනී යන්නේ බොහොමයක් මුස්ලිම් පිරිමින් පිට ප්‍රදේශ වලින් පැමිණ, සිංහල කාන්තාවන් විවාහකරගෙන ප්‍රදේශයේ පදිංචි වූ බවය. වෙනත් වචන වලින් කියන්නේ නම් මෙය ජාතීන් දෙක අතර අන්තර් විවාහ සිදුවීමේ ඉතිහාසයක් අපට කියාපායි. ප්‍රදේශයේ බොහෝ මුස්ලිම් පිරිමින්ට සිංහල සහ දමිළ යන භාෂා දෙකම කතා කිරීමේ හැකියාවක් ඇත. නිවෙස් තුළදී සහ ඔවුන්ගේ

6 “මඩිගේ” යනු රජ වාසල සඳහා ගොන් කරත්ත වලින් බඩු ප්‍රවාහනය කිරීමේ සේවාවයි. මෙම සේවාව වෙනුවෙන් රාජකීය පදනම යටතේ ඉඩම් පැවරීමක් ද සිදුවිය. වැඩි විස්තර සඳහා බලන්න Pieris (1956).

ප්‍රජාව තුළ එදිනෙදා කටයුතු සඳහා ඔවුන් දමිළ භාෂාව භාවිතා කරන අතර, සිංහල ප්‍රජාව සමඟ ව්‍යාපාරික සහ අනෙකුත් අන්තර් සම්බන්ධතා වලදී අදහස් හුවමාරු කරගැනීමට සිංහල භාෂාව උපයෝගී කර ගනිති.

මාවනැල්ල ප්‍රදේශයේ අතීතයේ විසූ වීරයකු ලෙස සැලකෙන, පොහොසතුන්ගේ මුදල් කොල්ල කා ඒවා දුප්පතුන් අතර බෙදා දුන්, "උතුවන් කන්දේ සූර සරදියෙල්" ගේ හොඳම මිතුරා මම්මලේ මරික්කාර් නමැති මුස්ලිම් ජාතිකයෙක් විය. මරික්කාර්ගේ නැගෙණිය සරදියෙල්ගේ ආදරවන්තිය වූවාය. තවද සරදියෙල්ගේ පියා මීගමුව ප්‍රදේශයේ සිට පැමිණ, උතුවන් කන්දේ කාන්තාවක් සමඟ විවාහවූ කතෝලික පසුබිමක් ඇති අයෙකු බව කියවේ. මෙම තොරතුරු ප්‍රදේශයේ බහු සංස්කෘතික සහ බහු ආගමික උරුමය කදිමට අවධාරණය කරයි.[7]

කෙසේ නමුත් 1950 න් පසු ප්‍රදේශයේ ජන වර්ග අතර යම් ආතතීන් ඇතිවෙන්නට පටන් ගත්තේය. මේවාට හේතුවූ කරුණු අතර වාර්ගික වෙනස්කම නොතකා ඇතිකරගත් ප්‍රේම සම්බන්ධතා නිසා පවුල් අතර ඇතිවූ ආරවුල්, ඉඩම් ආරවුල් සහ ආර්ථික තරඟ කාරීත්වය දැක්විය හැකිය. මාවනැල්ල සහ ඒ අවට කුළුබඩු මිළ දී ගැනීම සහ සිල්ලර බඩු සැපයීමේ දී තිබූ මුස්ලිම් ඒකාධිකාරය එවකට ඉස්මතු වෙමින් පැවති, ව්‍යාපාරික උනන්දුවක් සහිත, ප්‍රාදේශීය දේශපාලඥයන්ගේ සහයෝගය ලබන නව සිංහල ව්‍යාපාරික ප්‍රජාවකගේ කනස්සල්ලට සහ දෝෂදර්ශනයට හේතුවිය. මෙම තත්වය ගිණිකොනදිග ආසියාතික කලාපයේ ආර්ථික වශයෙන් බලවත් සුළුතර ජනවර්ග සහ දේශපාලනික වශයෙන් බලවත් බහුතර ජනවර්ග අතර අභිලාෂයන් සහ අරමුණු අතින් ගැටුම් ඇතිවීමේ රටාවේ ආකෘතියට සමානය (Chua 2004).

2001 වර්ෂයේදී මාවනැල්ලේ ජනවාර්ගික කොලාහලයක් ඇතිවිය (Silva, Deen and Gunasekera 2001). මෙයට හේතුව වූයේ දේශපාලන අනුග්‍රහය සහිතව වෙළඳසැල් වලට ආරක්ෂාව සැපයීමට යයි කියමින් කප්පම් එකතු කරන සිංහල කල්ලියකට මාවනැල්ල මුස්ලිම් වෙළඳ ප්‍රජාව කප්පම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීමයි. මෙසේ කප්පම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු මේ කල්ලිය ජාතිවාදය අවුලුවා මුස්ලිම් වෙළෙඳ ව්‍යාපාරිකයින්ට පහර දී ඔවුන්ගේ වෙළඳසල් වලට අලාභහානි කර ගිනිතබන ලදී. මෙම ගැටුම්වල ප්‍රතිඵලයක් වශයෙන් එක් පුද්ගලයකු මියගිය අතර බොහෝ දෙනෙක්ට හානි සිදුවිය. වෙළෙඳසල් කිහිපයක්ම ගිනිතබා විනාශ කරන ලදි. මෙම සිද්ධියේදී පොලීසිය සිංහල පාර්ශවයට යම් පක්ෂපාතීත්වයක් දැක්වූ බවත් ප්‍රාදේශීය දේශපාලඥයින්ගේ මැදිහත්වීම නිසා ඔවුන්

7 විශේෂඥ වෛද්‍ය ආරියසේන යූ. ගමගේ මහතාගෙන් ලැබුන තොරතුරකි. එතුමා සංචාරකයන්ට සහ පාසල් දරුවන්ට සරදියෙල් සහ එම කාල පරිච්ඡේදය ගැන දැනුවත් කිරීම සඳහා "සරදියෙල් ගම්මානය" නිර්මාණය කරන ලදී.

මේ ගැටුම සමතයකට පත්කිරීමට ප්‍රමාදවීම හෝ ඒ පිළිබඳව කඩිනම් විමර්ශනයක් කිරීම මඟහැරියේ යැයිද මුස්ලිම් පාර්ශවයෙන් චෝදනා එල්ලවිය. කෙසේවෙතත් මේ ඇතිවූ වාර්ගික ආතතිය සිංහල සහ මුස්ලිම් ප්‍රජා සහ ආගමික නායකයින්ගේ මැදිහත්වීමෙන් ක්‍රමයෙන් සමතයකට පත්කරනු ලැබීය.

උද්ගතවූ උක්ත කෝලාහලය හුදෙක් මුස්ලිම් ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාරික අභිලාෂයන් සහ ඒ අනුව මුල්බැසගත් සුළු ජාතික (මුස්ලිම්) ආර්ථික අධිකාරය සහ වෙළඳපොල අත්කර ගැනීමේ සිංහල ප්‍රතිවාදීත්වය අතර බල අරගලයේ ප්‍රකාශනයක් වුවත්, මේ ගැටුම සමතයකට පත්කර ප්‍රදේශයේ සාමය යළි ස්ථාපිත කිරීමට ප්‍රජාවන් දෙකෙහිම ආගමික නායකයින්ගේ මැදිහත්වීම සහ බාහිරින් ගෙන්වන ලද ආරක්ෂක හමුදාවන්ගේ මැදිහත්වීමද උපකාරී විය. ආර්ථික සහ දේශපාලනික ක්ෂේත්‍ර තුළින් මතුවන වාර්ගික ආතතීන් සමතයකට පත්කර ගැනීමට ප්‍රදේශයේ අතීතයේ සිට පටන් පැවති බහු සංස්කෘතික සහ බහු-ආගමික උරුමයන්ගේ සංචිතය සහ අන්තර්වාර්ගික සමාජ සම්බන්ධතා "පාලම්" උපකාරී වූ බව කියාපාන කදිම උදාහරණයක් වශයෙන් මේ සිද්ධිය හඳුන්වාදිය හැකිය.

කෙසේවෙතත්, දෙවනගල ඇතිවූ සිද්ධියේදී ප්‍රදේශයේ තිබු සිංහල-මුස්ලිම් සම්බන්ධතා දෙපාර්ශවයේම සංස්කෘතික පාරිශුද්ධකරණ කිරීමේ උත්සාහයන් හරහා නව පරිච්ඡේදයකට යොමු විය. බාහිරින් පැමිණි බෞද්ධ සහ ඉස්ලාම් ආගමික ක්‍රියාකාරිකයින්ගේ පෙළඹවීම මෙයට හේතුවිය. බොදු බල සේනා (BBS) සංවිධානය සහ ඒ හා සමාන අනෙකුත් බෞද්ධ සංවිධාන බෞද්ධාගමික පැත්තෙන් සංස්කෘතික පාරිශුද්ධකරණයක් සඳහා බලපෑම් කළ අතර ඉස්ලාමීය පැත්තෙන් ශ්‍රී ලංකා තව්හීඩ් ජමාත් (SLTJ) සංවිධානය ආක්‍රමිකශීලි සංස්කෘතික පාරිශුද්ධකරණයක් සඳහා ඉදිරිපත්වූ බව පෙනේ. මෙවන් බාහිර ක්‍රියාකාරිකයින් විසින් සිදුකරන බලමුළු ගැන්වීම් කෙරෙහි අප දැඩි අවධානයක් යොමුකළ යුතු වන්නේ ඒවා ප්‍රදේශයේ මේ දක්වා පැවති ශක්තිමත් බහු-සංස්කෘතික උරුමයන් දෙපලූ කිරීමේ විභවතාවයකින් යුතු නිසාය.

BBS සහ එයට සෘජුවම සහ වක්‍රව සම්බන්ධ තවත් සංවිධාන තුනක් එනම්, "සිංහල රාවය", "මෛත්‍රී සහන පදනම" සහ "පැරකුම් සේනා" යන සංවිධාන 2012 සිට දෙවනගල ඇතිවූ අර්බුධකාරී තත්වයට මැදිහත් වීමට පටන්ගත්තේය. කොළඹ සහ ඒ අවට ප්‍රදේශවලින් මාවනැල්ලට පැමිණි මේ අය ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේලාට සහ ගිහියන්ට බලකර සිටියේ දෙවනගල ආශ්‍රිත පුරාවිද්‍යා රක්ෂිත ප්‍රදේශයේ පදිංචිව සිටින සිංහල-බෞද්ධ ප්‍රජාව හැර මුස්ලිම් ප්‍රජාවට එම ප්‍රදේශයෙන් ඉවත්වන ලෙස අණකිරීමට අදාළ බලධාරීන්ට බලපෑම් කරන ලෙස ය.

1876 තරම් ඈත කාලයකදී කරන ලද ඉඩම් මැනීමක් ගෙනහැර දක්වමින් "මෛත්‍රී සහන පදනම" නිර්දේශ කරන්නේ දෙවනගල පූජා අඩවියට අයත් ප්‍රදේශය සැබවින්ම හෙක්ටයාර් 28.5 ක් විය යුතු බවය. "දෙවනගල සුරැකීමේ ජාතික ව්‍යාපාරය" නමින් පිහිටුවා ගන්න ලද සංවිධානයක් මාධ්‍ය ප්‍රකාශයක් නිකුත් කරමින් කියා සිටියේ දෙවනගල බෞද්ධ පූජාභූමිය මුස්ලිම් ප්‍රජාව විසින් ආක්‍රමණය කර ඇති බවය. ප්‍රදේශයේ බෞද්ධ සහ මුස්ලිම් ජනතාව අතර බෙදා හරිනු ලැබූ නිර්නාමික අත්පත්‍රිකාවක මෙසේ සඳහන් වී තිබුණි. "ගව ඝාතනයේ යෙදෙන, ගවමස් බුදින, පව්කාර මුසල්මානුවන් වහාම දෙවනගල පූජාභූමියෙන් ඉවත්විය යුතුය". මේ අත්පත්‍රිකාවේ ම සඳහන් වූ තවත් ඉල්ලීමක් වූයේ, තම ජාතික උරුමයන් ආරක්ෂා කර ගැනීම සඳහා සියලූ දේශප්‍රේමී සිංහල-බෞද්ධ ජනතාව තම ජීවිත පූජා කිරීමට වුවත් සූදානම් විය යුතු බවය. මෙවන් අදහස් සහ ප්‍රකාශයන් වලට මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන්ගේ මෙන්ම ෆේස් බුක් සමාජ වෙබ් ජාලයේද පුළුල් ප්‍රචාරයක් ලැබුණි.

මෙවන් ප්‍රචාර සහ කටකතා මගින් මුස්ලිම්වරු සෑම තැනකම පල්ලි ඉදිකරමින් යන බවත්, ඉඩම් මංකොල්ල කෑමේ යෙදෙන බවත්, සිංහල කාන්තාවන්ට ලිංගික අතවර කරන බවත් සහ උපත් පාලන රසායනික ද්‍රව්‍යයක් අලේප කරනලද කාන්තා යට ඇඳුම් සිංහල කාන්තාවන්ට විකුණන බවත් ප්‍රචාරය කරන ලදී. එමගින් මුස්ලිම් ප්‍රජාව තම ආර්ථික ආධිපත්‍යයට අමතරව මැදපෙරදිගින් ලැබෙන මුදල් ආධාර[8] යොදා ගනිමින් නව මුස්ලිම් පල්ලි ඉදි කරමින් "සංස්කෘතික ආක්‍රමණයක" නියැලෙන බව සිංහල ජනතාවට ඒත්තු ගැන්වීමට උත්සාහ කළහ.

විවිධ "බලපෑම් කණ්ඩායම්" වල බලපෑම මත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2013 දී දෙවනගල මතබේදයට තුඩුදී ඇති භූමි ප්‍රදේශය සමීක්ෂණයකට භාජනය කරන ලදී. එහිදී කළ සොයාගැනීම් පිළිබඳ වාර්තාව පිළියෙළ කිරීමේදී අදාළ භූමි ප්‍රදේශයේ පදිංචි සිංහල සහ මුස්ලිම් ජනතාවගෙන් කිසිදු කරුණු විමසීමක් සිදු නොකළ අතර එම වාර්තාවෙන් නිර්දේශ කරනු ලැබුවේ දෙවනගලට අයත් සම්පූර්ණ භූමි ප්‍රදේශය හෙක්ටයාර 28.5 වන පරිදි සලකුණු වියයුතු අතර එම සලකුණු කළ ප්‍රදේශය තුළ ජීවත් වන සියලූම සිංහල සහ මුස්ලිම් පවුල් එම ස්ථානයෙන් ඉවත්කර වෙනත් ස්ථානයක යළි පදිංචි කළයුතු බවය. මෙම වාර්තාව BBS ඇතුළු ඒ හා අනුබද්ධිත අනෙකුත් සංවිධාන වලටද නිකුත්කළ අතර ඔවුන් එය තමන්ගේ ස්ථාවරය තවත් ශක්තිමත් කරගැනීමට උපයෝගී කරගත්හ. තවද එම වාර්තාවේ මුස්ලිම් සහ සිංහල පවුල් ඉවත්කළ යුතුයැයි පැහැදිලිව සඳහන් කර ඇති නමුත්, මුස්ලිම් පදිංචිකරුවන් පමණක් දෙවනගල ප්‍රදේශයෙන් ඉවත් කිරීමේ ඔවුන්ගේ ප්‍රයත්නය ඉදිරියට ගෙනයාම සඳහා මෙම සංවිධාන මෙකී පුරාවිද්‍යා වාර්තාව උපයෝගී කරගත්තේය.

8 බොදු බල සේනා සංවිධානයේ ප්‍රචාරක කටයුතු වලදී කට කතා සහ මුහුණු පොත වැනි මාධ්‍ය වැදගත් වන අයුරු අවබෝධ කරගැනීම සඳහා බලන්න (Silva 2016).

දෙවනගල ප්‍රදේශයේ ඇති බෞද්ධ විහාරස්ථාන දෙකක නායක ස්වාමීන් වහන්සේ දෙනම BBS සංවිධානය මගින් සම්පූර්ණයෙන් වාගේ ඔවුන්ගේ මතවාදයට අනුගත කරගෙන තිබුණි. දෙවනගල විහාරස්ථානය භාර නායක ස්වාමීන් වහන්සේ ලෙස ඉදිරිපත් වූ අඹතලාවේ සංඝරතන ස්වාමීන් වහන්සේ දෙවනගල පූජා භූමියේ අයිතිය තම පන්සල සතු බව ප්‍රකාශ කළ අතර පිට පළාතකින් පැමිණ අසල පන්සලක නායකත්වය දරමින් සිටි මැදිරිගිරියේ පුණ්‍යසාර ස්වාමීන් වහන්සේ ද සංඝරක්කිත ස්වාමීන් වහන්සේට සහයෝගය පළකළේය. මෙම පුණ්‍යසාර ස්වාමීන් වහන්සේ 2015 පාර්ලිමේන්තු මැතිවරණයට BBS සංවිධානයෙන් තරග කළ අතර ඔහුට ලබාගත හැකිවූයේ ඡන්ද 500ක් පමණකි. දෙවනගල පර්වතයේ ස්ථානගත කර සිටි සිවිල් ආරක්ෂක භටයින් සහ මෙම භික්ෂූන් වහන්සේලාට පක්ෂපාති සිංහල බෞද්ධ තරුණ පිරිස් බොහොමයක් ගේ සහාය ඇතිව මෙම භික්ෂූන් වහන්සේ දෙනම දෙවනගල සහ අවට සිදුවන දේ, විශේෂයෙන් මුස්ලිම් ප්‍රජාවේ අය නව ඉදිකිරීම් කිසිවක් කරන්නේදැයි යන්න ගැන ඉතා සුපරික්ෂාකාරී වූහ. මේ භික්ෂූන් වහන්සේ දෙනම අතීතයේ මෙන් මුස්ලිම් ජාතිකයින්ගෙන් දානය හෝ වෙනත් කිසිඳු උපකාරයක් ලබා ගැනීම ප්‍රතික්ෂේප කළෝය. මෙය පැහැදිලිවම මුස්ලිම් ප්‍රජාවත් සමඟ දුරස්ථ බවක් ඇති කර ගැනීමේ උත්සාහයකි. තවද මේ පිරිස BBS උපදෙස් අනුව යමින් මුස්ලිම් වෙළඳසැල් සමඟ ගනුදෙනු කිරීම පවා අත්හැර දැමූහ.

මේ පිරිස, අතීතයේදී කළ පරිදි, අවට පරිසරය නැරඹීම සඳහා දෙවනගල පර්වතයට නැගීමට ප්‍රදේශයේ මුස්ලිම් අයට සහ නාඳුනන පිටස්තර අයට ඉඩ දුන්නේ නැත. මුස්ලිම් නිවසක සලකුණු කරන ලද සීමාවේ පිහිටි නව ඉදි කිරීමක් පටන්ගත් වහාම BBS සංවිධානයට අයත් පිරිස ඒ පිළිබඳව පොලිසිය දැනුවත් කළ අතර පොලීසිය ඉතා කඩිනමින් එම ප්‍රදේශයේ නව ඉදිකිරීම් තහනම් කරමින්, මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් නිකුත් කළ චක්‍ර ලේඛනය අනුව යමින්, එම ඉදිකිරීම් වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිට වූහ. වෙනත් වචන වලින් කියතොත්, BBS සහ අනෙකුත් එවන් බෞද්ධ සංවිධානය මගින් "උසිගන්වනු" ලැබූ මේ ප්‍රාදේශීය බෞද්ධ ක්‍රියාකාරීන්, මුස්ලිම්වරු දෙවනගල පූජා භූමියට අයත් ඉඩම් බලෙන් අල්ලාගත්තේ යයි චෝදනා කරමින් එයට එරෙහිව වාර්ගික ධර්ම යුද්ධයක් මෙහෙයවන්නන් බවට පත්වූහ.

යම් අඩවියක් පුරාවිද්‍යාත්මක හෝ පූජනීය අඩවියක් වශයෙන් රජය විසින් ප්‍රකාශයට පත් කිරීම නිසා එම ප්‍රදේශය ආශ්‍රිතව පදිංචි වී සිටින වාර්ගික සහ ආගමික සුළුතර ප්‍රජාවන්ට අලුත් ගැටළු වලට මුහුණ දීමට සිදුවේ. මෙය 1942 දී පූජනීය අඩවියක් වශයෙන් ප්‍රකාශයට පත්කළ අනුරාධපුර පූජනීය භූමියෙන් (Nissan 1989), 1963 දී ප්‍රකාශයට පත්කරන ලද කතරගම පූජා භූමියෙන් (Pfaffenberger 1979), සහ 1973 දී ප්‍රකාශයට පත්කරනලද දීඝවාපී පූජා භූමියෙන් (Spencer et al. 2015) වාර්තා වී ඇත.

යම් ස්ථානයක් පූජා භූමියෙන් වශයෙන් පිළිගනිමින් රජයෙන් නිකුත් කරන නිවේදනය සමහර සිංහල-බෞද්ධ ක්‍රියාකාරීන් පමණක් නොව සමහර රාජ්‍ය ආයතන පවා අර්ථකථනය කරනු ලබන්නේ එම අදාළ ප්‍රදේශයේ සිංහල-බෞද්ධ නොවන සියළු ජනතාව එම ප්‍රකාශිත අඩවියෙන් ඉවත් කිරීමට දෙන ලද නියෝගයක් ලෙසටය. ස්පෙන්සර් සහ අනෙකුත් අය (Spencer et al. 2015) තර්ක කරන ආකාරයට "පූජනීය"යන්න ව්‍යංගාර්තයෙන් සිංහල-බෞද්ධයින් සතු" ලෙස හඳුන්වාගනු ලබන අතර එවිට පිටස්තරයන් වන්නේ සිංහල බෞද්ධ නොවන අයයි (2015: 84). මෙම තත්වය මේ රචනාවේ කලින් සඳහන් වූ පරිදි, ඓතිහාසික පූජාභූමි අවට තිබූ බහු-ආගමික හෝ බහු සංස්කෘතික චර්යා රටාවට ඉඳුරාම පටහැනිය. මේ ආකාරයට යම්කිසි ස්ථානයක් පූජා භූමියක් ලෙස නම්කිරීමේ දී බොහෝවිට එම අදාළ ප්‍රදේශයේ එතෙක් ජීවත්වූ බෞද්ධ නොවන ජනතාව සහ බෞද්ධ නොවන ආගමික සිද්ධස්ථාන සහ ආයතන වෙනත් ප්‍රදේශයක යළි ස්ථාපිත කිරීම රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුවන "වාර්ගික ශුද්ධකරණයක්" ලෙස සැළකිය යුතුය.

මේ ආකාරයෙන් "පූජනීය" හෝ "පුරාවිද්‍යාත්මක" යන වචන භෞතික අවකාශ සීමා තුළ ආගමික පාරිශුද්ධකරණය සඳහාවූ සැකිල්ලක් සපයන, ආවේගකාරී ප්‍රබන්ධයන් බවට පත්වේ. මෙහිදී අප සැලකිල්ලට ගතයුතු කාරණයක් වන්නේ මේදක්වා නිල වශයෙන් පූජා භූමි වශයෙන් නම්කරනු ලැබ ඇත්තේ වැඩිවශයෙන්ම බෞද්ධාගමික වැදගත්කමකින් යුතු පූජනීය ස්ථාන වන බවයි. මෙයින් පැහැදිලිව ගම්‍ය වන්නේ රාජ්‍යයේ බහු ආගමිකත්වය හුදෙක් ආටෝපයක් පමණක් බවත් මෙවන් තීරණ ගැනීමේදී රාජ්‍යය මේ පූජනීය ස්ථානවලට ආවේනිකවූ ඓතිහාසික බහු-ආගමික උරුමයන් නොසලකා හරිමින් ජාතිකවාදී සිංහල-බෞද්ධ උවමනාවන් කෙරෙහි පක්ෂපාතිත්වයක් දක්වන බවත්ය.

දෙවනගල ප්‍රදේශයේ ජීවත්වන මුස්ලිම් ජනතාව මේ ඇතිවූ ප්‍රවණතා වලින් මහත් සේ අපහසුතාවයකට පත්විය. ඔවුන්ට දැනුනේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල (CCF), ආරක්ෂක හමුදාවන්, සහ BBS සංවිධානයේ පෙළඹවීම මත ප්‍රාදේශීය භික්ෂුන් වහන්සේලා යන සෑම පාර්ශවයකින්ම ඔවුන්ව "ආක්‍රමණය" කිරීම නිසා ඔවුන් "කොටුවී" ඇති බවකි. ඔවුන් මේ ගැන කියන කතාවලින් පැහැදිලි වන්නේ (ඇමිණුම 1 බලන්න) ඔවුන්ව මේ ස්ථානයෙන් පළවා හැරීමට ඉදිරිපත් වී ඇති උත්සාහයත්, ඔවුන්ගේ එදිනෙදා වැඩකටයුතු බෞද්ධ ක්‍රියාකාරීන්ගේ සහ දෙවනගල සංරක්ෂණය සඳහාවූ රාජ්‍ය ආයතන වල නිරන්තර අධීක්ෂණයට භාජනය වීමත් නිසා ඔවුන් සිරගතවූවාක් වැනි හැඟීමකින් පීඩාකාරී තත්වයකට පත්වී ඇති බවයි. එක මුස්ලිම් අයෙක් අප සමඟ මෙලෙස පැවසීය "අපට පැලයක් සිටුවීමටවත් ගෙවත්තේ වලක් හෑරීමට පවා බියක් තියනවා, එහෙම හාරන වලකින් යම් පුරා වස්තුවක් හමුවුවහොත් එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ප්‍රදේශයේ කටයුතු වලට මැදිහත් වීමට තවත් හේතුවක් වේවි". තවත් මුස්ලිම් අයෙක් කියාසිටියේ "මේක මේ විදිහට ගියොත්, මීටර 400 රක්ෂිතය ස්ථාපිත කළ දවසක අපිට

අපේ භූමිදානයක් වත් කරගන්න බැරිව යනවා" යනුවෙනි. ඔවුන්ට පනවා ඇති සීමාවන් ගැන සඳහන් කරමින් මුස්ලිම් කාන්තාවක් මෙසේ කියාසිටියේය, "වැටහිරියා (හෝ ගිනිසීරියා) අත්තක් කපා ගන්න එක පවා දැන් දුෂ්කරයි, එහෙම කළොත් කවුරුන් හෝ 119 වලින් පොලීසියට දුරකථන ඇමතුමක් දුන් විගස පුරාවිද්‍යාවේ අය මෙහාට එනවා. අපි පූජා වස්තු අඩවියට කිසි හානියක් කරන්නේ නැහැ. අපිට අවශ්‍ය අපිට අයත් ඉඩමේ සැනසිල්ලේ ජීවත්වෙන්න. අපිට ඔප්පු සහ අනෙකුත් අවශ්‍ය ලියකියවිලි තියෙනවා, අපි ජීවත්වන ඉඩම් සහ නිවාස අපිට නිත්‍යානුකූලව අයිතියි". තවදුරටත් ඔවුන් සඳහන් කළේ මීට පෙර ඔවුන් සමඟ ඉතා සුහදශීලිව ජීවත්වූ සිංහල ජනතාව දැන් ඔවුන් ගේ ඉඩම් අල්ලා ගැනීමට ඔවුන් පලවා හරින තෙක් කල් බලමින් සිටින බවයි. මේ නිසා ඔවුන්ගේ නිත්‍යානුකූල දේපළ හිමිකම් රැකගැනීම සඳහා ප්‍රාදේශීය මුස්ලිම් නායකයින්ගේත්, දේශපාලඥයින්ගේත් සහාය ඉල්ලා ඇත.

ප්‍රදේශයේ ඇතිවී තිබෙන මේ ආතතිය සමනය කිරීම සඳහා සාමය ප්‍රවර්ධනය කිරීම සඳහා මාවනැල්ල ජනතා මිත්‍රත්ව සංගමය (Mawanella Friendship Association - MFA) නමින් සංවිධානයක් ප්‍රදේශයේ මධ්‍යස්ථ මුස්ලිම් සහ සිංහල නායකත්වයන් විසින් පිහිටුවාගෙන ඇත. මෙම සංවිධානය දෙවනගල සම්බන්ධව ඔවුන්ගේම පර්යේෂණයක් කර ඇති අතර එමගින් රැස්කරගත් කරුණු අනුව ඔවුන් තර්ක කරනු ලබන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් නිකුත්කළ වාර්තාවේ ඇති හෙක්ටයාර 28.5 වූ ඉඩම පිහිටා ඇත්තේ රුවන්දෙනිය ගමේ මිස දෙවනගල නොවන බවයි (ගමගේ 2014). මෙම මාවනැල්ල මිත්‍රත්ව සංවිධානය මහා සංඝ රත්නය සහභාගී කරගනිමින් මුස්ලිම් ආගමික නායකයින් සමඟ සාකච්ජාමය විසඳුමකට එළඹීමට උත්සාහ ගත්තද 2015 වනවිටත් එවැනි විසඳුමක් කරා ළඟාවීමට නොහැකි වී ඇත. මේ අතරතුර MFA සංවිධානය BBS සංවිධානයේ බලවත් විවේචනයකට ලක්විය. BBS සංවිධානය මගින් MFA සංවිධානය හා සම්බන්ධ ප්‍රජා නායකයින් සැවොම සිංහල ජාතියට ද්‍රෝහිවූ පිරිසක් වශයෙන් හඳුන්වා දෙනු ලැබිය.

මේ කාලයේදී ප්‍රදේශයේ සිංහල ප්‍රජාව අතර පැතිරුණු සමහර කටකථා වලින් කියැවුනේ මුස්ලිම් ජනතාව දෙවනගල පුපුරුවා හැරීමට සැලසුම් කරමින් සිටින බවය. පර්වතයේ ඉරිතැලීගිය සමහර තැන්වල වූ යම් සුදුපාට ද්‍රව්‍යයක් මේ පර්වතය පුපුරුවා හැරීමේ මුස්ලිම් උත්සාහයේ සාක්ෂි ලෙස ඔවුන් ඉදිරිපත් කළෝය. මාවනැල්ල මිත්‍රත්ව සංවිධානය මේ කරුණ සම්බන්ධයෙන් භූ විද්‍යාඥයෙකු ගේ උපදෙස් විමසූ අතර ඔහු කියාසිටියේ එම සුදුපාට ද්‍රව්‍යය මෙවන් පර්වතවල ඉරිතැලීම් තුළ සාමාන්‍යයෙන් දක්නට ලැබෙන දෙයක් බවය.

ප්‍රදේශයේ සමහර මුස්ලිම් අය දෙවනගලට අයත් සඳකඩ පහන් ගෙනගොස් තමන්ගේ නිවෙස් ඉදිරිපිට තබාගෙන සිටින බවට කතාවක්ද අසන්නට ලැබුණි (බෞද්ධ භික්ෂුවක් සමඟ කළ පුද්ගලික සාකච්ජාවකිනි). BBS සංවිධානය මගින් එල්ල කරන චෝදනා වලට, එතරම් ආක්‍රමණශීලි නොවන එහෙත් ඍජු, ප්‍රතිචාරයක් කොළඹ පදනම් කරගත් මුස්ලිම් පුනරුද සංවිධානයක් වන ශ්‍රී ලංකා තව්හීඩ් ජමාත් සංවිධානයෙන් (SLTJ) ලැබිණි. ඔවුන් BBS සංවිධානය විසින් එල්ල කරනලද චෝදනා වලට ප්‍රතිචාර දැක්වීම සඳහා 2015 සැප්තැම්බර් මාසයේදී දෙවනගලට නුදුරින් පිහිටි හෙම්මාතගම නගරයේ රැස්වීමක් සංවිධානය කළෝය. මෙම රැස්වීමට BBS සංවිධානයේ ප්‍රාදේශීය නායකයන් වූ භික්ෂූන් සහ ගිහියන් බලෙන් ඇතුල්වී, එහි සිටි මුස්ලිම් නායකයින්ට පරිභව කළ අතර ඔවුන් එම ආක්‍රමණිකයන් විසින් එහි විකිණීම සඳහා තිබූ ප්‍රචාරක කෘති බලෙන් පැහැර ගන්නා ලදී. මෙම සිද්ධියේ ප්‍රතිඵලයක් වශයෙන් "SLTJ සංවිධානය විසින් BBS සංවිධානයට එරෙහිව පැමිණිල්ලක් ඉදිරිපත්කිරීම සඳහා හෙම්මාතගම පොලිස් ස්ථානයට ගිය නමුත් එහිදී පොලීසිය විසින් පැමිණිල්ලක් දැමීමෙන් ප්‍රදේශයේ මුස්ලිම් නායකත්වය අයහපත් ප්‍රතිඵල වලට මුහුණදීමට ඉඩ ඇති බැවින් එවැනි පැමිණිල්ලක් ඉදිරිපත් නොකරන මෙන් ඔවුනට අවවාද කළ බැවින් SLTJ නායකයන් විසින් කොළඹ පොලිස් මුලස්ථානයේ පැමිණිල්ලක් ගොනුකළ අතර ඔවුන් එම නඩුව කෑගල්ල පොලිස්ස්ථානයට මාරු කරන ලදී. කෑගල්ල පොලීසිය මේ ආරවුල අධිකරණයෙන් බාහිරව විසඳා ගන්නා මෙන් දෙපාර්ශවයම උනන්දු කළේය.

ආර්. අබ්දුල් රසික් නම් ව්‍යක්ත තරුණ වාණිජ විද්‍යා උපාධිධාරියෙකුගේ නායකත්වයෙන් 2012 සිට ක්‍රියාත්මක වූ SLTJ සංවිධානය ඉස්ලාමීය පුනර්ජීවනය සඳහා කැපවුණු සංවිධානයකි. තවද එය ඉස්ලාම් ධර්මයට එරෙහිව අනෙකුත් ආගම් වල ප්‍රතිවාදීන් එල්ල කරන චෝදනා වලට ඍජුව ප්‍රතිචාර දැක්වීමේ නිරතවන සංවිධානයකි. මුලාරම්භයේදී ඉන්දියාවේ මුස්ලිම් පුනරුද ව්‍යාපාරයක ආභාෂයෙන් බිහිවූ මෙම SLTJ සංවිධානයේ උවමනාව වූයේ ශාන්තුවරුන් වන්දනාව, යන්ත්‍ර මන්ත්‍ර, සහ අනෙකුත් එවැනි ගුප්ත විශ්වාසයන් වැනි ඉස්ලාමීය නොවන ඇදහීම් වල බලපෑමට ලක්වූ ඉස්ලාම් ආගම එම බාහිර බලපෑම් වලින් පිරිසිදු කොට මූලධර්මවලට අනුව ප්‍රතිසංවිධානය කිරීමය.

මෙම රචනාවේ ප්‍රධාන කතුවරයා සමඟ 2015 ඔක්තෝබර් මාසයේ පැවති සම්මුඛ සාකච්ජාවකදී සුෆි ඇදහීම් සමඟ බැඳුනු "ශාන්තුවරුන් වන්දනාව" රසික් හඳුන්වාදෙන ලද්දේ කුරානයේ කිසිඳු පදනමක් නැති සොහොන් වැඳීමේ සම්ප්‍රදායක් අනුගමනය කිරීමක් වශයෙනි. SLTJ සංවිධානය දිවයිනේ දිස්ත්‍රික්ක 15ක ශාඛා72 කින් සමන්විතවන අතර තරුණ කොටස් ඔවුන්ගේ මද්රාසා වලදීම පුහුණු කිරීම, ඉස්ලාමීය පුනරුදයක් සඳහා ප්‍රචාරක වැඩ කටයුතු, ශුභසාධන ආධාර දීම, සහ මාධ්‍ය කටයුතු යනාදී විවිධ ක්ෂේත්‍ර වල ක්‍රියාත්මක වේ."SLTJ සංවිධානය විසින්, නිවැරදි ඉස්ලාම් ධර්මය කුමක්ද යන්න මුස්ලිම්

ජනතාවට මෙන්ම බෞද්ධ සහ හින්දු ජනතාවටද වටහාදීම සඳහා වූ ව්‍යාපාරයක් දියත් කොට තිබූ අතර එහි ප්‍රකාශිත ප්‍රධාන අරමුණ වූයේ BBS වැනි නොයෙකුත් සංවිධාන මගින් ඉස්ලාම් ධර්මය ගැන වැරදි කරුණු ඉදිරිපත් කරමින් අන්‍ය ආගමික ජනතාව නොමඟ යැවීම පරාජය කිරීමයි.

මේ අනුව බෞද්ධ සහ ඉස්ලාම් ආගම් දෙකෙහිම පුනරුදවාදීන් උත්සාහ කරන්නේ ඔවුන් ගේ ආගම් ඇතුළතින් පිරිසිදු කිරීමටය. මේ පිරිසිදු කිරීමේ උත්සාහයන්වල මූලික උපායමාර්ගයක් වන්නේ අනෙකුත් ආගමික සම්ප්‍රදායන් වලින් උකහා ගන්නා ලද කොටස් ඉවත් කොට තම ආගම ශෝධනය කිරීමය. නමුත් ආගම් අතර සහජීවනය සඳහා සුදුසු වාතාවරණයක් සලසන්නේද ආගම් අතර සංකලනය හෝ සම්මිශ්‍රණය තුළින්ය. මේ ආගම් පාරිශුද්ධකරණ ක්‍රියාවලිය ඒ ඒ ආගම් ඇතුළතින්ම පැනනගින "අභ්‍යන්තර මත ගැටුම්" වලද ප්‍රකාශනයකි. උදාහරණයක් වශයෙන් ඉස්ලාම් ආගම තුළ වහබි ප්‍රතිසංස්කරණවාදීන් සහ සූෆි අනුගාමිකයන් අතර මත ගැටුම පෙන්වාදිය හැකිය.

BBS සංවිධානයත් මෙවැනිම අර්ථයකින් ප්‍රතිසංස්කරණවාදී ස්වරූපයක් ගන්නා අතර ඔවුන් භික්ෂූන්ගේ ශාසන විරෝධි ක්‍රියා ප්‍රසිද්ධියේ විවේචනය කොට එවැනි ශාසනයට අපහාස වන සමාජ විරෝධී ක්‍රියාවල නිරත භික්ෂූන්ගේ සිවුරු ගලවා ශාසනයෙන් නෙරපීමටත් කටයුතු කළහ. කෙසේ හෝ ආගමක "පවිත්‍රකරණය" සඳහා වන කවර හෝ උත්සාහයක් වුවද සාර්ථකවීම තුළ ආගමික බහුත්වය සහ ඒ හා අනුබද්ධිත, අන්තර් ආගමික සහජීවනයට අභියෝග ඇතිවිය හැකිය.

මීට කලින් ප්‍රදේශයේ ඇතිවූ ආර්ථික හෝ දේශපාලනික හේතුන් නිසා ඉස්මතුවූ, වාර්ගික ආතතීන් ආගමික නායකයින්ගේ මැදිහත්වීමෙන් සමතයකට පත්වීමත් සමඟ සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන් අතර පැවති විශ්වාසනීයත්ව සංචිතය අවසානයේ නැවත ගොඩනගනු ලැබුවත්, දෙවනගල ඇතිවූ සිද්ධිය මගින් ආගමික මායිම් ඔස්සේ ප්‍රජාව ධ්‍රැවිකරණය කිරීමට සමත් වූයේ යැයි කිව හැකිය. මේ ගැටලු හෝ ගැටුම්කාරී තත්වයන් සමතයකට පත් කිරීමට රාජ්‍යයට නොහැකි වීමට හේතුවූ ප්‍රබලතම බාධාව වූයේ එහි වූ පක්ෂපාතීත්වයන් සහ පොලීසිය වේවා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වේවා මේ කවරෙක් ගැන කතාකළත් එම අංශවල පැහැදිලිව පෙනෙන්නට තිබූ මධ්‍යස්ථ බවේ අඩුවයි.

මුස්ලිම් ප්‍රජාවට හැඟීගියේ දෙවනගල පුරාවිද්‍යා වටිනාකමකින් යුත් අඩවියක් ලෙස ප්‍රකාශකිරීමේදී මෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ පොලීසියේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදීත් මුස්ලිම් ජනතාවගේ නිත්‍යානුකූල ඉඩම් අයිතීන් සහ දීර්ඝ කාලීන පදිංචිය නොසලකා හරිමින් ඔවුන් ප්‍රදේශයෙන් පළවා හැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වී ඇති

බවයි. ඇමිණුම් 1 හි ඉදිරිපත් කර ඇති දෙවනගල පර්වතය අවට මුස්ලිම් පදිංචිකරුවන්ගේ ප්‍රතිචාර වලින් මෙය පැහැදිලිවේ.

## කුරුණෑගල ගලේබණ්ඩාර ඇදහිල්ල

මතුපිටෙන් පෙනෙන ආකාරයට ගලේබණ්ඩාර වන්දනාව බෞද්ධ සහ මුස්ලිම් ආගමිකයන්, සිංහල-මුස්ලිම් මිශ්‍ර සම්භවයක් සහිත දෙවිකෙනෙක් වන්දනා කිරීම සඳහා එකට එක්වන "සංකලන ආගමක්" වශයෙන් කෙනෙකුට වැටහිය හැකිය. එසේ නමුත්, සැබෑ තත්වය එයට වඩා බොහෝ සෙයින් සංකීර්ණය. විවිධ පැතිකඩයන්ගෙන් සමන්විතය. මෙයින් සමහරක් මේ ඇදහිල්ල ආශ්‍රිතව යම්තාක් දුරකට බෞද්ධ සහ මුස්ලිම් බැතිමතුන් අතර සහයෝගයක් පෙන්වන නමුත් වෙනත් පැතිකඩ මගින් මේ ආගම් දෙකෙහි අනුගාමිකයන් අතර ඇති පරස්පර විරෝධී අදහස් සහ එකිනෙකා කෙරෙහි ඇති අවිශ්වාසය පෙන්නුම් කරයි.

සමස්තයක් වශයෙන් ගලේබණ්ඩාර ඇදහිල්ල, මීට කලින්ද මේ රචනාවේ සඳහන් කළ පරිදි, ආගමකට ඇති ද්විත්ව ස්වරූපය ප්‍රබලව නිරූපණය වන අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. අප දැන් මේ ඇදහිල්ල ගැන සවිස්තරව සලකා බලමු.

ගලේබණ්ඩාර ඇදහිල්ල සිංහල-බෞද්ධ දේව ඇදහිලි අතුරෙන් බණ්ඩාර ඇදහිලි ගණයට අයත්වේ. මුස්ලිම් ජාතිකයින්ට ගලේබණ්ඩාර යනු "අව්ලියර්" වරයෙක් හෙවත් යම් ප්‍රවර්ග යකට අයත් ශාන්තුවරයෙකි. මේ ඇදහිල්ල කුරුණෑගල සහ මාතලේ ප්‍රදේශයන්හි සමහර බෞද්ධ සහ මුස්ලිම් ජනතාව අතර ප්‍රචලිතවී ඇත. සාමාන්‍යයෙන් බණ්ඩාර ඇදහිල්ලක් යනු ශ්‍රී ලංකාවේ දේව විශ්වාසයන්ට අනුව වඩා බලවත් සතරවරම් දේවතාවුන් ලෙස සැලකෙන ස්කන්ධ, නාථ, විෂ්ණු, සමන් සහ පත්තිනි (Obeyesekere 1966) යනාදී දෙවිවරුන්ට වඩා පහළ තලයකට අයත්, ප්‍රාදේශීය දෙවිකෙනෙකු වටා ගොඩනැගුන එම ප්‍රදේශයට ආවේනිකවූ ඇදහිලි සම්ප්‍රදායකි. බණ්ඩාර දෙවිවරුන් යනුවෙන් සාමාන්‍යයෙන් විශ්වාස කරනු ලබන්නේ යම් ප්‍රදේශයක ජීවත්වසිටි යම්කිසි විශේෂිත (ධනාත්මක හෝ ඍණාත්මක) බලපෑමක් කළා වූද, අයෙකු මරණින් පසු දේවාත්මයක් ලැබීමය.

සුෆි විශ්වාසයන්ට අනුව ශාන්තුවරු යයි ගැනෙන්නේ ජීවත්ව සිටියේදී මහත්වූ යහපත් ක්‍රියාවන් කළ නිසා අල්ලා දෙවියන් විසින් ඔවුන්ගේ මරණයෙන් අනතුරුව ශාන්තුවරුන් වශයෙන් හඳුනාගත් අයයි. මොවුන් ශාන්තුවරුන් වශයෙන් සලකනු ලබන්නේ, ඔවුන් අදහන කෙනෙකුට අවශ්‍ය අවස්ථාවන් හිදී මේ ශාන්තුවරුන්ගේ පිහිටෙන් අල්ලා දෙවියන්ගේ අනුග්‍රහය බලාපොරොත්තු වියහැකියයි විශ්වාස කරනු ලබන බැවිනි.

කුරුණෑගල නගර මධ්‍යයේ ඇතුගල පාමුල ඇති කඳු ගැටිත්තක ප්‍රධාන ගලේබණ්ඩාර දේවාලය පිහිටා ඇත. පාරම්පරික උරුමයෙන් මෙම දේවාලයේ වතාවත් කරන කපුවන් දෙදෙනෙක් සිටිති. ඔවුන්ගෙන් එක අයෙක් ගොවිගම කුලයේ වන අතර අනෙත් කෙනා බෙරවා කුලයේ අයෙකි. මේ දේවාලය ප්‍රදේශයේ ප්‍රධාන බෞද්ධ ආයතනයක් වූ ඇත්කඳ රජමහ විහාරයට යාබද මායිමේ පිහිටා ඇති අතර දේවාලය රජමහ විහාරයත් සමඟ ඉතා සුහදශීලි සම්බන්ධතාවයක් පවත්වයි. මෙම සිංහල-බෞද්ධ ගලේබණ්ඩාර දේවාලයට පාරම්පරිකව අයිතිවූ සමහර (ආදායම් ලැබෙන) ඉඩම් ඇති අතර දේවාලයට විවිධ සේවාවන් සපයන විවිධ කුලවලට අයත් පිරිස් මෙම ඉඩම් වල වාසය කරති. මෙම සිංහල-බෞද්ධ ගලේබණ්ඩාර දේවාලයට ඉතා නුදුරුව තවත් ගලේබණ්ඩාර දේවාලයක් ඇත. මේ දේවාලයේ වතාවත් කරන්නේ මුස්ලිම් කපුවන් දෙදෙනෙකි. මොවුන්ද පවසන්නේ ඔවුන් මේ දේවාලයේ පාරම්පරික භාරකරුවන් බවය. සිංහල ගලේබණ්ඩාර දේවාලයට මෙන් අදායම් ලැබෙන ඉඩම් කිසිවක් මෙම දේවාලයට අයත් නොවන නිසා මුස්ලිම් දේවාලය සම්පූර්ණයෙන්ම යැපෙන්නේ දේවාලයට ආශීර්වාද ලබාගැනීමට සහ අනෙකුත් අවශ්‍යතා ඉටුකරගැනීමට පැමිණෙන බැතිමතුන්ගේ ආධාර මතය. මෙම දේවාලය "සියාරම්" නමින් හඳුන්වන, එනම් ශාන්තුවරයකුගේ සොහොන්කොතක් සහිත, වන්දනා භූමියක් වූ සුෆි පූජා පවත්වන ස්ථානයකි. මෙම ස්ථානයේ සොහොන්කොත ගලේබණ්ඩාර "අව්ලියර්" නැතහොත් ශාන්තුවරයා වෙනුවෙන් ඔහුගේ සිරුර මිහිදන් කොට ඉදිකළ පූජනීය ස්ථානයක් ලෙස සැලකේ.

මේ සිංහල-බෞද්ධ සහ මුස්ලිම් දේවාල දෙකම ගලේබණ්ඩාර දෙවියන් වන්දනාව සඳහාම පමණක් කැපවූ දේවාල දෙකකි. සිංහල-බෞද්ධ දේවාලය වෙත පැමිණෙන බැතිමතුන් බහුතරයක් සිංහල අය වන නමුත් මුස්ලිම් බැතිමතුන් සැලකියයුතු සංඛ්‍යාවක්ද සිංහල-බෞද්ධ දේවාලයට ගලේබණ්ඩාර දෙවියන්ගේ ආශිර්වාද ලබාගැනීම සඳහා පැමිණේ. මේ දේවාල දෙකටම පැමිණෙන බැතිමතුන්ගෙන් වැඩිදෙනා කාන්තාවන් වන අතර විවාහයට සුදුසු සහකරුවෙක් ලබාගැනීම, දරුවෙකු ලැබීමේ අපේක්ෂාව, හෝ ස්වාමිපුරුෂයන් සමඟ ඇති ආරවුල් විසඳා ගැනීම යන කරුණු මේ කාන්තාවන් ගලේබණ්ඩාර දේවාලය වෙත පිහිට පතා පැමිණීමේ ප්‍රධාන හේතුන් වශයෙන් දැක්විය හැකිය. මෙම දේවාල දෙකෙන්ම ඉටුකරදෙනු ලබන තවත් ප්‍රධාන සේවාවක් නම් හොරුන් වැනි තමන්ට යම් හානියක් කළ අය අඳුනක් හෝ අංජනම් බැලීමක් වැනි ආකාරයකින් හඳුනාගෙන ඔවුන්ට පළිගැසීමටය.

වාර්ෂිකව සිංහල-බෞද්ධ දේවාලයේ පවත්වන උත්සව මාලාවක් තුළින් සශ්‍රීකත්වය සහ සෞභාග්‍යය තහවුරු කිරීමද ප්‍රදේශයේ ජනතාවට වැදගත් වේ. ජනවාරි පළවනදා කිරි ඉතිරවීම, අප්‍රේල් මාසයේ සිංහල සහ දමිළ අලුත් අවුරුදු නැකත් චාරිත්‍ර සැමරීම, මාර්තු මාසයේ පළමු සහල් මංගල්‍යය සහ රජමහ විහාරය සහ දේවාලය එක්ව අගෝස්තු මාසයේ පවත්වන වාර්ෂික පෙරහැර මෙම උත්සව මාලාවට ඇතුළත් වේ. මේ දේවාල දෙකෙහි

කුතුහලය දනවන, සිත්ගන්නා දෙයක් වන්නේ පොදුවේ එක දෙවිකෙනෙක් ගැන විශ්වාසය මත ක්‍රියාකරන ස්ථානයන් දෙකක් වුවත් පුද පූජා, වතාවත් සහ අනෙකුත් එම දෙවියන් උදෙසා කරන කිසිදු දෙයක් මෙම දේවාල දෙක එක්ව ඉටු නොකිරීමයි. මේ නිසා සිංහල-බෞද්ධ ගලේබණ්ඩාර දෙවියන් අදහන සම්ප්‍රදාය සහ මුස්ලිම් ගලේබණ්ඩාර "අව්ලියර්" නැතහොත් "ශාන්තුවරයා" අදහන සම්ප්‍රදායන් එකිනෙකට සමාන්තරව පවත්නා පැහැදිලි සීමා මායිමකින් වෙන්වී ඇති සම්ප්‍රදායන් දෙකක් වශයෙන් පවත්නා අතර බෞද්ධ සහ ඊට අඩු ප්‍රමාණයකින් මුස්ලිම් බැතිමතුන් තමන්ගේ උවමනාවන් සපුරා ගැනීම පිණිස මේ සීමා මායිම හරහා එහා මෙහා යති. මෙහි පවතින්නේ, Nancy Waxler (1984) විසින් වෙනත් සන්දර්භයක්දී භාවිතාවට ගන්නා ලද කියමනක් උපුටා ගන්නේනම්,"ආයතනික විභේදනය සහ හැසිරීම් රටාවන් වල මිශ්‍රණයයි" (institutional separation and behavioural convergence).

අනෙකුත් පළාත් වල සිංහල-බෞද්ධයින් විසින් වන්දනාමාන කරණු ලබන ගලේබණ්ඩාර දේවාල ඇති අතර මානම්මා නම් කාන්තා ශාන්තුවරියක් උදෙසා කැපකරනු ලැබූ තවත් එක් මුස්ලිම් දේවාලයක් ආසන්නයේ ඇති තෙලියගොල්ල මුස්ලිම් ජනපදයේ ඇත. මානම්මා නම් ශාන්තුවරිය ගලේබණ්ඩාර ගේ මුස්ලිම් ජාතික මව ලෙස හඳුනාගනු ලැබේ.

## ගලේබණ්ඩාර පුරාවෘත්තය

ගලේබණ්ඩාරගේ කතාව ප්‍රදේශයේ සිංහල-බෞද්ධයන් අතර ප්‍රචලිත සිංහල ජන සාහිත්‍යයෙහි දැනට ලේඛනගතව ඇති පුරාවෘත්තයකි.[9] ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවටද ගලේබණ්ඩාරගේ මුලාරම්භය ගැන ඔවුන්ගේම වූ මුඛ පරම්පරාගත පුරාවෘත්තයක් ඇති අතර එහි විස්තර කතාව සිංහල පුරාවෘත්තයට වඩා වෙනස්ය. මා පළමුව සිංහල පුරාවෘත්තය විස්තර කරන්නෙමි. මීට ප්‍රධාන හේතුව සිංහල පුරාවෘත්තය කට වචනයෙන්, මුඛ පරම්පරාගත ජන කවි ආශ්‍රයෙන් සහ මුද්‍රණය කරන ලද කවි පොත් වලින් පමණක් නොව මීට කලකට ඉහතදී නිර්මාණය කළ චිත්‍රපටියකින් පවා ප්‍රජාව අතර සංසරණය වී ඇති බැවිනි.[10] ගලේබණ්ඩාර පුරාවෘත්තයේ විවිධ සංයෝජනයන් අතර නොයෙකුත් සුළු වෙනස්කම් දක්නට ඇති නමුත්, පැහැදිලි කිරීමේ පහසුව උදෙසා ඒ සියලූ වෙනස්කම් මෙහිදී අප සාකච්ජා කරනු නොලැබේ.

9 මේ ජනප්‍රවාදය ඉංග්‍රීසියෙන් පළකළ පොත් කිහිපයක කලින් සඳහන් විය. උදා: Parker (1909), සහ Dewaraja (1994). වර්තමාන කෘතියේ මෙම ජනප්‍රවාදය ඉදිරිපත් කරන්නේ ඒකනායක මැණිකේ (1997), කුරුවිට (2015), අමරසිංහ (1920), අතපත්තු (1986), බණ්ඩා (1921), රත්නායක (සංස්) (1928) යන ද්විතිය මූලාශ්‍ර සහ ගලේබණ්ඩාර දේවාලයේ ප්‍රධාන කපු මහතාගෙන් ලද තොරතුරු අනුවය.

10 මේ හා සම්බන්ධ පද්‍ය සාහිත්‍යයට උදාහරණ නම් කාලිංග සිරිමල් එතනා, පුරාණ සිව්පද සංග්‍රහය, කලූන්දා හටන, කලූන්දා උපත සහ ගලේබණ්ඩාර විත්තියයි. "කාලිංග සිරිමල් එතනා" නමින් නාඩගමක් ද විය. මේ අනුව සකස්වූ චිත්‍රපටිය "සිරි පැරකුම්" ය.

සියලූ ගලේබණ්ඩාර පුරාවෘත්තයන්ට අනුව සාමාන්‍යයෙන් ගලේබණ්ඩාර කතාව දිග හැරෙන්නේ ප්‍රාදේශීය ඉතිහාසය තුළය. 1272 සිට 1284 දක්වා කුරුණෑගල රාජධානිය පාලනය කළ I වන බුවනෙකබාහු රජු[11] හට ඔහුගේ ඇවෑමෙන් රජකම භාරගැනීමට පිරිමි දරුවෙකු සිටියේ නැත. රාජකීය දෛවඥයා රජතුමාට පවසා සිටියේ වෙනත් ආගමක් අදහන කාන්තාවක් තම බිසව කරගතහොත් ඇයගෙන් රජතුමන්ට පළමු පිරිමි දරුවා උපදින බවය.

එක දිනක් රජතුමා තමන්ගේ සුපුරුදු චාරිකාවන් යන අතරතුර "අස්වැද්දුම" නම් ග්‍රාමයේදී ඉතා පියකරු මුස්ලිම් කාන්තාවක් මුණගැසුණි.[12] රජතුමා ඇයව යකඩ දෝලියක්[13] වශයෙන් රහසේ විවාහ කරගත්තේය. මේ මුස්ලිම් ජාතික බිසව නියමිත කාලයේදී පිරිමි දරුවකු ප්‍රසූත කළාය. මේ කුමරා වත්හිමි බණ්ඩාර නමින් නම් තබන ලදී. වත්හිමි බණ්ඩාර යන්නෙහි අර්ථය වන්නේ "දෛවෝපගතව වස්තුව ලබාගැන්මට සමත් කුමරා" යන්නයි. නමුත් පුරාවෘත්තයේ කියවෙන පරිදි "වත්හිමි" නමින් එකල රජ පෙළපතක්ද විය. කුමාරයාගේ ආරක්ෂාව පිණිස ඔහුගේ මව්පාර්ශවයෙන් ඔහුව බේරුවලට පිටත්කර හැරිය අතර එහිදී ඔහු අධ්‍යාපනය ලබමින් මුස්ලිම් අයෙකු ලෙස මව්පාර්ශවයේ ඥාතීන් අතර හැදී වැඩුනේය.

මේ වත්හිමි බණ්ඩාර කුමරා ඔහුගේ නව යොවුන් වියේ පසුවන අවධියේ දී ඔහුගේ පිය රජතුමාට තම ප්‍රාදේශීය යුව රජෙක් සමඟ යුද්ධයට යෑමට සිදුවිය. ඒ අවස්ථාවේදී පිය රජතුමා යළි පැමිණෙන තෙක් කුරුණෑගල රාජධානිය බලාගැනීමට වත්හිමි කුමාරයාට පවරන ලදී. රජතුමා තම සේනාවත් සමගින් කුරුණෑගලින් නික්මුණු දවසේම ඔහුගේ සිංහල බිසවද පිරිමි දරුවෙකු ප්‍රසූත කළාය. රජු යුද්ධයට නික්මයන අවස්ථාවේ ඔහු සිය බිසෝවරුන්ට කියා සිටියේ ඔහු යුද්ධය ජයගත්හොත් සුදු ධජයක් ඔසවා එය ඔවුන්ට දන්වනු ඇති අතර පරාජය වුවහොත් කළු ධජයක් ඔසවා එය දන්වනු ඇති බවය.

---

11 මේ රජු 4 වන විජයබාහු ලෙස ඇතැම් කෘති වල සඳහන් වේ.

12 තමපුර සිරි බලමින් රජු ඇතු පිටින  
යනවර අස්වැද්දුම නම් ගම මැදින  
දිවසර වැනි තුනු රුසිරෙන් දිළ තරුණ  
මනහරයොන් අඟනක් දැක සිත ඇලූන  
මුලාශ්‍රයඃ ගලේබණ්ඩාර උපත හෙවත් කාලිංග සිරිමල් එතනා, රත්නායක (සංස්),(1928)

13 සිංහල ව්‍යවහාරයේදී "රන්දෝලිය" සහ "යකඩ දෝලිය" යන පද යොදා ගනු ලබන්නේ පිළිවෙලින් රජ පෙළපතට අයත් ප්‍රධාන රාජකීය බිසොවුන් වහන්සේලා සහ සාමාන්‍ය පවුල් වලට අයත් රජුගේ අවශේෂ භාර්යාවන් සඳහාය. "රන්දෝලිය" යන්නෙහි වචනාර්ථය "රන් දෝලාවේ ගමන් කරන්නිය" යන්නයි. ඇසළ පෙරහැර වැනි උත්සව අවස්ථා වල රජුගේ ප්‍රධාන බිසවුන් වහන්සේලා රත්රන් දෝලා වලින්ද, අනෙකුත් භාර්යාවන් (රජ පෙළපතට අයත් නැති) යකඩ දෝලා වලින්ද රැගෙන ගිය බව රැල්ෆ් පීරිස් සඳහන් කොට ඇත (Pieris 1956). එමනිසාම අදාළ කාන්තාවන් රන් දෝලිය සහ යකඩ දෝලිය ලෙස හැඳින්වූ බව පෙනේ.

රජු මේ යුද්ධය පහසුවෙන් ජයග්‍රහණය කළ අතර ඔහු දූරයා (අඩුකුලයේ) පණිවුඩකරුට පැවසුවේ බිසෝවරුන් රවටනු පිණිස මොහොතකට කළු ධජය ඔසවා එසැනින් නිවැරදි පණිවුඩය දන්වනු පිණිස සුදු ධජය ඔසවන ලෙසටය.[14] ජයග්‍රහණයෙන් උද්දාමව සිටි පණිවුඩකරුවා අතරමඟ දී මත්පැන් පානයෙන් සිහි විකල් කරගත් නිසා කළු ධජය පමණක් ඔසවාගෙන පැමිණියේය. රජුගේ පරාජය සනිටුහන් කළ කළු ධජය දැකීමෙන් අන්තංපුරයේ සිටි බිසෝවරු 67 දෙනාම අන්තංපුරය පිහිට 'වීරගල.,' කන්දෙන් පැන සියදිවි නසා ගත්තෝය. රජකමට නිත්‍යානුකූල හිමිකරුවා වූ අලුත උපන් කුමරා රජ මාලිග ාවේ සේවයකරන රෙදි සෝදන්නියක (හලූලඳ) විසින් සොයාගත් අතර ඇය ඒ කුමරාත් බිම වැටී තිබී අහුලාගත් රත්රන් හවඩියකුත් හොර රහසේම මාලිගාවෙන් රැගෙන ගියාය. මේ සිදුවූ විපත දුටු පණිවුඩකරුද වීරගල., කන්දෙන්පැන දිවි නසාගත්තේය. පැමිණීමෙන් අනතුරුව මේ විනාශය දුටු රජතුමාද එසේම සියදිවි නසාගත්තේය.

දැන් කුරුණෑගල රාජධානියට පාලකයෙකු නැති බැවින් මියගිය රජුගේ මුස්ලිම් බිසව වූ මානම්මා සහ අස්වැද්දුම ප්‍රදේශයේ මුස්ලිම් ජාතිකයින් එකතුවී නව යොවුන් වත්හිමි කුමරා i වන බුවනෙකබාහු රජුගේ[15] අනුප්‍රාප්තිකයා වශයෙන් ඔටුනු පැළඳීමට සියලූ කටයුතු සුදානම් කළෝය. වත්හිමි කුමරා ගැන කිසිදු සටහනක් මහාවංශය, දීපවංශය වැනි වංශකතාවල නැත. නිකාය සංග්‍රහයේ පමණක් වත්හිමි කුමාරයා ගැන කෙටි සඳහනක් ඇත (ජයබාහු තෙර 1922). එහි සඳහන් කර ඇත්තේ වත්හිමි නම් රාජ වංශයේ නමින් ඔහු රාජ්‍යත්වයට පැමිණි බවයි. කෙසේ වෙතත් ජනකතාවලට අනුව වත්හිමි යන නම ඔහුට රජතුමා උපතේදී දුන් නමය.

මේ පුරාවෘත්තයේ සමහර සංස්කරණ වලට අනුව වත්හිමි කුමරා මුලදී සිංහල අමාත්‍ය මණ්ඩලයේ කොටසකට නිර්ලෝභීව ත්‍යාග සහ වරප්‍රසාද දීමෙන් ඔවුන් තමන්ගේ පැත්තට

---

14 බොලන්දුරයෙනි වීරගල්පුර මැදුරේ නිවසන බිසෝවරු හට
පෙනෙන්නට මේ කළුකොඩිය පළමුවෙන්ඔසවා ඔවුන්බියකොට
එයින්පසු මේ සුදුකොඩිය ඔසවා ගමන්කොට මාළිගාවට
තොසින්කියනුව මෙමා යුදයෙන් ජයලබා එනබැව්ද තිරකොට

මුලාශ්‍රයඃ ගලේබණ්ඩාර උපත හෙවත් කාලිංග සිරිමල් එතනා, රත්නායක (සංස්) ,(1928).

15 මහාවංශයෙහි හෝ දීපවංශයෙහි වත්හිමි නම් රජෙකු සඳහන් නොවේ. කෙසේ නමුත් ගම්පල යුගයේදී රචිත නිකාය සදග්‍රහයෙහි යාපහුව, කුරුණෑගල, දඹදෙණි යුගවලට අයත් රජවරුන් ගැන සඳහන් කරනවිට වත්හිමි බුවනෙකබාහු නම් රජකෙනෙකු ගැන සඳහන් වේ (ජයබාහු 1922ඃ 19). මේ සඳහන අපගේ ජනකතා වලට සම්බන්ධ වත්හිමි කුමාරයා වීමට ඉඩකඩ තිබේ. කෙසේ නමුත් "වත්හිමි" පුද්ගලික නමක් නොව රජ පරම්පරාවේ නමක් නම් "වත්හිමි බුවනෙකබාහු" යන නම වත්හිමි කුමාරයාගේ පිය රජුගේ (1වන බුවනෙකබාහු ගේ) නම වීමට ඉඩ ඇත. මෙම සඳහන අපගේ අවධානය පිණිස යොමු කළේ මහාචාර්ය ගනනාථ ඔබේසේකර විසිනි.

දිනාගැනීමට සමත් වූවත් මේ අනුසාරයෙන් ඇතිවූ මිත්‍රත්වය අඩු ආයුෂ සහිත එකක් විය. තරුණ රජතුමා තමන්ගේ ක්‍රියා කලාපය නිසා සිංහල-බෞද්ධ ප්‍රභූන් ක්‍රම ක්‍රමයෙන් ඔහුගෙන් ඈත්විය (Dewaraja 1994). මුස්ලිම් පරිසරයක හැදී වැඩුණු බැවින්, නව රජතුමා තමන්ගේ අමාත්‍ය මණ්ඩලයට අලුතින් පත්කරගත් මුස්ලිම් ජාතිකයින් හට වැඩි පක්ෂපාතීත්වයක් පෙන්වීම සිංහල ප්‍රභූ පවුල්වල අප්‍රසාදයට හේතුවිය.

මේ වකවානුවේදීම කුරුණෑගල වැවේ වරින් වර පාවෙන සළඹක් හෝ රන් කෙණ්ඩියක් ගැන කතාවක් අසන්නට ලැබුණි. රජතුමා මේ වස්තුව ලබා ගැනීමට දැරූ උත්සාහයන් සියල්ල නිෂ්ඵල විය. මාතර වැනි ඈත ප්‍රදේශවල සිට ගෙන්වූ කට්ටඩියන් මේ නිධානය ලබාගැනීමේ කාර්ය සඳහා යෙදවූයේ ඔවුන් අසමත් වුවහොත් හිසගසා දමන බවට කොන්දේසියක් ද සහිතවය. මේ නිසා බොහෝ කට්ටඩියන් හට මේ පාවෙන නිධානය ලබා ගැනීමට නොහැකිවීමෙන් ඔවුන්ගේ ජීවිත අහිමිවිය. රජතුමා මේ මුවාවෙන් කට්ටඩියන්ගෙන් පටන්ගෙන ක්‍රමයෙන් සිංහලයින් සමුලඝාතනය කිරීමේ උත්සාහයක නිරතවී සිටින බවට බියක් සිංහල ප්‍රභූන් තුළ ඇතිවිය.

සිංහලයින් බයෙන් තැතිගත් අතර බෞද්ධ භික්ෂූන්වහන්සේ රාජධානියේ පැවැත්ම ගැන මහත් කනස්සල්ලට පත්විය. මේ අබෞද්ධ පාලනය යටතේ විසීමට සිදුවීම නොරිස්සූ බෞද්ධ භික්ෂූන් වහන්සේලා රජතුමා ඝාතනය කිරීමට රහසින් සැලසුම් කළෝය.[16] රන් කෙණ්ඩිය ගැනීමට රජතුමාට තිබූ බලවත් ආශාව උපයෝගී කොට ගනිමින් ඔවුන් ඇතුගල මුදුනේ පිරිත් සජ්ජායනාවක් කළහොත් ඒ ආනුභාවයෙන් වස්තුව ලබාගතහැකි වන බව රජතුමාට පවසා එසේ කිරීම සඳහා කටයුතු සූදානම් කරන මෙන් රජුට උපදෙස් දුන්නෝය. මේ ගැන කිසි සැකයක් ඇති නොකරගත් රජතුමා ඔහුගේ තන්හාව නිසා මේ යෝජනාවට වහා එකඟ විය. [17] ඇතුගල මුදුනේ ඉතා අලංකාරවත් පිරිත් මණ්ඩපයක් ඉදිකරනු ලැබූ අතර රජුට මේ සැඟවුණු නිධානය ලබාගැනීමේ අපේක්ෂාව ඉටුකර ගැනීමට පිරිත් සජ්ජායනාවට සහභාගිවීම සඳහා වෙනම මණ්ඩපයක් ඒ අසල ඉදිකරන ලදී. රජු ප්‍රධාන ආරාධිතයා කර ගනිමින් පිරිත් සජ්ජායනාව ඇරඹුන අතර මැදියම් රැයේ කලින් තීන්දු කරගත් මොහොතක තෝරාගත් මැර කණ්ඩායමක් විසින් රජුව ඇතුගලෙන් පහළට තල්ලුකරන ලදී.

---

16 මැණියන්ගෙන් උරුම වී එන මහමදාගම හැරලොලා
මේ ලෙසින් ඇතුගල්පුරේ මිණිකිරුළ සිත්ලෙස පළඳලා
ආදියෙන් තිබුණාවූ වත්හිමි නාමයෙන් රජපැමිණි ලා
බීතයෙන් සැම සිහල නිලධාරියන් පහකර සිරිකලා

මුලාශ්‍රයඃ ගලේබණ්ඩාර උපත හෙවත් කාලිංග සිරිමල් එතනා, රත්නායක (සංස්) (1928).

17 ගලේබණ්ඩාර උපත පිළිබඳ ඇතැම් කවි පොත්වල වත්හිමි හඳුන්වාදී ඇත්තේ "තණ්හාපති වත්හිමි" ලෙසය (බලන්න ගලේබණ්ඩාර උපත හෙවත් කාලිංග සිරිමල් එතනා 1928, 75 වන පැදිය.)

පුරාවෘත්තයේ සඳහන් වන පරිදි මේ ඝාතනයෙන් පසු රජතුමා ක්ෂණිකවම යක්ෂයකු වශයෙන් නැවත ඉපදී මේ ඝාතනය සැලසුම් කළ සියල්ලන්ම බිහිසුණු ලෙස මරා දමනු ලැබීය. ඉන් පසුව මේ යක්ෂයා තැනින් තැන යමින් මිනිසුන් බියගැන්වීමට පටන් ගත් නිසා සෑම දෙසම භීතිය පැතිර ගියේය. මේ අවස්ථාවේදී මේ යක්ෂයා හමුවීමට පැමිණි ලංකාරක්ෂක කතරගම දෙවියන්, තමා සන්සුන් වන බවටත්, ප්‍රදේශය පුරා ඔහු සිදුකරනු ලබන මේ ජනතාව බියවැද්දීම නවත්වන බවටත් එකඟ වන්නේ නම් ඔහුට දේවත්වයක් ලබාදෙන බවට පොරොන්දු විය. ඉන්පසුව ඔහුට ඔහුගේ පිහිටපතා පැමිණෙන මිනිසුන් හට පිහිටවීමටත් ආශිර්වාද කිරීමටත් වරම් දුන්නේය. මින්පසු මේ නව දෙවියන්ට පුදපූජා පැවැත්වීමට දේවාලයක් ඉදිවූ අතර මේ දෙවියන්, ඔහුගේ ඇතුගලට තිබූ සම්බන්ධය හේතුකොටගෙන, "ගලේබණ්ඩාර දෙවියන්"[18] නම් විය.

මේ පුරාවෘත්තයේ ප්‍රධාන උප කථාවස්තුවක් වන්නේ අප්පුවාගේ කතාවයි. එනම් රජමාලිගාවෙන් ගෙනගොස් රෙදි අපුල්ලන්නියක විසින් මුලින් හදා වඩා ගත් සිහසුනේ නිත්‍යානුකූල උරුමක්කාරයාගේ කතාවයි. මේ රෙදි අපුල්ලන්නියට පෙනුන සිහිනයකින් ඇයට පැවසුවේ මේ කුමරාව ඔහුගේ තත්වයට සුදුසු පරිදි ගොවිගම කුලයේ පවුලකට භාරදෙන ලෙසටය. ඇය එසේ කළ අතර මේ කුමරා ගමරාල කෙනෙකු විසින් ඉන්පසු හදා වඩාගත් අතර නිසි කල් එළඹි විටදී ගමරාලගේ බාල දියණිය වූ සිරිමල් එතනා ඔහුට විවාහකර දුන්නේය. ඇත පිටිසර කලුන්දාව නම් ගමේ එතරම් ප්‍රසිද්ධියක් නැතිව ජීවත්වීම නිසා මේ කුමරා සොයාගෙන ඔහුව මරා දැමීමට වත්හිමි රජුට පක්ෂපාති කණ්ඩායම් දැරූ සියලූ උත්සාහයන් ව්‍යර්ථ විය. වත්හිමි රජතුමා ගේ ඝාතනයෙන් පසුව රජකම උරුම කුමරා සෙවීම සඳහා යෙදවූ රාජකීය හස්තියා විසින් නිසි ආකාරයෙන් ඔහුව සොයාගනු ලැබූ අතර ඔහු දඹදෙණියේ දී පණ්ඩිත පැරකුම්බා නමින් සිංහාසනාරූඪ විය.

නමුත් මුස්ලිම් පුරාවෘත්තය ඉහත දක්වන ලද කතා පුවතින් විස්තරාත්මක වශයෙන් වෙනස් වේ. මුස්ලිම් කතාවට අනුව අරාබියේ රටක සිට ලංකාවට තම පුතත් සමඟ එන මුස්ලිම් කාන්තාවක් වෙළදාම සඳහා මෙහි පැමිණි තම ස්වාමිපුරුෂයා සොයයි. ඇයට ඔහු හමු නොවෙන අතර රජතුමා අස්වැද්දුම ග්‍රාමයේදී ඇය හමුවී ඇයව විවාහ කරගනියි. ඇය විවාහ කරගත් පසු රජතුමාද ඉස්ලාම් ආගම වැළඳ ගනී. රජතුමා ගේ මරණින් පසු ඇයත් සමඟ පැමිණි ඇයගේ පුතා රජකමට පත්වූ අතර ඔහු මවගේ උපදෙස් අනුව රාජධානිය පාලනය කළේය. මේ කතාවට අනුව වත්හිමි කුමරා සිංහල පුරාවෘත්තයේ

18 බණ්ඩාර ඇදහිල්ලට සම්බන්ධ බොහෝ පුරාණ කතාවල ඒ ඒ ප්‍රදේශයේ ඇති සුවිශේෂ භූමි හැඩතල ඇතුළත් වී තිබේ. උදාහරණයක් ලෙස ගලේ බණ්ඩාර ඇදහිල්ලෙහි ඇත. ගල, වීරගල සහ දැකුම් ගල යන ප්‍රදේශයේ ඇති විශාල ගල් පර්වත පුරාණයේ දී වැදගත් වූ අයුරු සංකේතවත් වේ. මේ මගින් එම භූමි හැඩතලවලට කිසියම් පූජනීයත්වයක් ලැබී ඇත. මේ ඔස්සේ පරිසරයට කිසියම් පූජනීයත්වයක් සහ පුදපූජාමය වැදගත්කමක් ලැබී ඇත. එබැවින් පරිසරය සුරක්ෂිත කිරිමට ද ප්‍රදේශයේ සෞභාග්‍ය හා සාපල්‍යතාවය පවත්වා ගැනීමටද මෙම විශ්වාස සහ පිළිවෙත් දායකවුයේ යැයි සිතිය හැකිය.

මෙන් අර්ධ මුස්ලිම් අර්ධ සිංහල නොව පූර්ණ වශයෙන් මුස්ලිම්ය. අදාළ පුරාවෘත්තය මුස්ලිම් පවිත්‍රකරණයට ලක්වීමක් මෙහිදී හඳුනාගත හැකිය. වත්හිමිගේ ප්‍රචණ්ඩ මරණින් පසු, වත්හිමිගේ මුස්ලිම් නෑදෑයෙක් දුටු සිහිනයකින් ඔහුට වත්හිමිගේ සිරුර යම්කිසි නිශ්චිත ස්ථානයක භූමිදානය කරන ලෙස උපදෙස් දෙනලද අතර ඔහු නොපමාව එය මුස්ලිම් චාරිත්‍රානුකූලව සිදුකර එම ස්ථානයේ සොහොන් කොතක් ඉදිකරන ලදී.

මෙහිදී අවධානය කළ යුතු කරුණක් නම් මේ මුස්ලිම් පුරාවෘත්තය අපට කියන ලද්දේ ගලේබණ්ඩාර මුස්ලිම් දේවාලය භාරව සිටින මුස්ලිම් පූජකයින් විසින් නොව ගලේබණ්ඩාරගේ මව වෙනුවෙන් ඉදිවූ දේවාලයට සම්බන්ධ මුස්ලිම් වැඩිහිටියන් විසින් බවයි.

## සිංහල පුරාවෘත්තය ගැන අවලෝකනය

ඔබ මේ දැන් ඇසූ ගලේබණ්ඩාර පුරාවෘත්තය ප්‍රචණ්ඩත්වය සහ ද්‍රෝහීකම්වලින් පිරී ඇති එකක් බව ඔබට වැටහෙන්නට ඇත. යුද්ධය, බිසෝවරුන්ගේ සාමූහික සියදිවි හානි කරගැනීම, වත්හිමි කුමරා සිංහාසනාරූඪ වෙත්දී ඒ සිංහාසනය නිත්‍යානුකූලව හිමි කුමාරාට සැඟවී සිටින්නට සිදුවීම, අද්භූත පාවෙන වස්තුව ගැනීමට අසමත්වන කට්ටඩියන් මරා දැමීමට වත්හිමි රජු නියෝගදීම, වත්හිමි රජතුමා කුමන්ත්‍රණයකින් ඝාතනය කිරීම, බෞද්ධ භික්ෂූන් එම කුමන්ත්‍රණයේ හවුල්කරුවන් වීම සහ පිරිත් සජ්ජායනාවක් ඝාතන කුමන්ත්‍රණයක ප්‍රධාන භූමිකාවක් හෙබවීම, මරණින් පසු රජු එසැනින් යක්ෂයකුව ඉපදීම සහ, වහාම තමා මරාදැමීමට සහභාගී වූ සියලූ දෙනාගෙන් පළිගැනීම, යන මේ සියලූ දෑ අතිශය ප්‍රචණ්ඩවූ, එක ප්‍රචණ්ඩ ක්‍රියාවක් තවත් ප්‍රචණ්ඩ ක්‍රියාවකට මඟ පාදන උද්වේගකර නාටකයක් වැනිය. මෙවන් ප්‍රචණ්ඩත්වයකට තුඩුදුන් ජීවිතයක් හිමිවූ ප්‍රචණ්ඩ පුද්ගලයකු සිංහල-බෞද්ධයන් විසින් දේවත්වයට ඔසවා තබන්නේ ඇයි ද යන්න අප වික්ෂිප්ත කරන ප්‍රශ්නයක් ලෙස ඉතිරිව ඇත.

ගලේබණ්ඩාර පුරාවෘත්තය වාර්ගිකත්වය, ආගම, කුලය සහ ස්ත්‍රී-පුරුෂ භාවය වටා ගොඩනැගී ඇත. මේ පුරාවෘත්තයමය කථා වස්තුවෙන් පැහැදිලිවම ශ්‍රී ලාංකික සමාජයයේ ව්‍යුහයන් වලට යම් ස්වභාවධර්මානුකූලබවක් ආරෝපණය කොට ඇත. මේ අනන්‍යතාවයන් කතාවේ මූලාරම්භයේදී අවධාරණය වනවා පමණක් නොව ඒවා සමාජ පිළිවෙලෙහි කොටසක් ලෙස ඉදිරිපත් කර ඇත (සිල්වා 2015, 2018). ජනකවියේ ඉස්මතු කොට ඇති වාර්ගික භේදය, මුල් කථාවේ කොටසක්ද නැතිනම් එහි මෑතකාලීන, විශේෂයෙන් යටත්විජිත හෝ පසු-යටත්විජිත, ප්‍රති-නිර්මාණ හෝ අලූත් ආවර්ජනය කිරීම්

වල ප්‍රතිඵලයක් ද යන්න පැහැදිලි නැත. කෙසේ වෙතත් සිංහල පුරාවෘත්තය පුරාවට පැහැදිලි සිංහල ජාතිකත්ව තේමාවක් අඩංගු වී ඇත.[19]

පුරාවෘත්තය හරහා දිවෙන තවත් තේමාවක් නම් සිංහල සහ මුස්ලිම් දෙපාර්ශවය අතර ඇති ගැටුම්කාරිත්වයයි. සිංහල සහ මුස්ලිම් සම්බන්ධතාවයන් ගැන අධ්‍යයනය කළ ලෝනා දේවරාජා (1994) කියන පරිදි මේ ගලේබණ්ඩාර පුරාවෘත්තය ඇයට හමුවූ සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන් දෙක අතර අතීත පසමිතුරුතාවයන් විදහාදක්වන එකම උදාහරණයයි. වත්හිමිගේ මුස්ලිම් නෑදෑයන් ඔහුව හදා වඩා ගැනීම මුස්ලිම් ප්‍රජාවක් තුළ සිදුකිරීමට තෝරාගත් අතර, ඔහුව රජකමට පත්කිරීමත්, ඔහු සිංහාසනාරූඪ වූ පසු රජුට සහයෝගය පිණිස ඔහු වටා රොක්වීමත් සිදුවූයේ සිංහල-බෞද්ධ, ප්‍රභූන් සහ සංඝයා වහන්සේ කුපිතකරවන ආකාරයකිනි.[20] වත්හිමි සහ ඔහුට පක්ෂපාති අය රාජකීය සිංහල අගමෙහෙසියට (රන් දෝලියට) උපන් නිත්‍යානුකූල ඔටුන්න හිමි කුමරා ඝාතනය කිරීමට මාන බලද්දී ඒ කුමරා ජනතාව අතර සැඟවී ජීවත් විය. කථා පුවත පුරාවටම වත්හිමි ප්‍රක්ෂේපණය කරනු ලබන්නේ වස්තුවට තණ්හාවෙන් ඇලුණු පුද්ගලයෙක් ලෙසින් වන අතර ඔහුගේ නම පවා මේ දුර්වලකම සනිටුහන් කරන්නකි. කුරුණෑගල වැවේ පාවුනා යයි කියවෙන ගුප්ත වස්තුව තමන් සතු කර ගැනීම සඳහා ඔහුගේ නිර්දය උත්සාහයන් නිසා අවසානයේ ඔහුගේ ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවීම බුදු දහමට අනුව සියලු දුකෙහි මුල තණ්හාව යන සත්‍ය තහවුරු කරන්නකි. එබැවින් නැවත වතාවක්, මෙවැනි පුද්ගලයෙක් එනම් මුස්ලිම් ජාතිකයකුවීම මත පමණක් නොව ඔහුගේ හැදියාවෙන් මෙන්ම චර්යාවෙන් අබෞද්ධයකු වූ පුද්ගලයෙක් බෞද්ධයන් විසින් පළමුව දේවත්වයට පත්කර අවසානයේදී වන්දනාමාන කරන්නට පටන්ගැනීම අප හමුවේ ඉතිරි වී ඇති උභතෝකෝටික ප්‍රශ්නයකි.

ගලේබණ්ඩාර දෙවියන් සහ සිංහල ජාතිකත්වය අතර සම්බන්ධය සංකීර්ණ එකකි. එක් අතකින් ඔහු සිංහල ජාතිකත්වයට ඇතුළත් වූ අතර අනෙක් අතින් ඔහු එයට පරිබාහිර විය. ඔහුගේ පියා සිංහල-බෞද්ධ රජකෙනෙකු වූ බැවිනුත්, ගලේබණ්ඩාර (වත්හිමි) හට තමන් යුද්ධයකට යාමට පෙර පළමුව රාජධානිය භාරකරන්නේ ඔහු බැවින් සහ ගලේබණ්ඩාර

---

19 මෙහිදී සිහිතබාගත යුතු කරුණක් වන්නේ බොහෝ ගලේ බණ්ඩාර ප්‍රබන්ධ සහ කවිපොත් සංස්කරණය සහ මුද්‍රණය සිදුවූයේ 1920 ගණන් වල දී බව ය. 1915 මරක්කල කෝලහාලය සහ අනගාරික ධර්මපාලතුමාගේ පුරෝගාමීත්වයෙන් සිංහල බෞද්ධ පුනර්ජීවනය සිදුවූයේ මීට වර්ෂ කිහිපයකට කලින් බව මෙහිදී සඳහන් කළ යුතුය.

20 හලන් ගැනීමට ලොභවී වත්හිමි රජු විසිනා
දනන් නසාලන බැව් දුටු සිහල මැතිඳු රෝසිනා
රජුන් මරාලන්ට උපා රහසේ යොදවමිනා
ගොසින් කිවො ඉන්ද්‍රජෝති සමිඳුට එම කරුණා

මූලාශ්‍රයඃ ගලේබණ්ඩාර උපත හෙවත් කාලිංග සිරිමල් එතනා, රත්නායක (සංස්) (1928)

(යක්ෂයකු ලෙස පුනරුත්පත්තිය ලැබීමෙන් පසු) ඔහුව දෙවිකෙනෙක් බවට පත්කරන්නේ සිංහල-බෞද්ධ ජාතියේ ආරක්ෂක දෙවිකෙනෙකු වශයෙන් සලකනු ලබන කතරගම දෙවියන් විසින් වන බැවිනුත් ඔහු සිංහල ජාතිකත්වය තුළට ඇතුළත් වේ. අනෙක් අතට ඔහුගේ මව මුස්ලිම් ජාතික කාන්තාවක් වීමත්, ඔහු හැදී වැඩුනේ මුස්ලිම් ජාතිකයන් අතර මුස්ලිම් ආකාරයට වීමත්, ඔහුගේ තිබූ අසාමාන්‍ය වස්තු තණ්හාවත්, ඔහු (යක්ෂයකු ලෙස පුනරුත්පත්තිය ලැබීමෙන් පසු) ඔහුට විරුද්ධව කුමන්ත්‍රණය කළ සංඝයා වහන්සේගෙන් පළිගැනීමත් නිසා ඔහු සිංහල ජාතිකත්වයට පිටස්තරයකු ලෙස සැලකිය හැකිය.

සමහරවිට ගලේබණ්ඩාර සිංහල සහ මුස්ලිම් යන දෙපිරිසටම පිහිටවන්නට පිළිවන් දෙවිකෙනෙකුන් ලෙස ගැනෙන්නේ ඔහුගේ මේ ද්විත්ව ස්වභාවය නිසා වියහැක. සිංහල-බෞද්ධ දේව මණ්ඩලයට අයත් යයි කියවෙන දෙවිවරු කිහිපදෙනෙක්, එනම් කතරගම, විෂ්ණු, සීනිගම දෙවියෝ, මෙන් ගලේබණ්ඩාර දෙවියන්ද එක් ජන කොටසකට පමණක් අයත් දෙවිවරුන් නොවන නිසා ඔවුන් හට මේ බෙදුම් යාකරමින් ඔවුන් වෙත පැමිණෙන ජනතාවගේ ආගම හෝ ජාතිය නොසලකා ඔවුන් හට යුක්තිය සහ සාධාරණය ඉටුකර දීමේ හැකියාවක් ඇතැයි විශ්වාස කෙරේ. තමාම සිංහල-බෞද්ධන්ගේ නොයෙකුත් කෙණෙහිලිකම් වලින් පීඩාවට පත්වූවෙක් වශයෙන් ගලේබණ්ඩාර දෙවියන් හට ඊහා සමාන අත්දැකීම් විඳින අයට පිහිට විය හැකි යැයි කල්පනා කිරීමට පුළුවන.

ගලේබණ්ඩාර යක්ෂ ආත්මයේදී ඔහු විසින් තමන්ගේ සතුරන්ගෙන් පළිගත් නමුත් දෙවියෙකු බවට පත්වීමෙන් පසු ඔහුට තමන් ගේ පුද්ගලික වෛර පිරිමසාගත නොහැක. එසේ නමුත්, ගලේබණ්ඩාර දෙවියන් හට සතුරන්ගේ අසාධාරණ පීඩාකාරිත්වයන් නිසා කරදරයට පත්වී සිටින බැතිමතුන්ට එම සතුරු කරදර දුරුකිරීමට උදව් විය හැකිය.

සාරාංශ වශයෙන් ගත් විට ගලේබණ්ඩාර සම්ප්‍රදායේ බහු-සංස්කෘතිකභාවය ඇත්ත වශයෙන්ම රැඳී ඇත්තේ බෞද්ධ, මුස්ලිම් මෙන්ම සමහරවිටකදී අනෙකුත් ආගම් අදහන අයට පවා, කිසි බයක් හෝ සැකයකින් තොරව ඔවුන්ගේ ප්‍රශ්නය කවරාකාර වුවත්, ඔවුන්ගේ විශේෂිත වූ අනන්‍යතාවයන් කුමක් වුවත්, ඔවුන්ට සතුරුකම් කරන්නන් කෙතරම් බලවත් වූවත්, ගලේබණ්ඩාර දෙවියන් වෙත පැමිණ ආශිර්වාද ලබාගැනීමට ඇති හැකියාව මතය.

මෑතදී ඇතිවූ අන්තවාදී ආගමික ප්‍රවණතා ගලේබණ්ඩාර ඇදහිල්ල කෙරෙහි බලපා ඇති අන්දම ගැන බැලීමේදී මුස්ලිම් ගලේබණ්ඩාර පුදබිමට (ziaram - සියරාමයට), මෙම ප්‍රදේශයේ ඉස්ලාම් ආගමික ක්‍රියාකාරිකයින්ගේ තෝතැන්නක් වී ඇති මාවතගම ප්‍රදේශයට අයත් වහබි කණ්ඩායමක් විසින් මේ ආගමික ස්ථානයේ කටයුතු ඉස්ලාම් ධර්මයේ පිළිගත්

මූලධර්ම වලට පටහැනි බැවින් ඒවා වහා නවත්වන ලෙස තර්ජනය කර ඇති බව අපට දැනගන්නට ලැබුණි. මේ නිසා දැන් මේ ස්ථානයේ කටයුතු පවත්වාගෙන යන්නේ අඩු ප්‍රසිද්ධියක් සහිතවය. නමුත් මේ දක්වා මේ පූජනීය ස්ථානයට ඉස්ලාම් ආගමිකත්වය තුළින්ම පැනනගින පාරිශුද්ධකරණීය පීඩනයන් දරාසිටීමට හැකි වී ඇත්තේ මේ ස්ථානය ප්‍රධාන ඉස්ලාමීය ධාරාවෙන් බැහැරවූ පූජනීය ස්ථානයක් නිසාත් මෙම ස්ථානයට බෞද්ධ සහ මුස්ලිම් ප්‍රජාවන් දෙකෙන් ම ලැබෙන සහයෝගය නිසාත් වියහැක.

සිංහල දේවාලයට මෙවන් පීඩනයක් සිංහල-බෞද්ධ සංස්ථාවෙන් හෝ BBS වැනි සංවිධාන වලින් එල්ලවූ බවක් අපට දැනගන්නට නොලැබුණි.

සමහරවිට ගලේබණ්ඩාර දෙවියන් පිලිබඳ විශ්වාසය සිංහල-බෞද්ධ සංස්කෘතිය සහ සන්තානය තුළ ගැඹුරින් පැලපදියම් වී තිබීමත්, සම්භාව්‍ය සිංහල-බෞද්ධ සංස්ථාවෙහි අන්‍ය ආගම් ඉවසීම සහ ඒවා සමඟ අන්‍යෝන්‍ය සහජීවනයක් පවත්වාගැනීම යන ශක්‍යතාවයන් සමඟ සැසඳීමේදී සිංහල-බෞද්ධ අන්තවාදය සිංහල-බෞද්ධ ආගමික වතාවත් වල සම්පූර්ණ පාරිශුධත්වයක් සඳහා අරගල කිරීමට තරම් වර්ධිත තත්වයක නොතිබීමත් මීට හේතු වශයෙන් දැක්විය හැකිය. අනික් අතට සියලුම බණ්ඩාර ඇදහිළි එක්තරා අන්දමකින් සිංහල-බෞද්ධ ප්‍රධාන ධාරාවෙන් දුරස්ථව පැවතීම නිසා දෙවනගල සිටින සුපරික්ෂාකාරී බෞද්ධ කණ්ඩායම් වලට මෙන් මේ අදාළ දේවාල තුළ සිදුවන දේ ගැන පිටස්තර අයට අධීක්ෂණය කිරීමට අපහසුය.

## කහටපිටිය මුස්ලිම් පල්ලියේ බහු ආගමිකත්වය

කහටපිටිය මුස්ලිම් පල්ලිය ගම්පොල නගරයට කිට්ටුව පිහිටා ඇත. එය සමහරවිට ගම්පොල යුගයට (1314-1415) අයත් විය හැකිය. සාමාන්‍ය පල්ලියට එක් පසෙකින් බාවා කහුෆ් නම් "අව්ලියා" හෙවත් සුෆි ශාන්තුවරයකු වෙනුවෙන් ඉදිවූ පූජනීය ස්ථානයක් (සියරාම්) ඇත. මොහු බොහෝ කලකට පෙර මක්කම සිට කහටපිටියට පැමිණියෙකු යැයි කියවේ.[21] සුෆි සිද්ධස්ථාන වලට ආවේනිකවූ පරිදි කහටපිටිය මෙම සිද්ධස්ථානයේද ශාන්තුවරයකු වෙනුවෙන් ඉදිකරනලද සොහොන් කොතක් ඇත. මේ සිද්ධස්ථානයට ප්‍රදේශයේ මුස්ලිම් සහ සිංහල ප්‍රජාවන් දෙකෙහිම ජනතාව පැමිණෙන්නේ ඔවුන්ගේ නොයෙක්වූ ලෞකික ප්‍රශ්න වලින් මිදීමට අව්ලියාවරයා ගේ ආශිර්වාදය සහ දේව යුක්තිය ඉටුකරගැනීමට ඔහුගේ මැදිහත්වීම බලාපොරොත්තුවෙනි. ඔබේසේකර (1975) කරන ලද අධ්‍යනයකට අනුව මේ සිද්ධස්ථානය යන්ත්‍රමන්ත්‍ර සහ ගුරුකම් සඳහා මුස්ලිම් සහ සිංහල

21 මෙම විශේෂ පල්ලිය හෝ සියාරම් සිද්ධස්ථානයගැන සඳහනක් 1896 පළකළ ලව්රි ග්‍රන්ථයෙහි ඇත. බලන්න Lawrie 1896-395.

ජනතාව අතර ප්‍රසිද්ධවූවක් බවට හඳුනාගෙන ඇත (1975-3). බෞද්ධ විහාරස්ථානයක් සහ සමීපව සම්බන්ධ වූ කුරුණෑගල සිංහල ගලේබණ්ඩාර දේවාලයට සහ හුදකලාව පිහිටි ගලේබණ්ඩාර මුස්ලිම් සියරාමයට වෙනස්ව මෙම සිද්ධස්ථානය මුස්ලිම් පල්ලියත් සමඟ එහි සියලු අංගෝපාංග අතින් අනුයුක්ත වී ඇත.

කහටපිටිය සිද්ධස්ථානයේ බාවා කහුෆ් ශාන්තුවරයා සමඟ පටබැඳුණු හාස්කම් බොහෝමයකි. එයින් එක උදාහරණයක් නම්, එක මුස්ලිම් ජාතිකයෙක් පල්ලිය අසල කුඩා හෝටලයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකරමින් සිටියදී දිනක් ඔහු හට පෙනුන සිහිනයකින් එම හෝටලය පල්ලියේ සහ සිද්ධස්ථානයේ කටයුතු වලට බාධාවක් වියහැකි බැවින් ඔහුට එම ගොඩනැගිල්ල ඉදිකිරීම නතර කරනමෙන් උපදෙසක් ලැබුණි. කෙසේ නමුත්, මේ ගොඩනැගිල්ලේ අයිතිකරු එම උපදෙස නොතකා ගොඩනැගිල්ලේ කටයුතු දිගටම කරගෙන ගියේය. එම ගොඩනැගිල්ල ඉදිකළ පසු එය පිහිටා තිබූ භූමිය ගිලාබසින්නට පටන්ගත්තේය. බොහෝ අය මෙය අව්ලියාතුමන්ගේ අවවාදයත් සමඟයම් සම්බන්ධයක් ඇති බව විශ්වාස කරති.

මේ හා සමාන තවත් සිද්ධියක් වන්නේ දිනක් පල්ලිය අසලින් ගිය බෞද්ධ පෙරහැරක සංවිධායකයින් ඔවුන් මේ පල්ලිය අසලින් පෙරහැරේ යනවිට සාමාන්‍යයෙන් පල්ලියට කරන ගෞරව දැක්වීම නොකළ හෙයින් ඔවුන් සියලු දෙනාම ඉතා කෙටි කාලයකදී රෝගාතුර වීමයි. මෙය නැවතත් පල්ලියේ සහ මේ සිද්ධස්ථානයේ බලගතුබව තහවුරුකරයි.

මීට ඉහතින් සඳහන් කළ ඔබේසේකරගේ අධ්‍යයනයේදී අනාවරණය වූ කරුණක් නම්, යන්ත්‍රමන්ත්‍ර ගුරුකම් සඳහා මේ සිද්ධස්ථානයට එන සිංහල සහ හින්දු බැතිමතුන්ගේ සංඛ්‍යාව එම කාරණය සඳහා එහි එන මුස්ලිම් බැතිමතුන්ගේ සංඛ්‍යාවට වඩා වැඩි බවයි. මෙය අසාමාන්‍ය සොයාගැනීමක් වශයෙන් පෙනෙන්නේ මේ දේවස්ථානය සමඟ මුස්ලිම් ජනතාවගේ ඇති බැඳීම සැලකිල්ලට ගැනීමේදීය. මෙසේ වැඩි බෞද්ධ සහ හින්දු පිරිසක් ඉහත සඳහන් කාරණය සඳහා මේ සිද්ධස්ථානයට යාම පිළිබඳව ඔබේසේකරගේ අදහස වන්නේ මුස්ලිම් සිද්ධස්ථානයක් වන මෙහිදී තමන් පැමිණි රහස්‍ය කාරණය තමුන්ගේ ප්‍රජාවේ අයගෙන් සඟවා ගැනීම බෞද්ධ හෝ හින්දු සිද්ධස්ථානයකදී එය කරනවාට වඩා පහසු නිසා වියහැකි බවයි.

කෙසේවෙතත්, දේව යුක්තිය ඉටුකරදීමේදී අව්ලියාවරුන්ගේ ආගමික අපක්ෂපාතිත්වයේ ප්‍රතිඵලදායි බව, ගලේබණ්ඩාර සම්බන්ධයෙන් අපි මීට කලින් දුටුවාක්මෙන්, මෙම අව්ලියාතුමන් සම්බන්ධයෙන්ද ඒ හා සමානව සැලකිය හැකිය.

මෙම සිද්ධස්ථානය  අයත් ආසන්න ප්‍රදේශයෙන්ම පමණක් නොව ඊට එපිට ප්‍රදේශවල සිට පවා මුස්ලිම් ජනතාව ඔවුන්ට යම් කෙනෙකුගෙන් යම් කරදරයක්, හිරිහැරයක් වූ විට මෙහි පැමිණ එහි තබා තිබෙන යම්කිසි තීන්ත වැනි ද්‍රව්‍යයක් සිද්ධස්ථානයේ ඇති නියමිත බිත්තියක ආලේප කරති. ඔවුන් විශ්වාස කරන්නේ එසේ කිරීම නිසා ඔවුන්ට පීඩා කළ අයට යම් හානියක් අත්වන බවයි. මේ සිද්ධස්ථානය පිහිටි ප්‍රදේශයට බොහෝ දුරකින් ඇති මාවනැල්ල ප්‍රදේශයේ පවා යම්කිසි කෙනෙක් එදිනෙදා කතාබහේදී තමන්ට හානිකළ කෙනෙකුට පලිගැසීම කිරීම පිණිස මේ සිද්ධස්ථානයට යන්නට උවමනායැයි සඳහන් කළ පමණින් ඔවුනට යම් වරදක් කර ඇති අය වහා එම පළිගැසීමෙන් අත්වෙන පීඩා වළක්වාගනු පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග (එනම් යම් සොරාගත් දෙයක් ආපසු ලැබීමට සැළස්වීම) ගැනීමට පෙළඹේ.

1990දී පමණ මැදපෙරදිග කලක් සේවය කිරීමෙන් පසුව ශ්‍රී ලංකාවට පැමිණි එක්තරා උගත් මුස්ලිම් තරුණයකු, ඔහු එහි සේවය කරන කාලයේදී අවශෝෂණය කරගත් වහබි ඉගැන්වීම් අනුව යමින් කහටපිටියේ මෙම සිද්ධස්ථානය අපකීර්තියට පත්කිරීමේ උත්සාහයක නිරතවිය. එම තරුණයා සහ ඔහුගේ මිතුරන් පළමුව මෙම සිද්ධස්ථානය භාර පූජකතුමන් සමඟ සම්මුඛ සාකච්ජාවක් කළ අතර ඔහු මේ අව්ලියාතුමන්ගේ හාස්කම් පිළිබඳව සත්‍යවශයෙන්ම විශ්වාස කරන්නේදැයි අසා ඇත. මෙහිදී මේ පූජකතුමන් ඒ පිළිබඳව ඔහුගේ ඇති සැකය ප්‍රකාශ කර ඇත. මේ සම්මුඛ සාකච්ජාව රහසිගතව පටිගත කළ තරුණ පිරිස පසුව සිද්ධස්ථානයට එන බැතිමතුන්ට එය අසන්නට සැලැස්විය. ඔවුන්ගේ අරමුණ වූයේ අව්ලියාතුමන්ගේ පිහිට අපේක්ෂාවෙන් මෙසේ පැමිණෙන බැතිමතුන්ට, වහබි ඉගැන්වීම් වලට අනුව ඉස්ලාම් විරෝධීයැයි හඳුනාගනු ලැබූ  මෙවන් ඇදහීමකින් ඉවත් වීමට පෙළඹවීමයි.

මෙම සිද්ධියෙන් පසු පල්ලියේ බලධාරීන්, එම අදාළ පූජකතුමන් ඔහුගේ පල්ලියට සහ සිද්ධස්ථානයට ඇති කැපවීම ගැටලූ සහගත බව පවසමින් සේවයෙන් නෙරපා දැමුවේය. මේ වහබි තරුණ පිරිසගේ ක්‍රියාවෙන් පසු සිද්ධස්ථානයට එන පිරිසේ අඩුවක් දක්නට ලැබුණ නමුත් එය තාවකාලික විය. මේ අධ්‍යයනය සිදුකරන කාලය වනවිට පල්ලියේ බලධාරින් මේ සිද්ධස්ථානයට අඩු වැදගත්කමක් දක්වන බවත් පෙණුන නමුත් සිද්ධස්ථානයේ ජනප්‍රියතාවය නැවත තහවුරු වී ඇති බවත් දක්නට ලැබුනි.

## නිගමනය

මෙම වාර්තාවේ අප විසින් විමර්ශනයට  ලක්කළ උදාහරණයන් දෙස බැලීමේදී ඉතා පැහැදිලිව පෙනී යන කරුණක් වන්නේ ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ බෞද්ධාගම සහ ඉස්ලාම් ආගම අතර බහු-ආගමික අවකාශයක් පවතින බවයි.  මේ බහු-ආගමික නැඹුරුව ගලේබණ්ඩාර දේවාල වල වැඩිවශයෙන් දක්නට ලැබුණු අතර අනුක්‍රමිකව එය කහටපිටිය සිද්ධස්ථානයේත්, දෙවනගලත් දක්නට ලැබුණි. දෙවනගල ප්‍රධාන වශයෙන්, පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුක්ත වූ ස්ථානයක් වූ නමුත් පසුව BBS වැනි සංවිධාන වල මුස්ලිම් විරෝධී ව්‍යාපාර වලදී ආගමික වටිනාකමක් ආදේශ කරනලද අඩවියකි. එය ඇත්තවශයෙන්ම "බෞද්ධ සහ මුස්ලිම් දෙපිරිසම වන්දනාකරන අඩවියක්" යන අර්ථයෙන් "බහු-ආගමික" අඩවියක් නොවේ. එය මුලික වශයෙන් පුරාවිද්‍යාත්මක ස්ථානයක් වූ අතර මෑතක සිට වැඩියෙන් අවධාරණය වී ඇත්තේ සිංහල-බෞද්ධයන්ට පමණක් සීමාවූ පුරාවිද්‍යාත්මක අඩවියක් ලෙසටය.

ප්‍රදේශයේ සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන් අතර කොතෙකුත් සංස්කෘතික හුවමාරු සහ සමාජ සම්බන්ධතා තිබුනද, සම්පත් සඳහාවූ අරගලය දිනෙන් දින වැඩිවෙමින් පවතින, ජනගහන අසමතුළිතතාවයත්, වාර්ගික අනන්‍යතා දේශපාලනීකරණයවීමත් නිසා මෑතක සිට ප්‍රජාවන් දෙක අතර ආර්ථික සහ සමාජ ආතතීන් වල වැඩිවීමක් දක්නට ඇත. BBS සහ එයට අනුබද්ධිත අනෙක් සංවිධාන වලට සම්බන්ධ සටන්කාමී භික්ෂූන් ගේ බලපෑම් වල ප්‍රතිඵල සහ ශ්‍රීලාංකික රාජ්‍යයේ සිංහල බෞද්ධ ජාතිකවාදී සාමූහික නැඹුරුවේ ප්‍රතිඵලයක් ලෙස, අතීතයේ ප්‍රදේශයේ සැමගේ පොදු උරුමයක් ලෙස සැළකුණ දෙවනගල සිංහල බෞද්ධ අයට පමණක් සීමා විය යුතු ජනවාර්ගික අඩවියක් ලෙස සැළකීමේ ප්‍රවනතාවක් උද්ගත වී ඇත.

BBS සංවිධානය හා සම්බන්ධ ප්‍රදේශයේම බෞද්ධ භික්ෂූන් වහන්සේ දෙනමක් අදාළ ප්‍රදේශයේ දීර්ඝකාලීනව පදිංචිව සිටින මුස්ලිම් ජනතාව ඉවත්කිරීමට බලකිරීමේ ව්‍යාපාරයක් මෙහෙයවනු ලබමින් සිටින අතර කොළඹ ආශ්‍රිත, මුස්ලිම් පුනරුදයක් සඳහා ක්‍රියාකරන සංවිධානයක් ආතතියෙන් පිරි මෙම අස්ථායි අවකාශයට ඇතුළුවීම  ප්‍රදේශයේ උද්ගත වි ඇති මතභේද සහ අවිනිශ්චිත බව තවත් වැඩිකිරීමට හේතුවී ඇත. අනෙක් පැත්තෙන්, මාවනැල්ල ජනතා මිත්‍රත්ව සංවිධානය සහ ප්‍රාදේශීය මුස්ලිම් පල්ලි බොහොමයක් ප්‍රදේශයේ සාමකාමී සහජීවනයක් පවත්වාගෙන යාම තුළින් වාර්ගික - ආගමික බෙදුම් හරහා ගැටුම් ඇතිවීම වලක්වාගැනීම සඳහා ඉදිරිපත් වී ඇත.

දෙවනගල මෙන් නොව, ගලේබණ්ඩාර ඇදහිල්ල සැබවින්ම, බෞද්ධයන් සහ ඉස්ලාම් භක්තිකයන් මෙන්ම ඇතැම් සෙසු ආගමිකයන් පවා, උපතින් අර්ධ බෞද්ධ සහ අර්ධ මුස්ලිම් යයි විශ්වාස කරන සෑම අයටම පොදු දෙවිකෙනෙකු වන්දනාකරන බහු-ආගමික විශ්වාස පද්ධතියකි.

ආයතනික බුද්ධාගම සහ ආයතනික ඉස්ලාම් ආගම මේ ඇදහිල්ල සමඟ යම් දුරස්ථ බවක් පවත්වාගෙන යන නිසා මේ (සිංහල, මුස්ලිම්) දේවාල දෙකෙහි තේවා කටයුතු කරන සිංහල සහ මුස්ලිම් පූජකයින් එකිනෙකා අතර සම්බන්ධතා පවත්වන්නේ හෝ එක්ව පුදපූජා පවත්වන්නේ හෝ නැත. ඔවුන් එකිනෙකා විවේචනය නොකරන අතර දෙගොල්ලන්ම වෙන වෙනම තමන්ගේ දේවාලයට බැතිමතුන්, ජාති, ආගම් බේදයකින් තොරව ආකර්ෂණය කර ගැනීමට උත්සාහ කරති. මෙම ගලේබණ්ඩාර නම් දිව්‍යමය චරිතය ජනතාව විසින් එකවර ගෞරවයෙන් සහ භයකින් සලකන්නාවූ දෙවිකෙනෙකි. මීට හේතුව මේ දෙවියන් බෞද්ධ හෝ ඉස්ලාම් ආගමට සීමාවූ දෙවියෙකුට වඩා පොදුවේ සියළු බැතිමතුන්ට පිහිට විය හැකි දේව බලවේගයක් ලෙස පිළිගැනීමට ලක්වී ඇති නිසාය. පොදුවේ ගත් කළ "යුක්තිය සහ සාධාරණත්වය ඉටුකරනා දෙවිවරු" (Gods of Justice) (Sax 2009) ගැන විශ්වාසය වරප්‍රසාද නොලත්; හරිජනයින්, කාන්තාවන්, වාර්ගික සුළුතරය සහ පවත්නා යුක්තිය පසිඳලන ආයතන වලින් තමන්වෙත සාධාරණය ඉටුකර ගැනීමට ශක්තියක් නැති කණ්ඩායම් අතර වඩා ප්‍රබල වේ. මේ යුක්තිය ඉටුකරන දෙවිවරුන් පවතින වාර්ගික-ආගමික ප්‍රජාවන්ට යම් තරමකට පරිබාහිර වීම නිසා ඔවුන් හට එක පාර්ශවයකට පක්ෂපාතිවීමේ හෝ වැඩියෙන් සැලකීමේ ඉල්ලීම් වලට යටත් වීමට අවශ්‍ය නැත. වෙනත් කෝණයකින් බලනවිට පෙනීයන තවත් කරුණක් වන්නේ ගලේබණ්ඩාර දෙවියන් වටා ඇති පුරාවෘත්ත වල වාර්ගික ප්‍රතිරූප නිර්මාණය කිරීමේ ප්‍රවණතාවයක් ඇති නමුත් ඒවා අතීතයේ සිට පැවති නැඹුරුවක් ද එසේ නැතිනම් සිංහල ජාතික ව්‍යාපාරය බිහිවීමෙන් පසු ඇති වූ නව අර්ථකතනයක් ද යන්න නොපැහැදිලිය.

කෙසේනමුත්, මේ ඇදහිල්ලට අනුගත වී සිටින සූෆි කණ්ඩායම් මේ සම්ප්‍රදායෙන් පළවාහැරීමට වහබි කණ්ඩායම් ගත් උත්සාහයන් ව්‍යර්ථ වී ඇති බවක් පෙනෙන්නට තිබේ. BBS සංවිධානය, ඔවුන් විසින්ම ප්‍රකාශකළ ආගමික පාරිශුද්ධකරණ ව්‍යාපාරයක් මෙහෙයවමින් සිටින නමුත්, මේ ඇදහිල්ලේ ඇති බෞද්ධ-ඉස්ලාම් අන්තර්-සම්බන්ධතාව අභියෝගයකට ලක්කිරීමටවත් ඉදිරියට පැමිණුනේ නැත. අප ආගම් සහ සංස්කෘතීන් සීමා මායිම් වලින් කොටු වූ බලප්‍රදේශ වශයෙන් සලකන්නේ යම් පමණකටද, එපමණකින්ම අප සැබෑ ආගමික අත්දැකීම්වලින් සහ සංස්කෘතික පෝෂණයන්ගෙන් ඈත් වීමක් සිදුවේ.

දෙවනගල ප්‍රදේශයේ ඇති සුවිශේෂී තත්වයන් යටතේ සංස්කෘතික සහ ඓතිහාසික සිද්ධිදාමයන්ට සහ අදාළ ප්‍රජාවට කාලයක් තිස්සේ බලපාන නොවිසඳුණු සමාජ-ආර්ථික ගැටලු යන සාධක වලට ආගමික ස්වරූපයක් දීමට අන්තවාදී ආගමික ක්‍රියාකාරිකයන්ගේ යම් තරමකට හැකි වී ඇතත් බෞද්ධ - ඉස්ලාම් ආගමික සංකලනය වඩාත් මුල්බැසගත් ගලේ බණ්ඩාර අඩවියෙහි අන්තවාදී ආගමික බලපෑම් මතුපිට තලයට පමණක් සීමා වී ඇත. මේ මගින් හෙළිවන්නේ සමාජයේ පැළපදියම් වූ තුනී ආගමික බහුත්වයකට පවා ආගමික අන්තවාදීන්ට සහ ආගමික පවිත්‍රකරණ ප්‍රවනතාවලට යම් තරමක ප්‍රතිවිරෝධතාවයක් දැක්විය හැකි බවය.

මෙම රචනාවේ මුලින් සලකා බැලූ අඩවි දෙක මෙන් නොව, අප අධ්‍යයනයට ලක්වූ තුන්වන අඩවිය, එනම් කහටපිටිය මුස්ලිම පල්ලිය, සම්ප්‍රදායානුකූල, ඉස්ලාමීය ආගමික ආයතනයක් වන අතර එහිම වූ සූෆි සිද්ධස්ථානය කාලාන්තරයක් තිස්සේ ස්ථාපිතවූ, මුස්ලිම් සහ බෞද්ධ අයට පමණක් නොව අන් ආගම් වල අයට පවා දේව යුක්තිය හා සාධාරණය ලබා ගැනීමේ මාර්ගයක් විවෘත කොට දී ඇත. මෙම ආගමික සිද්ධස්ථානයෙහි වහබි පෝෂණය ලැබූ, ඉස්ලාම් ආගම ශුද්ධකරණ උත්සාහයන් අසාර්ථක වීමට මූලික හේතුව සෑම ජාතික සහ ආගමික පසුබිම් වලින් පැමිණෙන බැතිමතුන් මේ සිද්ධස්ථානයට ගෙන්වා ගැනීම සඳහා මෙහි මව්ලවිවරුන්ගේ ඇති උනන්දුව සහ එසේ පැමිණෙන බැතිමතුන්ට ඔවුන්ගේ පුළුල් ආගමික අවශ්‍යතාවයන් සපුරාගැනීමට මෙම මව්ලවිවරුන් විසින් අවස්ථාව සලසාදීමයි.

අවසාන නිගමනයන් වශයෙන් අපට දැක්විය හැක්කේ BBS සහ ඔවුන්ගේ අනුගාමිකයන් විසින් ඉතිහාසයට පටහැනි පවිත්‍ර සිංහල බෞද්ධ කලාපයක් ලෙස දෙවනගල පුරාවිද්‍යා අඩවිය හඳුනාගැනීම නිසා මෙම ප්‍රදේශය අස්ථාවර සංහිඳියා විරහිත තත්වයට පත්ව ඇති අතර අධ්‍යයනට ලක් වූ බහු ආගමික මධ්‍යස්ථාන දෙක වහබි ඉගැන්වීම් වලින් උනන්දු කරන ලද ආගමික ශුද්ධකරණ උත්සාහයන් සාර්ථකව පරාජය කරමින් ආගමික සහජීවනය යම් තරමකට පවත්වාගැනීමට සමත්වී ඇති බවයි. දෙවනගල දී BBS සංවිධානයේ සාපේක්ෂ සාර්ථකත්වයට හේතුව ලෙස අපට හඳුනාගත හැක්කේ, පක්ෂග්‍රාහී ලෙස පුරාවිද්‍යාව සහ ඉතිහාසය උපයෝගී කරගනිමින් සහ ප්‍රදේශයේ ඇති ජනවාර්ගික ආතතීන් පෝෂණය කරමින් තර්ජනයට ලක් වූ සිංහල බෞද්ධ කලාපයක් ලෙස දෙවනගල අර්ථකතනය කිරීම නිසාය. අනෙක් අතට BBS සංවිධානයට හෝ වහබි ඉගැන්වීම් වලින් පෝෂණය ලැබූ මුස්ලිම් අන්තවාදයට ගලේබණ්ඩාර හෝ කහටපිටිය වැනි, සංකලනික පූජනීය ස්ථාන තුළට, ඒවා මතබේදයට තුඩුදෙන ඉතිහාසයන් තිබියදී පවා, විනිවිද යා නොහැකි විය. මෙයට හේතුව ලෙස සැලකිය හැක්කේ, මේ ආයතනයන් වල දීර්ඝ කාලීන ආගමික දෙමුහුන් බව ගැඹුරින්ම මුල්බැස තිබූ දේව යුක්තිය සහ සාධාරණය ඉටු කර ගැනීමේ ජනතා උවමනාවන් සඵල කළ බැවිනි.

ඇපල්බිගේ "පූජනියත්වයේ ව්‍යාකුල බව" සහ ආගමික ක්‍රියාකාරිකයින් විසින් සාමය ගොඩනැගීම සඳහා හෝ ප්‍රචණ්ඩත්වය කරා එය බලගැන්වීම සහ මෙහෙයවීම සාමය ගොඩනැංවීම සඳහාවූ විභවයකින් එම පූජනීයත්වය යුක්ත වේය යන අදහස (Appleby 2000) වත්මන් අධ්‍යයනයෙන් තහවුරු වේ. මෙම අධ්‍යනයේදී විමර්ශනය කරන ලද උදාහරණ තුනම පෙන්වාදෙන්නේ දේව යුක්ති-සාධාරණය පිළිබඳ විශ්වාසයන් ආගම් අතර අන්තර්ක්‍රියා අවකාශයන් සමඟ සම්බන්ධවූවක් මිස එක් ආගමික සම්ප්‍රදායකට අභ්‍යන්තරික නොවන බවයි. "යුක්තියේ දෙවිවරු" එක් එක් කණ්ඩායම් සඳහා වූ සීමිත බැඳීම් වලින් දුරස්ථව පවතින්නන් වන අතර මේ නිසාම ඔවුනට පටු වාර්ගික-ආගමික බෙදීම් අතික්‍රමණය කරමින් යුක්තිය සහ සාධාරණය ඉටුකිරීම් හැකියාව ඇත,

මෙය ආගමික සාමය ගොඩනැගීමේ කර්තවයේදී, ශ්‍රී ලාංකික සන්දර්භය තුළ වැදගත් සාධකයක් ලෙස දැකිය හැකිය. මෙම සොයාගැනීම පදනම් කර ගනිමින් අපි විවිධ විද්වතුන් කතරගම, ශ්‍රීපාදය, දෙවිනුවර, ඇතුළු අනෙකුත් එවැනි පූජා භූමි බෞද්ධාගමීකරණයට ලක්ව ඇතැයි කියන ප්‍රකාශයන් (Pfaffenberger 1979, Gombrich and Obeyesekere 1988, de Silva 2005) නැවත විමසීමක් අවශ්‍ය වන්නේ මේ ඉහත සඳහන් කළ පූජා අඩවි වලින් බොහොමයක් දේව යුක්තිය සහ සාධාරණය ඉටුකර ගතහැකි ස්ථාන ලෙස සලකන බැවිනි.

මේ සිද්ධස්ථාන සහ ඒවාට අනුගෘහිත දෙවිවරු ස්ථිර බෞද්ධකරණයට ලක්වුවහොත්, රාජ්‍යය අපක්ෂපාති යැයිද, පොදු පුරවැසිභාවය, සමාන මානව අයිතිවාසිකම්, සහ සමාන ගෞරවය යන පදනමේ සිට සියලූ දෙනාට එක සමානව සේවය කරන්නේ යැයිද, ජනතාව තවදුරටත් නොසලකන්නේ යම්සේද ඒ ආකාරයෙන් මේ ස්ථානද වාර්ගික හෝ ආගම් බේදයකින් තොරව සියලූ ජනකොටස් වලට යුක්තිය සහ සාධාරණය ඉටු කරන මධ්‍යස්ථාන ලෙස තවදුරටත් වලංගු නොවීමට ඉඩ ඇත. මේ ආකාරයෙන්ම, රාජ්‍ය ආයතනයක් BBS වැනි සංවිධානයක් විසින් තම පටු දේශපාලන අරමුණු සාධනය සඳහා පාවිච්චි කිරීම මගින් රාජ්‍ය ආයතනවල මධ්‍යස්ථභාවය පිළිබඳ ගැටලුවක් මතුවන අතර එම ආයතන වලින් තමන්ට කිසිදු යුක්තියක් හෝ සාධාරණයක් ඉටුකරගත නොහැකියයි අපේක්ෂා භංගත්වයකින් යුක්තිය සහ සාධාරණය ඉටුකර ගැනීමට වැඩි වැඩියෙන් දෙවියන්ට කන්නලව් කරන්නට මිනිසුන් පෙළඹී ඇතැයි කල්පනා කළහැකිය.

රටේ සියලූ පුරවැසියන් හට කිසිදු වාර්ගික, ආගම්, ආර්ථික හෝ සමාජීය භේදයකින් සහ වෙනස්කම් කිරීමකින් තොරව යුක්තිය සහ සාධාරණය ඉටුකළ හැකි රාජ්‍ය යාන්ත්‍රණයක් බිහිකළ හැක්කේ කෙසේද යන්න පශ්චාත් යුධමය ශ්‍රී ලංකාවේ දේශපාලනය සහ ප්‍රතිපත්ති සම්පාදනය හමුවේ ඇති මෙතෙක් නොවිසඳුණු ප්‍රධාන අභියෝගයකි.

# ඇමිණුම 1: දෙවනගල අවට මුස්ලිම් ජනයාගේ ප්‍රතිචාර

## පිළිතුරු දෙන්නා 1: දෙවනගල ප්‍රශ්නය සම්බන්ධව මුස්ලිම් මවකගේ අදහස්

### ඔබ දෙවනගල ප්‍රශ්නය ගැන සිතන්නේ කුමක්ද?

වැඩියෙන්ම කරදර විඳින්නේ ගැහැනු අය. අපි බයවුණා ගැහැනු දරුවන් ගෙදර තියා ගන්නත්. ඒ දවස්වල මට හැඟුනා මේ තැනවත් මේ නිවසවත් අපේ නෙවෙයි කියලා. ඒ අය හමුවක් හෝ රැස්වීමක් පවත්වපු සෑම දවසකම අපි දැක්කා ඒ පිරිස් අපේ ගෙවල් දිහා ඕනෑකමින් බලමින් යන විත්තිය. ඔවුන් අපේ නිවෙස් එකිනෙක ඇඟිල්ල දිගුකර පෙන්වමින් "අර ගෙදර නුඹට", "මේ ගෙදර නුඹට" කියලා ඔවුනොවුන් එකිනෙකාට කියාගත්තා. සමහර දවස්වලට මම ගැහැනු ළමයින් රෑ වෙනකොට වෙනත් තැනකට පිටමන් කරලා මමයි පිරිමි දරුවයි ස්වාමි පුරුෂයයි මේ ගෙදර ඉන්නවා. අපි හැමවෙලේම දැනගෙන හිටියා දෙවනගල බෞද්ධයන්ට විශේෂිත වූ තැනක් කියලා. අපි කවරදාකවත් ඔවුන්ට බාධාවක් වත් ඔවුන් අපිට බාධාවක්වත් වුනේ නැහැ.

### මේ ප්‍රශ්නය ඔබගේ දෛනික ජීවිතයට බලපාන්නේ කොහොමද?

සත්තකින්ම, අපි තවමත් ඉන්නේ බයෙන්. අපි දන්නේ නැහැ මේක ආයෙත් කොයි වෙලාවක මතු වේවිද කියලා. වැටහිරියා කෝටුවක් කඩාගන්න එක පවා දැන් ප්‍රශ්නයක්. කවුරුහරි කොහෙන් හරි 911 ඇමතුමක් දුන්නොත් පුරාවිද්‍යා අය එතන. අපි ආරක්ෂා කර ඇති අඩවියට හෝ එහි කිසිවකට හානියක් කරන්නේ නැහැ. අපිට අවශ්‍ය අපිට අයිති ඉඩමේ නිදහසේ ජීවත් වෙන්න. අපිට ඔප්පු සහ ලියකියවිලි තියනවා. අපි පදිංචි ඉඩම සහ මේ නිවස අපිට නිත්‍යානුකූලව අයිතියි.

ඒ කාලේ සමහර දවස්වල අපට නින්ද යන්නෙත් නැහැ. අනිත් පළාත් වල ඉන්න අපේ නෑදෑයෝ අපිට කිව්වේ මේ පළාත ඇත හැරලා යන්න කියලා. දැන් නම් තත්වය බොහෝ දුරට තිබුනට වඩා හොඳයි. කෙසේ වුනත් දැන් පාරවල් පළල් කරමින් එනවා, ගල ගාවදී කොහොමද පාර පළල් කරන්නේ? ඔවුන්ට පාර අසල ඇති ගල් සහ අනෙකුත් දෑ අයින් කරන්න වෙනවා නේද?

## ඔබ කුඩා කාලයේ දෙවනගලට සම්බන්ධ කතන්දර කිසිවක් අසා තියනවද?

මතකයට ගන්න තරම් විශේෂිත වූ කතන්දර නම් දැන් මතක නැහැ. නමුත් මිනිසුන් දැනගෙන හිටියා මේ තැන ඓතිහාසික තැනක් කියලා. අපි හැමෝම බලන්නට ගිය විශාල පාද සටහනක් වගේ දෙයක් තිබුනා. පර්වතය මුදුනේ නෙලුම් මල් පිරිච්ච ලස්සන පොකුණක් තිබුනා. මම කල්පනා කරන්නේ ඒක තවමත් ඇතිද කියලා. ගොඩක් අය එතනට ගියා. පර්වතය බලන්න යන්නම අපේ සමහර නෑදෑයෝ අපේ ගෙදරට ආවා. මේ පර්වතය ගොඩක් ප්‍රසිද්ධයි. එතකොට දැන් වගේ ගොඩක් ප්‍රශ්න තිබුනේ නැහැ. සිංහල අය සහ මුස්ලිම් අපි අතරේ ඇත්තෙන්ම සුන්දර බැඳීමක් තිබුනා. අපි එකිනෙකාට උදව් කරගත්තා, එකිනෙකාගේ සතුටු සහ දුක්මුසු අවස්ථාවල එකතු වුනා. මේ පර්වතය එතකොටත් තිබුනා. ඒත් මේ බය සහ චකිතය තිබුනේ නැහැ.

## මේ ප්‍රශ්නයේදී BBS සංවිධානයේ මැදිහත්වීම ගැන ඔබ හිතන්නේ කුමක්ද?

ඔවුන් කළේ අපට හිරිහැර කරපු එක විතරයි. ඔවුන් මුස්ලිම් අය ගැන සිංහල අය අතරේ නරක හැඟීම්, වැටහීම් ඇති කරා. සමහර අය ඒවා විශ්වාස කරපු නිසා කලින් අපි සමග ඉතා සුහදව හිටිය ඒ අය දැන් අපිට විරුද්ධ වෙලා. පර්වතය අසලම පවුලක් ඉන්නවා. ඒ ගොඩක් දුප්පත් අඩු කුලයේ අය. අපේ ගෙවල් වලින් ඒ අයට කෑම දුන්නා, රාමදාන් කාලයේදී අපි කැඳ ගිහින් දෙනවා. අපි ඒ අයට අපේ ඉඩමෙන් පොල් කඩා ගන්නත් ඉඩ දීල තිබුනා. ඒත් අපි දැක්කා ඒ අය මේ ප්‍රශ්නයේදී මුස්ලිම් අය එලවා දමන්න අපට හිරිහැර කරන්න මුලින්ම ඉදිරිපත් වෙනවා. ඒක පපුව කැඩිලා යන තරමට දුක හිතුන දෙයක්. ඇත්තෙන්ම හරිම කණගාටුයි. අපි ඒ අයට සැලකුවේ අපේම අය විදිහට. මම දන්නවා මේක මුස්ලිම් අයට විතරක් තියන ප්‍රශ්නයක් නෙවෙයි. අපි වැදගත් විදිහට ජීවත් වුනා. දැන් අපි ඉන්නේ ගොඩක් දුකෙන්.

## මේ අවිනිශ්චිත අවස්ථාවේ රජයේ නිලධාරීන්ගේ මැදිහත්වීම ගැන ඔබට කිසිවක් කියන්නට තියෙනවද?

මට නම් ඒ ගැන වැඩි යමක් කියන්නට දන්නේ නැහැ. නමුත් ආණ්ඩු මාරුවීමෙන් පස්සේ පැහැදිලිව පෙනෙන්නට තිබෙන සන්සුන් බවක් තියනවා. නමුත් අපිට කියන්න බැහැ සම්පූර්ණයෙන් පසුගිය ආණ්ඩුව හැම වෙලාවකදීම අපට විරුද්ධ වුනා කියලා. ඔවුන් අපට උදව් කළ වෙලාවලුත් තිබුනා. ආණ්ඩු පක්ෂයේ දේශපාලඥයින් පවා අපට උදව් කළා. මට දැනගන්නට ලැබුණා ආයෙමත් මේ ප්‍රශ්නය මතුවෙමින් තියෙන බව. ඒක නිශ්ශබ්දව අයෙත් මතුවෙමින් එනවා. මට බයක් දැනෙනවා. මට වැඩියමක් මතක නැහැ. දැන් ඒ

ඔක්කොම අපැහැදිලි දුමාරයකින් වැහිලා වගේ. ඒ දවස්වල ගොඩක් දේ සිදු වුනා. හැම දවසකම මොකක් හරි ලොකු ප්‍රශ්නයක්. මට ලොකු මාතෘකා ගැන කියන්න දන්නේ නැහැ නමුත් අපි ඔක්කොම ගොඩක් හිරිහැර වින්දා. එච්චරක් නම් මට කියන්න පුළුවන්.

## පිළිතුරු දෙන්නා 2: දෙවනගල ප්‍රශ්නය ගැන කඩ සාප්පුවක් හිමි වැඩිහිටි මුස්ලිම් පිරිමියෙක්ගේ අදහස්

(සමීක්ෂක සටහන: මට ප්‍රශ්න අසන්නට ඉඩක් ලැබුනේ නැහැ, මා එහි පැමිණියේ කවර අරමුණකටද යනවග පහැදිලි කළ වහාම ඔහු ඔහුට කියන්නට ඇති දෑ නොනවත්වාම දිගටම කියාගෙන යන්න පටන් ගත්තා. මට එය දැනුනේ ඉතා ස්වභාවික, හිතේ තද කරන් හිටපු හැඟීම් සහ අත්දැකීම් සමුදායක් පිටට ගලා ඒමක් විදිහට. සමහර වේලාවන් වලදී මම ප්‍රශ්නයක් දෙකක් අහන්න උත්සාහ කළා, ඒවා ඔහුගේ කතන්දරය අතරතුර පෙනෙන්නට තියනවා.* මෙහිදී "පර්වතය" යන වචනය විශේෂයෙන් වෙනත් විදිහකින් සඳහන් නොකළ අවස්ථා වලදී සෑමවිටම අදහස් කරන්නේ දෙවනගල පර්වතයයි).

මේ හැම එකක්ම අලූත් ප්‍රශ්න. 1934 දී බ්‍රිතාන්‍යයන් මේ ප්‍රදේශය හරහා පාරක් හැදුවා. එතකොට වුනත් ප්‍රශ්නයක් ඇතිවුනේ නැහැ. ඔව්, ඇත්ත, රජවරු මෙහි ඉන්න ඇති. ඒත් මේ දැන් විතරක් මොකටද මෙච්චර කලබලයක්? මම කියන්නේ පර්වතය පුරාවිද්‍යාවේ අයට ගන්න කියන්න. ඒ කරලා ඒක ආරක්ෂා කරන්න. ඒත් අපිට අපේ ගෙවල් සහ ඉඩම් වල ඉන්න ඉඩ හරින්න. මේ පොළොව අපටත් අයිතියි. අපි මේකේ බලෙන් පදිංචි වුන අයද? අපි ඉපදුනේ, හැදුනේ වැඩුනේ මේ බිමේ. ඒ වගේම අපිත් මේ බිම පෝෂණය කරලා තියෙනවා, සිංහලයින් කළා වගේම. දැන් මේ අපේ ප්‍රදේශයේ ඉන්න සිංහල අය නෙවෙයි මේ ප්‍රශ්න ඇතිකරන්නේ. අපි මේ ප්‍රදේශ වලින් ඉවත්වුනොත් ඔවුන්ටත් කරදර විඳින්නට සිදුවේවි. අපි ඒ අයත් සමග ජීවත් වුනේ අපේම නෑදෑයින් විදිහට. අද වුනත් ජාතිවාදී " විෂබීජ" ශරීරගත වුනු අඩු කුලේ අය තමා ප්‍රශ්න ඇති කරන්නේ. ඔක්කොම වුනේ BBS සංවිධානය නිසා. ඒ අයට සහයෝගයට ඉන්නවා මේ ප්‍රදේශයේ කණ්ඩායමක්. මම දන්නවා ඒ අය කව්ද කියලා. ඔවුන් අයත්වන්නේ කුල වලින් අඩුම කුලයට. අධ්‍යාපනයක් ලබල නැහැ. ඒ අය තමයි මේ පළාතේ තියන විෂබීජ. හැම වෙලේම අපි දිහා බලන් ඉන්නවා. දැන් වුනත් ඔවුන් දැන ගත්තොත් ඔබ මේ ගැන තොරතුරු ගන්න ඇවිත් ඉන්නේ කියලා ඔවුන් ඇවිත් ඔබට පහර දේවි.

## මේ ප්‍රශ්නය මේ ප්‍රදේශයේ මුස්ලිම් අයගේ ජීවිත සහ ජීවනෝපායන් වලට බලපාල  තියනවද?

නිසැකවම ඔව්. මේ විදිහට මේක ගියොත්, මීටර 400 වූ දුරක රක්ෂිත කලාපයක් ලෙස නම් කළොත්, අපට අපේ භූමිදානයක් වත් කරන්න බැරිව යනවා. දැන් අපේම ඉඩමක වලක් හාරන්න හරි පැලයක් හිටවන්න හරි අපි අවසර ගන්න ඕනේ. මේ පාරේ කඩයක් තියනවා, මුස්ලිම් කෙනෙකුගේ කඩයක්. දවසක් මේ කඩය කඩාගෙන ලොරියක් කඩේ ඇතුලට ගියා. ඒක ඇක්සිඩන්ට් එකක්. ඊට පස්සේ ඒ කඩේ අයිතිකරු කඩේ ඉස්සරහ ලොකු ගලක් ගෙනත් තියාගත්තා ආයේ  එවැනි අනතුරක් වෙන්නේ නැතිවෙන්න. දැන් මේ මිනිස්සු රණ්ඩු වෙනවා මේ ගල පුරාවිද්‍යා වස්තුවක් කියලා. මට ඇත්තෙන්ම හොඳට මතකයි මේ ගල මේ අසල තුබුන එකක්. පුරාවිද්‍යාවත් එක්ක කිසිම සම්බන්ධයක් නැහැ. මේ විදිහට මුළු මාවනැල්ලම පුරාවිද්‍යාව යටතට ගනීවි. ඒ ඇයි කියනවනම් මේ වගේ ගල් මේ පළාතේ සැම තැනකම පොළොව යට තියනවා. ඒවා හරියට මේ ටවුම  පිහිටලා තියෙන අත්තිවාරම වගේ.  මොනවද ඒ අය මේක ගැන කරන්න යන්නේ? මුළු ටවුමම සමතලා කරන්නද?

## නමුත් ඔබ එකඟ වෙනවා දෙවනගල පර්වතය පුරාවිද්‍යා වටිනාකමකින් යුතු එකක් බව?

ඔව්. ඒක තමයි මම මුලින්ම කීවේ. මේ පර්වතය තියාගන්න. ඒක සංරක්ෂණය කරන්න. ආරක්ෂා කරන්න. නමුත් ඒ අවට ඉන්න මිනිස්සු නිදහස් කරන්න. මේ බිම ඒ අයට නිදහස් කරන්න. සිංහල අයට හෝ, මුස්ලිම් අයට හෝ, ඔවුන් ජීවත්වන ඉඩම් වලට නියමාකාර ඔප්පුවක් ඇති ඕනෑම කෙනෙකුට.

මුල් කාලයේදී මේ පන්සලේ හාමුදුරුවන් ඉතා හොඳ ශක්තිමත් සම්බන්ධයක් තිබුනා මුස්ලිම් අයත් එක්ක; ඔවුන් අපේ ගෙවල්වලට ආව, තේ බිව්වා, අපේ තාත්තල එක්ක ගෙන ගියා පර්වතය මුදුනට. මේ අලූත් "සේනා" එක තමයි ජාතිවාදී ප්‍රශ්න ඇතිකරලා තියෙන්නේ. ඔයා දන්නවද, මේ පන්සලේ හාමුදුරුවරු පන්සලේ යතුර තියල ගියේ මුස්ලිම් කඩයක මුදලාලි කෙනෙක් ගාව. දැන් ඒ කිසිදෙයක්  නැහැ. මේ ප්‍රශ්නය තියෙන්නේ අඩු කුලයේ අයට තමයි. උසස් කුලවල අයට මුස්ලිම් අය සමඟ කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ අයට ඒ අයගේ ඉඩම්වල තිබිල රත්තරන් හම්බවෙලා තියනවා. දන්නවද, ඒ අයගේ සීයලා වැඩකරලා තියෙන්නේ රජවරුන්ට. මේ ප්‍රශ්න ඔක්කොම මුස්ලිම් අය එළවගන්න. මේක මෙහෙ විතරක් නෙවෙයි ලෝකෙ පුරාවටම තියෙන ප්‍රශ්නයක්.

මේ ප්‍රශ්නය වරින් වර මතුවෙමින් තිබුනා. කවුරුහරි කෙනෙක් කොහේ හරි මේ පර්වතය ගැන කරදර වෙනකොට ඒක මතුපිටට එනවා. ඒත් එතකොට "සේනා" එක තිබුනේ නැහැ. ඒවගේම කිසි මිනිස්සු කොටසක් ගැන මේ තරම් නරක හැඟීම් තිබුනේ නැහැ. මේ තරම් ආවේගශීලි වාතාවරණයක් අපිට දැනිල තිබුනේ නැහැ. මේක ජාතිවාදී ප්‍රශ්නයක් වෙන්න ඕනෙද? නැහැ නේද? මුස්ලිම් අය ජීවත් වෙන්නේ අක්කර 18 ක් තරම් ප්‍රදේශයක. ඒක දැන් ඊටත් අඩුයි. පර්වතය කිට්ටුව ඉන්න අය පස සෝදාගෙන යාමත් එක්ක පර්වතය පෑදෙන්න පටන් ගත්ත නිසා මේ පර්වතය අයිනේ ඒගොල්ලන්ගේ ඉඩම් වල කොටස් අත්හැරලා දැම්මා. ඉතින් දැන් සමහර විට හෙක්ටයාර 7ක් විතර මුස්ලිම් අයට අයිති ඇති. අනිත් ඔක්කොම ඉඩම් වල ඉන්නේ සිංහල අය. හැබැයි මෙහෙමයි, අපේ අය ගොඩක් හොඳට ඒ ගොල්ලන්ගේ ගෙවල් හදල තියෙනවා. ඒක තමයි මේ. අඩු කුලයේ අයව නොමග යවල ඒ අයගේ ඔළුවලට දාල තියෙනවා අපේ ගෙවල් ඒගොල්ලන්ට දෙනව කියලා. ඒකයි ඒගොල්ලන් අපට විරුද්ධව වැඩකරන්නේ. අපි අපේ ගෙදර මායිමේ වලක් කැපුවත් ඒක ප්‍රශ්නයක්. නමුත් ඒ අය ගස් පිටින් කපල විකුණනවා කිසි කෙනෙක් එන්නේ නැහැ. ඒ ඇයි? මේ රක්ෂිත කලාපය ඇති කළොත්, ඒකට සිංහල ගෙවලුත් අයිති වෙනවා. ඒත් ඒගොල්ලන්ටත් යන්න කියයිද? අපි මේක අත්හැර දමන්නට පුළුවන් තත්වයක නෙවෙයි ඉන්නේ. අනෙක අපිට ඔප්පු සහ ලියකියවිලි තියෙනවා. මතකද මාවනැල්ල ගිනිගත්තා, නිකම් සිගරැට් එකක් නිසා?ඒකද ඒ ගොල්ලන්ට ඕනේ කරන්නේ?

එක දවසක් මුස්ලිම් මනුස්සයෙක් හරකෙක් දක්කාගෙන ගියා. ඒ හරකා ඇත්තෙන්ම සිංහල කෙනෙකුගේ. හාමුදුරුනමක් මේ මනුස්සයාව අල්ලාගෙන හරකාගේ කලින් අයිතිකරුවාගෙන් මුදල් ආපසු අරගෙන ඒ මුදල් අර මුස්ලිම් මනුස්සයා හරකා ගෙන එමින් සිටි සිංහල කෙනාට දීලා. මිනිස්සු කියන්නේ ඊට පස්සේ හාමුදුරුවන් ඒ හරකාව අරන්ගියා කියලා. මුස්ලිම් මනුස්සයා කළේ හරකා මුදලට ගත්ත සිංහල මනුස්සයාට හරකා බාරදෙන්න ගෙනගිය එක විතරයි.

අපිට මේ වගේ කොතරම් නම් ප්‍රශ්නද? අපි අපේ එදිනෙදා වැඩ කරගෙන යනකොට කවුරුන් කොහෙන් හෝ 119 කෝල් එකක් දෙනවා. ප්‍රදේශයේ මස් කඩය පවා දැන් වහල දාල. මම ඔබට කියන්නේ මේ ඔක්කොම පිටින් එන කරදරකාරයින්ගේ වැඩ. අදටත් අපි අප දන්නා සිංහල අය සමග ඉතා සමීපයි. අතලොස්සක් පමණයි ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන් අපට එරෙහිව ක්‍රියා කරන්නේ.

### පොලීසියෙන් හෝ වෙනත් යම් රජයේ ආයතනයකින් මැදිහත්වීමක් කළාද?

පොලීසිය හැමවෙලේම මැදිහත් වෙනවා. ඔවුන් මේ ස්ථානය වටේටම මුරකලා. අපේ මුස්ලිම් ගෙවල් වලින් තමයි ඔවුන්ට කෑම දුන්නේ. නමුත් ඔවුන්ගේත් ඉන්නවා නීතියට ක්‍රියාකරන හොඳ අය මෙන්ම, පක්ෂපාතිව ක්‍රියා කරන අයත්. ග්‍රාමසේවක පවා ප්‍රශ්නයක්. කට කතාවක් තියනවා ඔහුගේ ලිපියක් තමයි මේ සේරටම මුල කියලා. බලන්න, මේ අඩවිය පුරාවිද්‍යා අඩවියක් විදිහට ගැසට් කරන්නේ 1970 කාලයේ. එත් දැන් තමයි මේ ජාතිවාදී ආතතියක් මේ ප්‍රශ්නයට ඇදිලා තියෙන්නේ. ඒ කාලේ අපේ හජ්ජියාර් කෙනෙක් රු 300,000 විතර වියදම් කරලා පන්සලක් හදල තියනවා. ඒ පන්සලට කියන්නේ කැකිරිගොඩ පන්සල කියලා. අපි ජීවත්වුණේ කෑවේ බිව්වේ එකට, එත් ඒ අයගෙන්ම සමහරෙක් අපිව පාවාදුන්නා. දැන් අපි සේරම දුක් විඳිනවා.

### මේ ප්‍රශ්නය විසඳීමට ඔබ කිසියම් විසඳුමක් යෝජනා කරනවානම්?

මට කියන්න තියෙන්නේ මෙච්චරයි. පර්වතය තියාගන්න. අපිට ඒක ඕනේ නැහැ. අපිට අයත් බිමයි, අපි අපේම දහඩිය මහන්සියෙන් හදාගත්ත ගෙවලුයි නිදහස් කරන්න. අපිටත් ඕනෙනම් මේ ආපු අයත් එක්ක ගහගන්න තිබුනා. එත් මොකටද? ඇයි අපි තවත් ලේ හලන්නේ? සිංහල මිනිසුන් අපිට ප්‍රශ්නයක් නෙවෙයි. අපිට ප්‍රශ්නය වෙනත් ලොකු ප්ලෑන් තියන අය. ආණ්ඩුව වෙනස්වුනාට පස්සේ සන්සුන් බවක් තිබුනත් මම දන්නවා මේක අවසානය නෙවෙයි කියලා. අපිට හරි විසඳුමක් ඕනේ කාටවත් හිරිහැරයක් වෙන්නේ නැති.

## පිළිතුරු දෙන්නා 3: දෙවනගල සම්බන්ධයෙන් මාවනැල්ලේ පදිංචි 23 හැවිරිදි මුස්ලිම් විශ්වවිද්‍යාල ශිෂ්‍යයකුගේ අදහස්

### දෙවනගල ප්‍රශ්නය ගැන ඔබ බලන තැන සිට ඔබට පෙනෙන විදිහ කරුණාකරලා අපත් සමඟ කියන්න පුළුවන්ද?

මම මේක දකින්නේ විවිධ ප්‍රජා ස්ථරයන්ගේ, එනම් නීතිඥයින්, සිවිල් සංවිධාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ප්‍රජාවන් දෙකේම විද්වතුන් සහ දේශපාලඥයින් ගේ මැදිහත් වීමෙන් බුද්ධිමත්ව විසඳාගතයුතු ප්‍රශ්නයක් විදිහට. මේ ප්‍රශ්නය උපායශීලීව හැසිරවීම නිසා ප්‍රශ්නය මහා කලබලයක් කරා පුපුරා ගියේ නැහැ. හැඟීම් අනුව ක්‍රියා කරන්න ගියා නම් අද තත්වය මීට වඩා හුගක් වෙනස් එකක් වෙන්න තිබුනා.

කෙසේ වුනත් මේක යටි අරමුණු සහිතව ප්‍රමාණයට වඩා පුළුල් කරපු ප්‍රශ්නයක්. කලින් රජයෙන් ගැසට් කරපු පුරාවිද්‍යා අඩවි වලින් දෙවනගලට ලැබෙන්නේ 12 වන තැන. ඉතින් දෙවනගලට ප්‍රථමයෙන් ඒ තැන්වලට අවධානය යොමුවෙන්න ඕන. උදාහරණයක් හැටියට අලුත්නුවර දේවාලය. මේ පර්වතය අවට ඉන්න ජනතාවගෙන් 20% පමණයි මුස්ලිම්. නමුත් සමහර පාර්ශවයන් විසින් මේ පර්වතය අසල වෙසෙන සිංහල සමාජයේ පහළම ස්ථර වලට අයත් යයි සැලකෙන අයව සම්පූර්ණයෙන් නොමග යවල තියනවා. ඒ අයට අපි ඉන්න ගෙවල් අරන්දෙන්න පොරොන්දු වෙනවා කියලා. එහෙම තමයි ඒ අයට මේ කොටස් ජාතිවාදීව මෙහෙයවන්න පුළුවන් වෙලා තියෙන්නේ.

## කොහොමද මේ ප්‍රශ්නය මුස්ලිම් ප්‍රජාවේ දෛනික කටයුතු වලට බලපාල තියෙන්නේ?

දැන් නම් තත්වය බොහෝ දුරට යථා තත්වයට පත්වෙලා. මුස්ලිම් සහ සිංහල අය අතර තිබූ සම්බන්ධතා වලට තවම බරපතල හානියක් වෙලා නැහැ. අපි ඒ අයත් එක්ක ක්‍රිකට් ගහල තියනවා. දැන් නම් වෙලාවක් නැහැ, ඒ වුනත් අපි තවමත් එකිනෙකා හමුවුනහම නැවතිලා ටිකක් කතාකරනවා, නැත්නම් බයික් එකේ යන ගමන් නම් හොර්න් ඒක ගහගෙන යනවා. වැඩිහිටියන් අතර නම් මේ බැඳීම මීට වඩා ශක්තිමත්. හොඳ සම්බන්ධතා තිබුන අය තවමත් ඒවා ඒ වාගේම පවත්වාගෙන යනවා. පිටින් මේ ප්‍රශ්න එන්න කලින් අපි අතරේ හොඳ ශක්තිමත් බැඳීමක් තිබුනා. ප්‍රජාවන් දෙක එකිනෙකා හොඳින් තේරුම් අරන් ජීවත් වුන අතර, එකිනෙකාට උදව් කළා. අපේ ඔප්පු 1800 ගණන් තරම් පැරණි ඒවා. ඉතින් අපි අද ඊයේ මෙහාට පදිංචියට ආපු අය නෙවෙයි. මේ ජාතිවාදී විෂබීජය ශරීරගතවුනු අය, ඔවුන්ගේ ප්‍රජාවේ නුගත් යයි සැලකෙන අතලොස්සක් තමයි අපිට මේ ප්‍රශ්න ඇති කරන්න උත්සාහ ගන්නේ.

## ඔබ දෙවනගල ඉතිහාසය ගැන දන්නා දේ කරුණාකරලා අපිට සවිස්තරව කියන්න පුළුවන්ද?

හොඳයි. අපි දන්නවා ඒක ශ්‍රී ලංකාවට ඉතා වැදගත් තැනක් කියලා, රජවරුන් රට පාලනය කරන කාලයට සම්බන්ධ. ඒ හැරෙන්නට මම හිතන්නේ නැහැ සිංහල අයවත් මෙහි ඉහිහාසය ගැන ඊට වැඩි යමක් කියන්න දන්නවා ඇති කියලා. සමහර විට ඔවුන් දැන් දන්නවා ඇති නමුත් ඒ අය මේ තරමටම ඒ ගැන කරදරවුනේ නැහැ. මේ ප්‍රශ්නය 2012 දී විතර මතුවෙනකන්ම, ප්‍රධාන වශයෙන් BBS සංවිධානයේ මැදිහත්වීමත් සමග රජය මෙය ගැසට් කළ කාලයේදී පවා එතරම් දැනුවත් බවක් තිබුනේ නැහැ. මට නිශ්චිත

කතාන්දරයක් නම් මතක නැහැ නමුත් මෙතැන පරාක්‍රමබාහු රජතුමා සහ පිටරටකින් පැමිණි සතුරු ආක්‍රමණයකින් බේරීමට ඔහු මෙහි සැඟව සිටීමත් එක්ක සම්බන්ධයක් තියෙන බව දන්නවා.

### ඔබ BBS සංවිධානයේ මැදිහත්වීම ගැන කිව්වා. ඔබට ඒ ගැන වැඩිපුර යමක් කියන්න පුළුවන්ද?

තවත් මොනවාද ඒ ගැන කියන්න තියෙන්නේ. ඇත්තෙන්ම ඒ අය තමයි ප්‍රශ්නය. BBS සහ ඒ වගේ අනිත් කණ්ඩායම්. ඔවුන් මේ ප්‍රශ්නය ප්‍රමාණයට වඩා විශාල කරලා ඒකෙන් ජාතිවාදී ආතතියක් නිර්මාණය කළා. 2004 ඉඳන් 2012 වෙනකල් කිසිම ප්‍රශ්නයක්, කිසිම සද්දයක් තිබුනේ නැහැ. එකපාරටම මේ අය ඇවිත් මේ ඔක්කොම ප්‍රශ්න ඇතිකරා.

### මේ සම්පූර්ණ සංසිද්ධියේදී පොලීසියේ ක්‍රියාකලාපය ගැන ඔබේ අදහස මොකක්ද?

ඔවුන් ආරක්ෂාව සැපයුවා. ඒ තැතිගැන්මෙන් පිරුණ කාලයේදී, ඒ අය අපත් සමඟ සහයෝග යෙන් ක්‍රියාකළා. අපේ පල්ලිවල දැනුවත් කිරීමේ සාකච්ජා පවත්වල මෙවැනි අවස්ථාවට මුහුණ දියයුතු ආකාරය ගැන ඔවුන් අපිව දැනුවත් කළා. එනමුත් ඔවුන්ට ඔවුන්ගේ හෘද සාක්ෂියට අනුව ක්‍රියාකරන්න නිදහසක් නැහැ. දන්නවද, ඔවුන්ට හැමවිටකම දේශපාලන පීඩනය තිබුණා. BBS සංවිධානය බොහෝදුරට ආණ්ඩුව බවට පත්වෙලා තිබුනේ. මේ නිසා පොලීසිය මධ්‍යස්ථ පාර්ශවයක් බව පෙනෙන්නට තිබුනත් ඉහළින් එන පීඩනය නිසා ඔවුන්ට සිදුවුණා නොයෙක්විට මුස්ලිම් ජාතිකයින් අත්අඩංගුවට ගෙන පසුව නිදහස් කරන්න. ප්‍රධාන වශයෙන් පර්වතයට සමීපයෙන්ම ජීවත් වෙන මිනිසුන් තමයි විටින් විට ඉතා සුළු හේතුන් මත මේ අතවරයට ලක්වුණේ. නමුත් මම මේ ගැන බලන්නේ ශුභවාදීව ඒ නිසා මට කියන්න පුළුවන් ඔවුන් අපට සහයෝගීව කටයුතු කළා කියලා.

### මේ ප්‍රශ්නයේදී  වෙනත් මැදිහත්කරුවන් ලෙස ක්‍රියා කළේ කවුද?

සිවිල් සංවිධාන සහ සිංහල මුස්ලිම් ප්‍රජාවන් දෙකේම අයගෙන් සමන්විත මාවනැල්ල මිත්‍රත්ව සංවිධානය. ප්‍රජාවන් දෙකෙහිම විද්වතුන් මෙහිදී කළ කාර්යභාරය ඉතා තීරණාත්මක වුනා. රක්ෂිත කලාපය ඇතුළත වූ පල්ලි දෙකෙහි භාරකාර මණ්ඩලවල අය. ඒ අයත් මැදිහත් වුනා. තවදුරටත්, උයන්වත්ත ප්‍රදේශයේ ජනතාව ස්වේච්ජාවෙන් මෙයට මැදිහත් වුනා. AGA ඔෆිස් එකේ එක් කාන්තාවක් ඉතා මධ්‍යස්ථව සාධාරණව කටයුතු කළා.

## ඔබ සඳහන් කළ පල්ලිවල භාරකාර මණ්ඩලවලට අමතරව, උලමා හෙවත් මව්ලවීවරුන් මෙහිදීදැරූ ස්ථාවරය ගැන ඔබට කියන්නට ඇත්තේ කුමක්ද?

ඔවුන් අප මුහුණ දී ඇති මේ තත්වය සහ මේ අවස්ථාවේ ඉවසීමෙන් කටයුතු කිරීමේ වැදගත්කමේ පණිවිඩය අපට දුන්නා. ඔවුන් සිදුවීම් වෙන ස්ථානයේදී ප්‍රශ්නවලට මුහුණ දීමට සහ අනතුරු වලක්වා ගැනීමට නායකත්වය නොදුන්නත්, සාමයෙන් සිටීමේ වැදගත්කම සහ මේ අවස්ථාවලදී දී හොඳින් හැසිරීම පිළිබඳව පණිවුඩය මුස්ලිම් ප්‍රජාවේ සෑම ස්ථරයන් කරාම අරගෙන ගියා. සෑම දේශනාවක්ම (කුත්බාවන්) මේ ප්‍රශ්නය කෙරෙහි අවධානය යොමුකර තිබුණා. ඔවුන් අපට ගොඩක් අවවාද කළා.  මේ නිසා තමයි මුස්ලිම් තරුණ කොටස් කලහකාරී නොවී පාලනය කරගන්නට පුළුවන් වුනේ. අපේ තරුණ පිරිස් ආවේගශීලි වුනානම් මේ තත්වය ප්‍රචණ්ඩකාරී වන්නට තිබුණා.

## දෙවනගල පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථානයක් වශයෙන් සැලකීමේදී ඔබගේ ස්ථාවරය කුමක්ද? ඔබ සිතන පරිදි මේ කාරණාව සම්බන්ධයෙන් මුස්ලිම් අයගේ හැඟීම කුමක්ද?

එය ඓතිහාසික තැනක් බව අප දැනගෙන හිටියා, අපේ නෑදැයින් පැමිණි හැම විටම ඒ අයත් සමග එහෙ යනවා පර්වතය මුදුනේ ඉඳන් අවට දර්ශන බලන්න. ඒ කාලේ පන්සලේ හිටිය හාමුදුරුවරු පවා අපිත් එක්ක හිතවත්. අපි ඔවුන් සමග ඉතා සුහදශීලී සම්බන්ධතාවයක් පැවත්වුවා. දැන් පවා අපිත් එක්ක ඉතාම හිතවත් සිංහල අය ඉන්නවා. පර්වතය මුදුනට ගිය හැමවෙලේම, අපි පන්සල ඉදිරියේ අපේ පාවහන් ගලවලා අනවශ්‍ය ලෙස ශබ්ද නොකරන්න වග බලාගන්නවා. අපි කිසිදු අකටයුතු දෙයක් පර්වතයේ දී කරලා නැහැ. නමුත් එකක් නම් ඇත්ත. අපිත් අනිත් අය වගේ ගලේ අපේ නම් ලිව්වා. ඔබ දන්නවනේ මේක ලංකාවේ හැම තැනකම වෙන දෙයක්. කෙසේ වෙතත්, ඒ දේ සිදුවුනේ මෙය පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙස නම් කරන්න ගොඩක් ඉස්සරවෙලා. දැන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට මෙය ආරක්ෂා කරන්න ඕනා නම් එය අපි පිළිගන්නවා. ප්‍රශ්නය වෙලා තියෙන්නේ මේ රක්ෂිත කලාපය. රක්ෂිත කලාපය මීටර 400ක් ලෙස ප්‍රකාශයට පත්කළොත් මුස්ලිම් නිවෙස් පමණක් නෙවෙයි සිංහල නිවෙසුත් එයට අයත් වෙනවා.

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතනවල භූමිකාව ගැන ඔබ මොනවද හිතන්නේ?

මට ඒ ක්‍රියාදාමයන් ගැන ප්‍රකාශයක් කරන්න තරම් ඒවා ගැන අවබෝධයක් නැහැ. නමුත් දැන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඉතා සුළු සිද්ධීන් වලට පවා මැදිහත් වෙනවා.

**දෙවනගල මේ ප්‍රශ්නය විසඳීම සඳහා ඔබට යම්කිසි විසඳුමක් දෙන්න පුළුවන්ද?**

ප්‍රජාවන් දෙකම මේ ප්‍රශ්නය ගැන හොඳ අවබෝධයක් ඇතිකරගන්න උවමනාය; ඒ වගේම ප්‍රජාවන් දෙක එකිනෙකා ගැනත් හොඳ අවබෝධයක් ඇතිකර ගැනීමත් වැදගත්. නිවැරදි අන්‍යෝන්‍ය අවබෝධයක් තුළින් විතරයි වැරදි හැඟීම් ඉවත් කරගත හැකි වන්නේ. වර්තමානයේ අපි ගතකරන්නේ හුදකලාවුන ජීවිත. අපි හැමෝම ස්වයංපෝෂිත වෙන්න වෙන්න, ස්වාධින වෙන්න වෙන්න අපි අතරේ අන්තර් සබඳතා අඩුවෙනවා. අපිට යම් යාන්ත්‍රණයක් ඇතිකරගන්නට සිදුවෙනවා මේ අන්තර් සබඳතාවන් දියුණු කරගන්නට.

## පිළිතුරු දෙන්නා 4: කටුගහවත්ත මුස්ලිම් ත්‍රිරෝද රථකරුවෙකු සමඟ කළ සාකච්ඡාව

**දෙවනගල ප්‍රශ්නය දැන් කොහොමද?**

හ්ම්ම්...දැන් නම් ප්‍රශ්නය හරි වගේ, ආණ්ඩුව මාරුවුනාට පස්සේ ප්‍රශ්න සන්සුන් වෙලා, දන්නවද, මේ ඔක්කොම බොරු. මේ පළාතට ආපු පිටස්තර පිරිසක් මෙහෙ නිකම් ප්‍රශ්න ඇති කළා.

**ඔබ පිටස්තරයින් යනුවෙන් අදහස් කරන්නේ කවුද?**

ඇයි, ඇත්තෙන්ම බොදු බල සේනාව තමයි. ඒ අය තමයි මේක ප්‍රශ්නයක් කළේ. ඒ අය පිටතින් කට්ටිය ගෙනල්ල මෙහෙ බොරු පැතිරුවා. ඒ අයට කියන්නට බැහැ මේ ඉඩම් පුරාවිද්‍යා එකට අයිතියි කියලා. අපි මෙහෙ අවුරුදු ගණනක් පදිංචි අය. එකට සාක්ෂි තියෙනවා, නිත්‍යානුකූල සාක්ෂි ඔප්පු සහ අනෙකුත් දේවල්. අපි කොහෙවත් ඉඳල අනවසරයෙන් මෙහෙට ආපු අය නොවෙයි. මේවා අපේ පාරම්පරික ඉඩම්.

**මට අසන්නට ලැබුනා මෙහි නිවාස සෑදීම පිළිබඳ ප්‍රශ්නයක් තියනවා කියලා. දැන් ඒ පිළිබඳව තත්වය කොහොමද?**

ඔව්. අමාරු තත්වයන් තිබුනා තමයි. මේ ඔක්කොම පටන් ගත්තේ 2004දි පනත සම්මතවීමත් එක්ක. ඒ වුනත් BBS සංවිධානය ඇවිත් ප්‍රශ්න ඇතිකරන්න පටන්ගන්නකන් මෙහෙ කිසි ප්‍රශ්නයක් තිබුනේ නැහැ. කවුරුවත් මේ පනතක් ගැන දැනගෙන හිටියෙවත් නැහැ. ඊට

පස්සේ තමයි ප්‍රශ්න ඇතිවුනේ. පර්වතය කිට්ටුව ගෙවල් සෑදීම මිනිස්සු නතර කරා. ඒත් දැන් සමහර අය අලූත්වැඩියා කටයුතු කරන්නත්, හදන්නත් පටන් අරන්. ඒක කොහොම වුනත්, මේ තැන පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුතු තැනක් නම් ඒක මේ රටේ සෑම පුරවැසියෙකුටම අයිතියි. බෞද්ධයන්ට විතරක් නෙවෙයි. එහෙම නේද? ඒ නිසා මේ රටේ පුරවැසියන් නිසාත්, නිත්‍යානුකූල ලියකියවිලි තියෙන නිසාත්, අපිට සෑම අයිතියක්ම තියෙනවා මෙහෙ පදිංචිව ඉන්න. මේවා අපෙත් ඉඩම්.

## සිංහල සහ මුස්ලිම් අය අතරේ සම්බන්ධතා කොහොමද? ඔබත් එක්ක ගමන් යන්න සිංහල අයත් එනවද?

ඇත්තෙන්ම. දැන් හැමදෙයක්ම සාමාන්‍ය තත්වයට ඇවිත්. අපි ඉතා හොඳට ආශ්‍රය කළා. දැනුත් එහෙමයි. මේ නිකම් පිටින් ආපු අය තමයි ප්‍රශ්න ඇතිකරන්න උත්සාහ කළේ.

## පිළිතුරුදෙන්නා 5: කටුගහවත්තේ වාසය කරන පිරිමි මුස්ලිම් අයෙකුගේ අදහස්

## දෙවනගල ප්‍රශ්නය ප්‍රදේශයේ ජීවත්වන මුස්ලිම් ජාතිකයින්ට බලපෑවේ කොහොමද කියලා කියන්න පුළුවන්ද?

මේවා අපේ ඉඩම්. අපේ පාරම්පරික ඉඩම්. අපිට ඔප්පු තියෙනවා. අපිට සාක්ෂි තියෙනවා අපි මේ ප්‍රදේශයේ අවුරුදු දෙසිය ගණනකට පෙර ඉඳන් ජීවත් වුනා කියලා. මාවනැල්ලේ AGA තුමියත් ඒක පිළිගන්නවා. ඇය වරක් කිව්වා "ගලට අයිති ගල විතරයි" කියලා. පිටස්තර පුද්ගලයින්, ඒ කියන්නේ BBS සංවිධානය, වගේ අය තමයි මේ පටලැවිල්ල ඇති කරේ. ඒ අය කියනවා දැන් මේවා අයිති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවටලූ. පර්වතය අවට ඉඩම් වලින් ඔවුන්ට කිසිවක් අයිති නැහැ. සාක්ෂි වලට අනුව (රජතුමා) ත්‍යාගයක් වශයෙන් දීපු කොටස තියෙන්නේ වෙනත් තැනක. ඒ කියන්නේ රුවන්දෙනියේ ඇති හෙක්ටයාර 28.5ක ප්‍රමාණයක්. මේ ඔක්කොම ජාතිවාදය ඇතිකරන්න කරපු දේවල්. ඒවායේ කිසි ඇත්තක් නැහැ.

මේ තත්වය අපිට ඇති කරපු බලපෑම ගැන කියනවනම් අපි ඒ කාලේ හිටියේ බයෙන් කනස්සල්ලෙන්. අපිට ප්‍රශ්නයක් නැහැ ඒ අය පර්වතය ගත්තට. ඒකෙ අපිට ඇති අයිතියකුත් නැහැ. ඔක්කොම දේශපාලඥයන් දන්නවා මේක බොරු වැඩසටහනක් කියලා. ඔය කියන මීටර 400ක රක්ෂිත කලාපය මේ පර්වතයත් සමඟ කොහෙත්ම සම්බන්ධ නැහැ. අපිට අහන්න ලැබුනා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයා

පවා කියලා තියෙනවා යෝජනා කරලා තියෙන රක්ෂිත ප්‍රදේශයේ පර්වතයට අයත් කිසි දෙයක් නැහැ කියලා. ප්‍රශ්නය අපිට දැන් අලූතින් ඉදිකිරීමක් කරන්නවත්, අපේම ඉඩමේ තියෙන කපන්න අවශ්‍ය ගහක් කපන්නවත් විදිහක් නැහැ. මිනිස්සු පුංචි අලූත්වැඩියා කිරීම් කරලා තියෙනවා. නමුත් කවුරුත් අලූතින් ගෙවල් හදලා නැහැ.

## පාරවල් වලට යන්න එහෙම අපහසුකම් මොකවත් තියනවද?

නැහැ. එහෙම කිසිදෙයක් නැහැ.

## මුස්ලිම් අයගේ පැත්තෙන් දෙවනගල ඉතිහාසය කොයි වගේ එකක්ද?

මම දන්නා තරමටනම් අපි මේ පර්වතයට කිසිම විශේෂ ඓතිහාසික සම්බන්ධයක් නම් නැහැ. නමුත් අපි දන්නවා මෙතන බෞද්ධයින්ට වැදගත් තැනක් විත්තිය. නමුත් ඔබ දන්නවද අපි මේ පර්වතය කීප වෙලාවකදීම ආරක්ෂා කරලා තියෙනවා. ඒ කාලේ මුස්ලිම් අයට එතරම් පුළුවන් කමක් තිබුනේ නැහැ ඒවගේ දේවල් වලදී. නිධන් හොරු ආපු කිහිප වෙලාවකදීම අපි තමයි බොහෝ විට ඒ අයව එලෙව්වේ. පර්වතයේ තියෙන සෙල්ලිපියෙන් කියලා තියෙනවා  කාටද දුන්නේ සහ අනෙකුත් ඔක්කොම විස්තර. අපි එතරම් ඓතිහාසික කරුණු දන්නේ නැහැ ඒකාලේ මේවගේ ප්‍රශ්න නොතිබුණු නිසා.

## මේ ප්‍රශ්නයේදී BBS සංවිධානයේ මැදිහත්වීම කොයි  වගේද?

අපිට කිසි ප්‍රශ්නයක් තිබුනේ නැහැ. ඒ අය තමයි මේ පටලැවිලි ඇති කළේ. සේනා එකේ ගජ මිතුරෝ මේ ගම ඇතුළෙත් ඉන්නවා. එක හාමුදුරුනමකුත් ඉන්නවා. මට නම කියන්න ඕනේ නැහැ. ඒ අය කියනවා අපිට මේ ඉඩම් වලට නිත්‍යානුකූල අයිතියක් නැහැලූ. ඒක බොරුවක්. අපි මේ ඉඩම් බැංකු වල උගස් තියල ණය අරන් තියෙනවා, අපිට සහනාධාර ලැබිල තියනවා රබර් වගා කරන්න හෝ නැවත වගා කරන්න; ඒවා කොහොමද කරන්නේ අපිට නිත්‍යානුකූල අයිතියක් නැත්නම්?

ඔවුන් උත්සාහ කළේ මුස්ලිම් සහ සිංහල අය අතර ප්‍රශ්න ඇති කරන්න. මේක පහුගිය අවුරුදු කීපය තුළ ක්‍රියාත්මක වුනු ජාතිවාදී වැඩපිළිවෙළේම කොටසක්. අපේ ගම්වල ඉන්න සිංහල අය පවා කියන්නේ මේවා ජාතිවාදී ප්‍රශ්න ඇති කරන්න කරන දේවල් කියලා. ඒවගේම සමහර සිංහල අයත් කියනවා මේ ඉඩම් පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවට අයිති නැහැ කියලා.

## මේ ප්‍රශ්නයේදී පොලීසියේ මැදිහත්වීම ගැන කිව්වොත්?

පොලීසිය සාධාරණව කටයුතු කළා. ඔවුන් මේ කාරණය හොඳින් දැනගෙන හිටියා. කිසි කෙනෙක්ගේ පැත්තක් ගත්තේ නැහැ. අපි බොරු කියන්න ඕනේ නැහැ. BBS රැස්වීම සිදුවෙන වෙලාවේ ඒ අය ආවේ අපේ ආරක්ෂාවට නෙවෙයි වුනත් ඒ ගොල්ලන් පක්ෂපාතිව ක්‍රියාකළේ නැහැ. ඒගොල්ලන් මෙහෙට ආවේ ඒ අයත් එක්ක ආපු අයව ආරක්ෂා කරන්න. මොනවා වුනත් ඒ අය රජයේ. අපි දන්නවනේ කලින් හිටපු ආරක්ෂක ඇමතිතුමා කොයි වගේ ද වැඩ කළේ කියලා,නේද?

## මේ ප්‍රශ්නය ගැන කතාකරන්න ඉදිරිපත්වුනු අනෙක් මැදිහත් කරුවන් කවුද?

ප්‍රධාන වශයෙන් මාවනැල්ල පොලීසියයි, මාවනැල්ල මිත්‍රත්ව සංවිධානයයි. මාවනැල්ල මිත්‍රත්ව සංවිධානයේ (MFA) අය BBS සංවිධානය එන විට කෙළින්ම මේ ප්‍රශ්නයට මැදිහත් නොවුනත්, පසුව ඔවුන් ආවා. MFA එකේ සභාපති, දොස්තර ගමගේ මහතා ප්‍රධාන කාර්යයක් ඉටු කළා. ඒ අය BBS සංවිධානයට කෙළින්ම අභියෝග කරන එක ඒ තරම් බුද්ධිමත් වුනේ නැහැ, මොකද ඒ අයත් පිටින් ආව නිසා.

## දෙවනගල ප්‍රශ්නය සම්බන්ධයෙන් මවුලවිවරුන්ගේ ස්ථාවරය කුමක්ද?

ප්‍රශ්නය ඇතිවූ කාලයේ මව්ලවිවරුන් පුද්ගලිකව එතරම් මැදිහත්වීමක් කළේ නැහැ; ඇත්තෙන්ම ඔවුන් ප්‍රශ්නය තියෙන ස්ථානයට ආවේ නැහැ. අපි බය වුනා මව්ලවිලව ගෙනාවොත් අනිත් පාර්ශවය මේක වැරදි විදිහට තේරුම් ගනීවි කියලා. ඒ අය පල්ලිය තුළ ඒ අයගේ වැඩ කොටස කරගෙන ගියා. පොලීසියත් එක්ක එකතුවෙලා මුස්ලිම් ප්‍රජාවට සන්සුන්ව ඉවසීමෙන් සිටින මෙන් අවවාද කළා. තත්වය ගැන මුස්ලිම් ප්‍රජාව දැනුවත් කළා.

මේක ඇත්තෙන්ම බලනකොට සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන් දෙක අතර බෙදීමක් ඇති කරන්න ගත් උත්සාහයක්. අපේ අසල්වාසි හොඳ සිංහල අයත් දන්නවා මේක ඇතුළාන්තයේ තියෙන දේශපාලනය මොකක්ද කියලා. නමුත් ඒක ඒගොල්ලන් පෙන්වන්නේ නැහැ. අපි පුළුවන් තරම් උත්සාහ ගන්නවා අපේමිතුරන් සමග ඉතා හොඳ සම්බන්ධතාවයක් පවත්වන්න. මේක තමයි පල්ලියේ "මශූරාවේ", ඒ කියන්නේ සාමූහික තීරණ ගැනීමේදී ඉදිරිපත් කළ දෙයඃ ඉවසීම සහ පෙර සේම හොඳ සම්බන්ධකම් පැවැත්වීම.

## දෙවනගල පුරාවිද්‍යා අඩවියක් ලෙස ප්‍රකාශකිරීම ගැන මුස්ලිම් අයගේ හැඟීම් මොන වගේද?

ඇත්තෙන්ම මේ පර්වතය අයිති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සහ පන්සලට. අපිට ඒ පිළිබඳව කිසි ගැටලුවක් නැහැ. අපේ ප්‍රශ්නය අපේ ඉඩම්. නිත්‍යානුකූල ඔප්පු අපේ ගාව තියෙන, ඒවා අපිට අයිති බවට අවුරුදු ගණන් පරණ සාක්ෂි තියෙන අපේ ඉඩම්. ඒ අයගේ අරමුණ අපේ ඉඩම් පැහැරගෙන අපිව මෙහෙන් එළවලා දමන්න. මුස්ලිම් පවුල් සියයක් එකසිය පනහක් විතර කොහේ යන්නද? ඒ අය බොරු ප්‍රචාරය කරනවා මුස්ලිම් අය සහ පර්වතය ගැන. ඒ අය කියනවා අපි ඒකට හානි කරනවලු, ඒක බොරුවක්. අපි ඒක මේ තාක් කල් ආරක්ෂා කළා හොරුන්ගෙනුයි මංකොල්ලකාරයින්ගෙනුයි.

ඔව්, ඉස්සර පර්වතය මුදුනට ගිය මුස්ලිම් අය අතන, මෙතන ඒ අයගේ නම් කොටලා ඇති. ඒ වුනාට අපි කිසිම විදිහකින් මේ ස්ථානයට හානියක් කරලා නැහැ. මේ ඉඩම් පුරාවිද්‍යා අඩවියකට අයිති වෙනවානම් ඔවුන් සැලසුමක් ඉදිරිපත් කරන්න ඕනේ. ඒ වුනත් ඒ අය ළඟ කලින් තිබුන සැලසුමක් නැහැ. දැන් ඒ අය නිකම් උත්සාහ කරනවා මොකක් හරි සැලසුමක් හදන්න. අපිට කිසිම ප්‍රශ්නයක් නැහැ මේ පර්වතය පුරාවිද්‍යා අඩවියක් හැටියට ප්‍රකාශයට පත්කරන එක ගැන.

මේ ඇතිවුන තත්වය පාලනය කරගන්න අපිට උදව් වුන ආණ්ඩු පක්ෂයේ වගේම විපක්ෂයේ දේශපාලඥයින් බොහෝදෙනෙක් හිටියා. ඒ අයවත් අපි අගය කරන්න ඕනේ.

# දෙවන ඇමුණුම - සිතියම්




සිතියම 1 - දෙවනගල ප්‍රදේශයේ සිතියම




දෙවන සිතියම - දෙවනගල සමීපයේ ඇති මුස්ලිම් ගම්මාන

**මුස්ලිම් ගම්මාන**

**ගමේ නම**

1. රුවන්දෙනිය
2. ඔයාතුගොඩ
3. උයන්වත්ත
4. මල්වත්ත
5. කටුගහවත්ත
6. දෙවනගල
7. නාගස්තැන්න

## තෙවන ඇමුණුම - ඡායාරූප




බෞද්ධ ගලේබණ්ඩාර දේවාලයේ පිවිසුම



දේවාලයේ ප්‍රධාන කපු මහතා සාම්ප්‍රදායික ඇඳුමින් සැරසී



අසුපිට නැගි ගලේබණ්ඩාර පිළිරුව



කිරි ඉතිරවීමේ මංගල්‍යය



ප්‍රධාන යාතුකර්මයේ කොටසක් ලෙස කිරි ඉතිරවීම



ප්‍රධාන කපුරාලගේ කන්නලව්ව



දේවාලයට එන වැඩි දෙනා කාන්තාවන්



බැතිමතුන් අඩුක්කු ආහාරයට ගැනීම



ඇතුගල රාජ මහා විහාරය



ගලේබණ්ඩාර ඉස්ලාම් දේවස්ථානය අසල ඇති දෙමළ සෙල්ලිපිය



ගලේ බණ්ඩාරගේ මව වෙනුවෙන් ඉදි කළ දේවස්ථානය



මානම්මාගේ සොහොන




කහටපිටිය සුෆී දේවස්ථානය

# References


අමරසිංහ, එෆ්. පි. (1920) ගලේබණ්ඩාර උපත සහ කාලිංග කුමරු පණ්ඩිත පැරකුම්බා නමින් රජවීම. කොළඹ: සමයවර්ධන යන්ත්‍රාලය

Appleby, R. Scott (2000) The Ambivalence of the Sacred: Religion, Violence, and Reconciliation. Lanham, MD: Rowman & Littlefield Publishers.

අතපත්තු, අමරවංශ (සංස්කාරක) 1986, කලූන්දා පටුන සහ කලූන්දා සින්දුව. කොළඹ: හිඩැස ප්‍රකාශකයෝ.

බණ්ඩා, ඇන්. කේ. ඩී. (1921) කලූන්දැවේ උපත. කොළඹ: ශ්‍රී භාරති මුද්‍රණාලය.

Chua, Amy (2004) World on Fire: How Exporting Free Market Democracy Breeds Ethnic Hatred and Global Instability. London: Arrow Books.

ධර්මදාස, කේ, එන්. ඕ. සහ තුන්දෙණිය එච්. එම්. එස්. (1994) සිංහල දේව පුරාණය. කොළඹ: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

Derges, J. (2013) Rituals and Recovery in Post-Conflict Sri Lanka. London.: Routedge.

de Silva, Premakumara (2005) Sri Pada: Diversity and Exclusion in a Sacred Site of Sri Lanka. Edinburgh: University of Edinburgh (Unpublished Ph.D. dissertation).

Dewaraja, Lorna (1994) The Muslims of Sri Lanka. One Thousand Years of Ethnic Harmony, 900–1915. Colombo, Lanka Islamic Foundation.

ඒකනායක, මැණිකේ වසන්තා (1997) ගලේබණ්ඩාර දෙවියෝ.කොළඹ: ගොඩගේ සහෝදරයෝ.

ගමගේ, ආරියසේන යූ. (2014) දෙවනගල සමීක්ෂණ වාර්තාව. මාවනැල්ල: මාවනැල්ල ජනතා මිත්‍රත්ව සංවිධානය.

Gombrich, R. F. and Obeyesekere, G. (1988) Buddhism Transformed: Religious Change in Sri Lanka. Princeton: Princeton University Press.

Goonesekera, Sunil (2007) Walking to Kataragama. Colombo: ICES.

Herath, D. & Rambukwella, H. (2015) Self, Religion, Identity and Politics: Buddhist and Muslim Encounters in Contemporary Sri Lanka. Colombo: ICES.

Holt, John. (1999) “Protestant Buddhism?” Religious Studies Review 17 (4): 307-312.

Holt, John (2016) Introduction in J. Holt eds. Buddhist Extremists and Muslim Minorities: Religious Conflict in Contemporary Sri Lanka. New York: Oxford University Press. Pp. 1-12.

ජයබාහු තෙර දේවරක්ෂිත (1922) නිකාය සංග්‍රය හෙවත් ශාසනාවතරය මුනිදාස කුමාරතුංග සංස්කරණය. කොළඹ කේ.ඩී. පෙරේරා සහ පුත්‍රයෝ

Kailasapathy, K. (1984) “Cultural and Linguistic Consciousness of the Tamil Community” in SSA, Ethnicity and Social Change in Sri Lanka, Colombo. SSA pp. 107–20.

Kapferer, B.  (1991) A Celebration of Demons: Exorcism and the Aesthetics of Healing in Sri Lanka. Washington, D.C.: Smithsonian Institution.

Kapferer, B. (1997) The Feast of the Sorcerer: Practices of Consciousness and Power. Chicago: Chicago University Press.

Klem, Bart (2011) “Islam, Politics and Violence in Eastern Sri Lanka”. The Journal of Asian Studies 70(3): 730-753

කුරුවිට රංගන (සංස්) (2015) කුරුණෑගල විස්තරය. කොළඹ, සූර්ය ප්‍රකාශකයෝ.

Lawrie, A.C. (1896) A Gazetteer of the Central Province. Colombo: Government Printer.

Malalgoda, Kitsiri (1976) Buddhism in Sinhalese Society 1750 ~ 1900: A Study of Religious Revival and Change. Berkeley: CA University of California Press.

McGilvray, Dennis B. (2008) Crucible of Conflict: Tamil and Muslim Society in the East Coast of Sri Lanka. Durham, NC: Duke University Press.

Nissan, E. (1989) “History in the Making: Anuradhapura and the Sinhala Buddhist Nation”. Social Analysis, 25: 64–77.

Obeyesekere, Gananath (1966) “The Buddhist Pantheon in Ceylon and its Extensions”, in M. Nash (ed.), Anthropological Studies in Theravada Buddhism. New Haven: CT Yale University Press.

Obeyesekere, Gananath (1970) Religious Symbolism and Political Change in Ceylon. Modern Ceylon Studies 1: 43-63.

Obeyesekere, Gananath (1975) “Sorcery, Premeditated Murder and Canalization of Aggression in Sri Lanka”.  Ethnology 14 (1): 1-23.

Obeyesekere, Gananath (2006) “Buddhism, Ethnicity and Identity: A Problem in Buddhist History”in Deegalle, Mahinda (ed.): Buddhism, Conflict and Violence in Modern Sri Lanka. London: Routledge, pp. 134-162.

Paranavitana, S. (1933) “Devanagala Rock Inscription of Parakramabahu” 1. Epigraphia Zelanica 3:312-325.

Parker, Henry (1909) Ancient Ceylon: An Account of the Aborigines and Part of Early Civilisation. London: Luzac and Company.

Pfaffenberger, Bryan (1979) “TheKataragama Pilgrimage: Hindu-Buddhist Interaction and its Significance in Sri Lanka's Polyethnic Social System”. The Journal of Asian Studies 38 (2): 253-270.

Pieris, Ralph (I956) Sinhalese Social Organization. Colombo: University of Ceylon Press

රත්නායක ජේ. (සංස්) (1928) ගලේබණ්ඩාර උපත හෙවත් කාලිංග සිරිමල් එතනා. කොළඹ: මාදම්පා මුද්‍රණාලය

Sax, William (2009) God of Justice: Ritual Healing and Social Justice in the Central Himalayas. Oxford: Oxford University Press.

Secretariat for Muslims (2015) "Of Sacred Sites and Profane Politics: Tensions over Religious Sites and Ethnic Relations". Vol I Kuragala/Jailani and Devanagala. Colombo: Secretariat for Muslims.

Seneviratne, H.L. (1978) Rituals of the Kandyan State. Cambridge: Cambridge University Press.

සිල්වා කේ. ටී. (2015) කුලය, පන්තිය සහ ලංකාවේ සමාජ ගැටුම්. බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ.

සිල්වා කේ. ටී. (2018) ගලේ බණ්ඩාර දේවෝත්පත්තිය පිළිබඳ පුරාවෘත්තවලින් හෙළිවන සමාජ අනුපිළිවෙල සහ එහි අභියෝග සමාජ විමසුම 15 වන කළාපය ( මුද්‍රණයට නියමිතයි)

Silva, K. T. (2016) "Gossip, Rumour, and Propaganda in Anti Muslim Campaigns of the Bodu Bala Sena" in J. Holt ed. Buddhist Extremists and Muslim Minorities: Religious Conflict in Contemporary Sri Lanka. New York: Oxford University Press. Pp. 117-140.

Silva, K.T., Deen, N. S., & Gunasekera, A. (2001) The May 2001 Riots in Mawanella: A Sociological Account. Proceedings of the Annual Research Sessions, University of Peradeniya, Sri Lanka.

Spencer, J., Goodhand, J., Hasbullah, S., Klem, B. and Silva, K.T. (2015) Checkpoint, Temple, Church and Mosque: a Collaborative Ethnography of War and Peace. London: Pluto Press.

Tambiah, S.J. (1986) Ethnic Fratricide and Dismantling of Democracy in Sri Lanka. Chicago: Chicago University Press.

Tambiah, S.J. (1996) Leveling Crowds: Ethnonationalist Conflicts and Collective Violence in South Asia. Berkeley, CA: University of California Press.

Walters, Jonathan (1995) "Multireligion on the Bus in Sri Lanka: Beyond 'Influence' and 'Syncretism' in the Study of Religious Meetings". In P. Jeganathan and Q. Ismail (eds), Unmaking the Nation. Colombo: Social Scientists Association, 34-60.

Waxler, Nancy (1984) Behavioural Convergence and Institutional Separation: An Analysis of Plural Medicine in Sri Lanka. Culture, Medicine and Psychiatry 8: 187-205.

Weber, Max (1930) Protestant Ethic and the Spirit of Capitalism. Translated by Talcott Parson. New York: Charles Scribner's Sons.

Wickramasinghe, Nira (2015) Sri Lanka in the Modern Age: History of Contested Identities. Hawaii: University of Hawaii Press.

# ලංකාවේ බෞද්ධ - ඉස්ලාමීය අන්තර් ආගමික සහයෝගිතා සහ ආරවුල්

## තෝරාගත් බහු-ආගමික සහ බහු-සංස්කෘතික මධ්‍යස්ථාන කිහිපයක මෑතකාලීන සිදුවීම් ගැන සිදුකළ ක්ෂේත්‍ර අධ්‍යයනයකි

කාලිංග ටියුඩර් සිල්වා
අෆ්රා නිවාස්
ඩබ්. එම්. කේ. බී. වික්‍රමසිංහ

පශ්චාත් යුධමය ලංකා සමාජයේ, සමාජ ගැටුම් ජනවාර්ගික පදනමක සිට ආගමික පදනමක් කරා පරිවර්තනය වී ඇතැයි අධ්‍යයන කීපයකින් පෙන්වාදී ඇත (උදා: Wickramasinghe 2015: Herath and Rambukwella 2015, Klem 2011). මෙසේ සළකනු ලබන්නේ බොදු බල සේනා සංවිධානය සහ ඇතැම් ඉස්ලාමීය ප්‍රතිසංස්කරණ ව්‍යාපාරවල ඉස්මතුවීම නිසා බව පෙනේ.

මෙම අධ්‍යයනයේදී ශ්‍රී ලංකාවේ මධ්‍යම කලාපයේ පිහිටි බහු සංස්කෘතික සහ බහු ආගමික පසුබිමක් සහිත ස්ථාන තුනක මෑතදී සිදුවූ විපර්යාස සහ ආරවුල් ගැඹුරින් අධ්‍යයනය කරන ලදී. මෙහිදී අපට හෙළි වුයේ නිසැකයෙන්ම සමාජ ගැටුම්, ආගමික ගැටුම් බවට පරිවර්තනය වීමේ ප්‍රවනතාවයක් මෙම ස්ථාන වල නොමැති බවය. අධ්‍යයනයට ලක් වූ බහු ආගමික සහ බහු සංස්කෘතික මධ්‍යස්ථානයන් බෞද්ධයන් සහ ඉස්ලාම් බැතිමතුන් අතර අතීතයේ සිට පැවති සහයෝගය ප්‍රවර්ධනය කිරීම උදෙසා මෙන්ම අලුතින් ගැටුම් උත්පාදනය කිරීම සඳහාද යොදවා ගැනීමේ විභවතාවක් පවතී. මෙම ස්ථාන තුනෙහි අන්තර් ආගමික සමාජ සම්බන්ධතා අතින් ආපසු හැරවිය නොහැකි ඛණ්ඩනයක් සිදුවී ඇති බවට සාක්ෂි නොමැත. අධ්‍යයනයට ලක්වූ ස්ථාන, බාහිරින් ඇතිවූ බලපෑම් මත, ඒ ඒ ආගම් ප්‍රවිත්‍රකරණයට ලක්කිරීමේ ප්‍රවණතා වලට නිසැකයෙන්ම ලක්වී ඇති නමුත්, වර්තමාන අධ්‍යයනයේ සොයාගැනීම් වලින් පෙනී යන්නේ ලංකාවේ සමාජ ගැටුම් වල ව්‍යුහයේ වෙනසක් එමගින් ප්‍රදර්ශනය නොවන බවය.

කාලිංග ටියුඩර් සිල්වා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සම්මාන මහාචාර්යවරයෙක් මෙන්ම ජනවර්ග අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික කේන්ද්‍රය - මහනුවර ශාඛාවේ පර්යේෂණ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂකවරයාද වේ.

අෆ්රා නිවාස් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අරාබි සහ ඉස්ලාම් අධ්‍යයන දෙපාර්තමේන්තුවට අනුබද්ධ පර්යේෂණ සහායිකාවකි.

ඩබ්. එම්. කේ. බී. වික්‍රමසිංහ මහනුවර නාගරික සංවර්ධනය පිළිබඳ ලෝක බැංකු ව්‍යාපෘතියේ වැඩසටහන් භාර නිලධාරීවරයකු වේ.

INTERNATIONAL
CENTRE FOR
ETHNIC STUDIES

USAID
FROM THE AMERICAN PEOPLE

ISBN 978-955-580-209-3

9 789555 802093

Printed by **Horizon Printing (Pvt) Ltd.**